# ළමා මිතුරු ප්‍රවේශය
# පිළිබඳ
# උපදෙස් සංග්‍රහය

ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව - අධ්‍යාපන අමාත්‍යාංශය


දායකත්වය

ඕස්ට්‍රේලියානු රජය

සහයෝගය

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (යුනිසෙෆ්)

# පටුන


| | | |
|---|---|---|
| 1 | හැඳින්වීම | 1-4 |
| 2 | පළමුවන පරිච්ඡේදය<br>අයිතිවාසිකම් පාදක වු සක්‍රීය අන්තර්කරණය | 5-15 |
| 3 | දෙවන පරිච්ඡේදය<br>ස්ත්‍රී පුරුෂ සමාජානුභාවයට ප්‍රතිචාරී වීම | 16-18 |
| 4 | තෙවන පරිච්ඡේදය<br>ළමයින්ගේ ඉගෙනුම් ඵල සංවර්ධනය කිරීම | 19-32 |
| 5 | සිව්වන පරිච්ඡේදය<br>ළමයින් ගේ සෞඛ්‍යය, ආරක්ෂාව හා<br>රැකවරණය තහවුරු කිරීම | 33-44 |
| 6 | පස්වන පරිච්ඡේදය<br>ශිෂ්‍යයින් පවුල් සහ ප්‍රජාවගේ සක්‍රීය දායකත්වය | 45-51 |
| 7 | හයවන පරිච්ඡේදය<br>ළමා මිතුරු පද්ධති, ප්‍රතිපත්ති, පරිචය හා<br>රෙගුලාසි මගින් සහාය ලැබීම | 52-56 |
| 8 | හත්වන පරිච්ඡේදය<br>පාසල් ස්වයං තක්සේරුකරණය | 57-64 |
| 9 | ළමා මිතුරු පාසල් උපදෙස්<br>සංග්‍රහය සංස්කාරක මණ්ඩලය | 65-66 |
| 10 | ඇමුණුම 1- 3 | 67-86 |

**අධ්‍යාපන අමාත්‍යතුමාගෙන්**

## "ගුණාත්මක අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා ළමා මිතුරු පාසල් පද්ධතිය, දරුවන්ගේ මිතුරෙක් කරන්න"

රටක සංවර්ධනයේ පදනම වන ගුණාත්මක අධ්‍යාපනය, තවදුරටත් උසස් මට්ටමකින් දරුවන් වෙත ලබාදීම සඳහා ද්විතීයික පාසල් දහස සංවර්ධනය කිරීමේ වැඩසටහනට සමගාමීව ළමා මිතුරු පාසල් පද්ධතිය හඳුන්වා දී තිබේ.

පාසලට එන දරුවා, දැනුම, කුසලතා හා ආකල්ප සමගින් සංවර්ධනය කරමින් ඔවුන් අධ්‍යාපනයේ ඉදිරි අදියර වෙත ගමන් කිරීමට පෙර ප්‍රාථමික අවධියේ දී, පාසල තුළ සතුටුදායක ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම සඳහා, "ළමා මිතුරු පාසල්" ලෙස ප්‍රාථමික පාසල් ජාලය ක්‍රියාත්මක කිරීම අපගේ අපේක්ෂාවයි. එමෙන්ම සිසුන්ගේ අවශ්‍ය ප්‍රාප්ති මට්ටම්වලට සාර්ථකව ළඟා වීමට මඟ පෙන්වීමක් ප්‍රාථමික පාසල් පද්ධතිය මගින් සිදුවිය යුතුය. ඒ තුළින් දරුවන් සිය අධ්‍යයන කටයුතුවල සතුටින් නිරතවෙනවා මෙන්ම අධ්‍යාපන ක්‍රියාවලිය තුළින් අපේක්ෂිත අරමුණු ළඟා කර ගත හැකිවනු ඇත.

ආසියාවේ රටවල් අතරින් ශ්‍රී ලංකාව, මේ වනවිට උසස් අධ්‍යාපන මට්ටමක් ඇති රටක් බවට පත්ව සිටින අතර එය තවදුරටත් තහවුරු කිරීම සඳහා මෙම වැඩසටහන තුළින්, සෑම දරුවකුටම අධ්‍යාපනය ලැබීමේ අයිතිය සුරකිමින් ඔවුන්ගේ විභව්‍යතා උපරිම අයුරින් සංවර්ධනය කරමින්, ද්විතීයික පාසල් තුළට පිවිසෙන විට අවශ්‍ය කරන සාධනීය මට්ටම වෙත ළඟා කර දීම රජයේ අපේක්ෂාවයි.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ, මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්ය කිරීමේ සුවිශේෂී වැඩසටහනේ දී අපේ රට දැනුමේ කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම අරමුණ වන අතර, එය යථාර්ථයක් කර ගැනීම සඳහා සියලු පාර්ශවයන්ගේ අවංක දායකත්වය අවශ්‍ය වේ.

ළමා මිතුරු පාසල් පද්ධතිය සංවර්ධනය කිරීමේ වැඩසටහනේ උපදෙස් සංග්‍රහය සම්පාදනය කිරීම සඳහා කටයුතු කරන ප්‍රාථමික අධ්‍යාපන අංශයට සහ යුනිසෙෆ් ආයතනයට ස්තුතිය පිරිනමන අතර, මෙම වැඩසටහන තුළින් හඳුන්වා දෙන විවිධ මාන ඔස්සේ තම පාසල් සංවර්ධනය කර ගැනීම සඳහා පාසල් ප්‍රජාවේ සියලු දෙනා මෙම උපදෙස් සංග්‍රහය ඵලදායී ලෙස භාවිත කරමින්, ශ්‍රී ලාංකීය දූ පුතුන් විශ්වය ජයගත හැකි පිරිසක් බවට පත්කිරීමේ පුරෝගාමීන් වශයෙන් ක්‍රියාකරනු ඇතැයි අපේක්ෂා කරමි.

බන්දුල ගුණවර්ධන
අධ්‍යාපන අමාත්‍ය

## අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන්

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සැලසුම් කරන ලද ද්විතීයික පාසල් දහසක් සහ ප්‍රාථමික පාසල් ජාලයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතියි. මෙම අංගසම්පූර්ණ ද්විතීයික පාසල් දහස දැයේ දරුවන්ට, තම විභව්‍යතාවයන් උපරිම ලෙස සංවර්ධනය කර ගැනීමට අවශ්‍ය මග පෙන්වීම ලබා දෙනු ඇත. ඒ අනුව ඔවුන් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ රටට අවශ්‍ය නායකත්වය ලබා දෙමින් මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් පරිදි, ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් කිරීමට පෙරමුණ ගනු ඇතැයි විශ්වාස කරමි.

ද්විතීයික අධ්‍යාපනයට ඇතුළත් විය යුතු වන්නේ ප්‍රාථමික අධ්‍යාපන අවධිය ඵලදායී ලෙස සම්පූර්ණ කළ, අවශ්‍ය මූලික නිපුණතා අත්පත් කර ගන්නා ලද සිසුන්ය. මේ සඳහා සිසු විවිධත්වයට ගරු කරමින්, ප්‍රීතිමත් ඉගෙනුම් අවස්ථා සම්පාදනය කිරීම, ප්‍රාථමික අධ්‍යාපන අවධියේ දී සිදුවිය යුතුය. එසේම සිසු පෞරුෂ සංවර්ධනය සඳහා මූලික අඩිතාලම සකස් කිරීම සිදුවන්නේ ද ප්‍රාථමික පාසල මගිනි. මේ සඳහා උචිත ක්‍රමෝපායක් ලෙස ළමා මිතුරු පාසල් වැඩසටහන හැඳින්වීමට කැමැත්තෙමි,

ළමා මිතුරු පාසල මගින් සෑම සිසුවකුට ම තම පරිසර අත්දැකීම් පදනම් කර ගනිමින් වටපිටාව ගවේෂණය කරමින් මනා ගුණ ධර්ම එකතු කර ගනිමින් ආතතියෙන් තොර ව සතුටින් අධ්‍යාපන කටයුතුවල නිරතවීමට අවශ්‍ය පසුබිම සපයනු ඇත. එසේම සිසුන් ගේ රැකවරණය, ආරක්ෂාව, සෞඛ්‍යය වැනි සියලු ම ක්ෂේත්‍ර ඔස්සේ පාසල සංවර්ධනය කිරීම සඳහා විදුහල්පති, ගුරුවරුන් සහ සියලු ම පාසල් ප්‍රජාව එකාවන්ව කටයුතු කිරීම ද ළමා මිතුරු පාසලේ ලක්ෂණයක් වේ. මෙහි දී පාසල සංවර්ධනය කිරීමට ප්‍රජාව දායකත්වය දක්වනවා මෙන්ම ප්‍රජාවේ අභිවෘද්ධිය සඳහා විවිධ වැඩසටහන් පාසල මගින් ද ක්‍රියාත්මක කිරීම විශේෂත්වයකි.

ළමා මිතුරු පාසල් ආකෘතිය සකස් කිරීම හා එම ආකෘතිය ප්‍රාථමික අධ්‍යාපන අංශයට හඳුන්වා දෙමින් ක්‍රියාත්මක තලයට ගෙන ඒමත්, අවශ්‍ය මාර්ගෝපදේශ ලබාදීමට මෙවැනි උපදෙස් සංග්‍රහයක් සකස් කිරීමත් වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව ඇතුලු අනෙකුත් ශාඛාවල නිලධාරීන්, ජාතික අධ්‍යාපන ආයතනයේ හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල නිලධාරින්, විදුහල්පතිවරුන් හා ගුරුවරුන් ද දැක් වූ දායකත්වය අගය කරමි. මෙම වැඩසටහන සඳහා අවශ්‍ය තාක්ෂණික හා මූල්‍ය අනුග්‍රහය මෙන්ම ප්‍රාථමික අධ්‍යාපනය සඳහා නිරන්තර දායකත්වය ලබා දෙන යුනිසෙෆ් ආයතනයට ද මාගේ ස්තුතිය පුද කරමි. ගුණාත්මක ප්‍රාථමික අධ්‍යාපනයක් සඳහා ක්‍රියාත්මක කරන ළමා මිතුරු පාසල් වැඩසටහන වඩාත් ඵලදායි කරගැනීමට අධ්‍යාපන පද්ධතියේ සියලුම අංශවල පූර්ණ සහයෝගය ලබාදෙනු ඇතැයි බලාපොරොත්තුවෙමි.

ගාමිණී විජිත් විජයමුණි සොයිසා
අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය

## අධ්‍යාපන ලේකම්තුමාගෙන්

ශ්‍රී ලංකා රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව වන මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව ශ්‍රී ලංකාව ගෝලීය වශයෙන් වැදගත් ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට පත්කර ගැනීමට අවශ්‍ය නිපුණතා සහිත පුද්ගලයින් බිහි කිරීම පාදක කරගත් ගුණාත්මක හා ශිෂ්‍යයන්ට මිත්‍රශීලී වන අධ්‍යාපන ක්‍රමයක් වෙත අපි පියවර තබමින් සිටිමු. මේ සඳහා ළමයින් ගේ විවිධ හැකියාවලට ගැළපෙන, ඔවුන් ගේ විභවතා උපරිම ආකාරයෙන් සංවර්ධනය කිරීම ඉලක්ක කර ගත් අධ්‍යාපනයක් ලබා දීමට සියලු ම පාර්ශවයන් එකාවන්ව ක්‍රියාත්මක විය යුතු ය.

මෙහි දී සෑම ළමයකුගේ ම අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය තහවුරු විය යුතු අතර ළමයින් ගේ සමාජ ආර්ථික මට්ටම, ජන වර්ගය, ස්ත්‍රී පුරුෂභාවය වැනි කිසිදු හේතුවක් නිසා ඔවුන් වෙනස්කොට සැළකීමකට භාජනය නොවිය යුතුය. සියලු ම ළමයින් ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීමට ඉඩ සලසන අතරම, නිසි රැකවරණය හා පෝෂණය ලබා ගැනීමට ඇති අයිතිය සුරැකීම ද සිදු විය යුතුය. මෙම සියලු අවශ්‍යතාවන් සපුරාලන පාසල් සංස්කෘතියක් කරා පාසල මෙහෙයවන ක්‍රමෝපායක් ලෙස ළමා මිතුරු පාසල් ප්‍රවේශය හැඳින්වීමට කැමැත්තෙමි.

පූර්ණ පෞරුෂයක් සහිත පුද්ගලයෙකු බිහි කිරීම සඳහා වඩාත් තීරණාත්මක අවධිය වන ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා මෙම ළමා මිතුරු ප්‍රවේශය හඳුන්වා දීමට කටයුතු කිරීම ද ඉතා උචිත බව විශ්වාස කරමි. අධ්‍යාපනය ලැබීමට, නිසි රැකවරණය ලැබීමට හා තම අදහස් ප්‍රකාශ කිරීමට සියලු ම ළමයින්ට ඇති අයිතිය තහවුරු වන ලෙසත් ස්වයං ඉගෙනුමට, නිරීක්ෂණයට හා ගවේෂණයට පොළඹවන, ඵලදායි ඉගෙනුම් ක්‍රමවේදයන් ක්‍රියාත්මක වන පාසලක් නිර්මාණය වන ලෙසත් ළමා මිතුරු පාසල් ආකෘතිය මාන හයක් ඔස්සේ විහිදෙයි. එසේම මෙම මාන හය යටතේ ඉදිරිපත් කර ඇති නිර්ණායක හා දර්ශක භාවිතයෙන් ළමා මිතුරු පාසලේ ප්‍රගතිය නියාමනය කිරීමට හැකිවීම ද විශේෂත්වයකි. අධ්‍යාපන ආංශික සංවර්ධන ප්‍රවේශ රාමුව හා වැඩසටහනට අනුගතව සැලසුම් කර ඇති මෙම ළමා මිතුරු පාසල් ආකෘතිය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමත්, ඒ තුළින් සියලු ම සිසුන් ගේ විභවතා උපරිම ලෙස සංවර්ධනයට අවශ්‍ය පරිසරය සකස් කිරීමත් ප්‍රාථමික අධ්‍යාපනය භාර ව කටයුතු කරන සියලු දෙනාගේ ම වගකීම බව අවධාරණය කරමි.

ළමා මිතුරු පාසල් ආකෘතිය ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය මූලික දැනුවත් වීම සඳහා මෙවැනි උපදෙස් සංග්‍රහයක් සකස් කිරීම ඵලදායි කාර්යයකි, ඒ සඳහා මූලිකත්වය ගත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික අධ්‍යාපන ශාඛාවේ හා අදාළ අනෙකුත් ශාඛාවල නිලධාරීන්ටත් ජාතික අධ්‍යාපන ආයතනයේ හා පළාත්/කලාප අධ්‍යාපන කාර්යාලවල නිලධාරීන්ටත් විදුහල්පතිවරුන් හා ගුරුවරුන්ටත් ළමා මිතුරු පාසල් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී නිරතුරුව ම සහාය ලබා දෙන යුනිසෙෆ් ආයතනයටත් මාගේ ස්තුතිය පළ කරමි.

එච්. එම්. ගුණසේකර
අධ්‍යාපන ලේකම්

## යුනිසෙෆ් ශ්‍රී ලංකා නියෝජිතගෙන්

අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි අත්පත් කරගත් විශාල ජයග්‍රහණ අතර, ළමා මිතුරු පාසල්, ප්‍රවේශය ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන ප්‍රවාහයට එක් කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට පළමුව මාගේ සුභ පැතුම් එක් කිරීමට කැමැත්තෙමි. දැඩි ප්‍රතිපත්තිමය රාමුවක් තුළ කටයුතු කිරීම වෙනුවට මෙවැනි අන්තර් ක්‍රියාකාරී ප්‍රවේශයක් තුළින් ගොඩනැගෙන පාසල් ගුණාත්මක බව කරා සුවිශේෂී ගමන් මගක් ගන්නා බව සැළකිය යුතුයි.

ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම සිය මූලධර්මය කොටගත් ළමා මිතුරු පාසල සංවර්ධනය වීමේදී ළමයින්ට හොඳම දේ ලබාදීම සඳහා ළමයින්, දෙමව්පියන්, ප්‍රජාව සහ අනෙකුත් සුභ පතන්නන් විසින් දරනු ලබන නිශ්චිත කාර්යභාර්යයක් ඇත. ළමයි ක්‍රියාකාරී ගවේෂණයෙහි නිරන්තරයෙන් යෙදෙති. බොහෝ අවස්ථා ඔවුන්ට නවතම අභියෝග වන අතර පරිකල්පනයට කරුණු දැක්වීමට, ගැටලු විසඳීමට සහ තම ආත්ම අභිමානය ගොඩ නගා ගැනීමට මෙන්ම අන් අයගේ අභිමානයට ගරු කිරීමටත් ගුරුවරුන් විසින් මග පෙන්වීම සහ පහසුකම් සැලැස්වීම කළ යුතුය. ඉගෙනුම් ක්‍රියාවලිය තුළ ළමයා කේන්ද්‍රස්ථානයක තැබීම සෑම ඉගෙනුම් අත්දැකීමකින්ම සිදුවිය යුතුය. ළමා මිතුරු පාසල් ඵලදායි ඉගෙනුමක් සිදුවන ආරක්ෂාකාරී සහ සත්කාරශීලී වටපිටාවක් ලබාදෙයි.

ශ්‍රී ලංකාවේ පාසල් වඩාත් ළමා මිතුරු කිරීමේ ක්‍රියාවලිය තුළ ළමයින්ට රැකවරණය සහ පරිස්සම මෙන්ම සෞඛ්‍යය හා පෝෂණය සම්බන්ධ ගැටලු ද ඇමතීමට වැඩි වැඩියෙන් ආයෝජනය කිරීම යුක්ති සහගත බව ළමා මිතුරු පාසල් ජාතික ප්‍රතිපත්ති රාමුව මගින් පෙන්වා දෙනු ඇතැයි මම විශ්වාස කරමි.

සහශ්‍රක සංවර්ධන සහ සැමට අධ්‍යාපන ඉලක්ක ළඟා කරගැනීම සඳහා මෙන්ම සෑම ප්‍රදේශයකම පාසල් සඳහා ජලය හා සනීපාරක්ෂක පහසුකම් ඇතුළු සෞඛ්‍යය හා ඵලදායි ඉගෙනුම් පරිසර බිහි කිරීමේ ශ්‍රී ලංකා රජයේ සහයෝගිතා ප්‍රයත්නයට එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල අඛණ්ඩ සහායක් ලබා දීමට එක්ව සිටියි.

ළමා මිතුරු පාසල් පිළිබඳ දැනුම හා භාවිත අවස්ථා ප්‍රචලිත කිරීමෙන් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් දරන ප්‍රයත්නයට රුකුලක් වන මෙම අත්පොත නිම කිරීමේ වැදගත් හා සතුටුදායක කර්තව්‍යයෙහි පාර්ශවකරුවකු වීමට ලැබීම ගැන යුනිසෙෆ් ආයතනය ප්‍රසාදය පළ කර සිටියි.

රේසා හොසෙයිනි
ශ්‍රී ලංකා නියෝජිත
යුනිසෙෆ්

# හැඳින්වීම

## ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය

ශ්‍රී ලංකාව 1948 නිදහස ලබාගැනීමටත් පෙර එනම් 1945 සිට සැමට නිදහස් අධ්‍යාපනය යන මාවතට අවතීර්ණ විය. ශ්‍රී ලංකාවේ සෑම ළමයෙකුට ම අනිවාර්යයෙන් අවුරුදු 9ක මූලික අධ්‍යාපනය ලබාදීම සිදුවන අතර නොමිලේ නිල ඇඳුම්, පාසල් පෙළ පොත් අවශ්‍යතා සහ පාසල් දිවා ආහාර ලබාදීම ද දිගු කාලයක් තුළ නොකඩවා සිදුවෙමින් පවතී.

1972 ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රාථමික අධ්‍යාපනය තුළ විශාල වෙනසක් ඇති කිරීමට හේතු විය. ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාවේ සර්පිලාකාර ස්වභාවය හා ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය නිසා ප්‍රාථමික අධ්‍යාපන අවධිය සිසුන්ට මෙන් ම ගුරුවරුන්ට ද ප්‍රියජනක අත්දැකීමක් වේ. 1998 දී සිදු කරන ලද ප්‍රතිසංස්කරණ තුළින් ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාව සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය තවදුරටත් ශිෂ්‍ය කේන්ද්‍රීය බවට පත් කිරීමට සමත් විය. මෙවැනි ප්‍රගතිශීලී ප්‍රතිපත්ති හඳුන්වා දීම තුළින් ප්‍රාථමික අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ වඩා ශක්තිමත් ප්‍රතිඵල ළඟා කරගෙන සැමට අධ්‍යාපනය යන අරමුණු කරා ළඟාවීමට අවස්ථාව උදාවී ඇත.

සංවර්ධනය වෙමින් පවත්නා රටවල් සමග සැසැඳීමේ දී ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන ක්ෂේත්‍රය ළඟා කර ගත් සුවිශේෂී ඉලක්ක රාශියකි. උදාහරණ කිහිපයක් ලෙස ගැහැණු පිරිමි භේදයකින් තොරව 95.0% ක වැඩිහිටි සාක්ෂරතා අනුපාතයක් අත්පත් කර ගැනීම, ප්‍රාථමික අධ්‍යාපනයට ඇතුළත් වීමේ අනුපාතය 98%ක් කරා ළඟාවීම, 2008 විශ්ව තරගකාරී වාර්තාවට (The Global Competitive Report) අනුව සමීක්ෂණයට ලක් කළ ලෝකයේ රටවල් 131ක් අතරින් ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක බව අතින් 42වන ස්ථානය අත්පත්කර ගැනීම වැනි තත්ත්වයන් දැක්විය හැකි වේ. එසේම අවුරුදු 5-14 වයස් සීමාවේ ළමයින් අනිවාර්යයෙන් ම අධ්‍යාපනය ලැබිය යුතු බව අනිවාර්ය අධ්‍යාපන නියෝග මගින් ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව 2009 වසර වනවිට මූලික අධ්‍යාපනය එනම් 1-9 ශ්‍රේණි (වයස අවුරුදු 5-14) සම්පූර්ණ කරන සිසු අනුපාතය 91%ක් දක්වා වර්ධනය වී තිබීම සතුටුදායක තත්ත්වයකි.

ළමයින්ට අධ්‍යාපනය ලබා දීම සඳහා දිවයින පුරා විසිරුණු පාසල් 9410 කින් යුත් පාසල් ජාලයක් ක්‍රියාත්මක වන අතර මව් භාෂාවෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලබා දීම සිදුවේ. එහෙත් අනිවාර්ය අධ්‍යාපනය වයස් සීමාවේ සිටින ළමයින්ගෙන් 09%ක් තවමත් අනිවාර්ය අධ්‍යාපනය සම්පූර්ණ කරනු නොලැබේ. ග්‍රාමීය ප්‍රදේශ හා වතුකරය වැනි අඩු පහසුකම් සහිත එසේම භූගෝලීය වශයෙන් යම් දුෂ්කරතා ඇති ප්‍රදේශවල දක්නට ලැබෙන පාසල්වලට ඇතුළත් වීමේ අඩු ප්‍රතිශතය හා පාසල් අධ්‍යාපනයෙන් ගිලිහීම, ජාතික ප්‍රවේශ අනුපාතය ඉහළ ඉලක්ක කරා ළඟා වීමට බාධාවක් වී ඇත.

ප්‍රාථමික අධ්‍යාපන සාධන මට්ටම් දෙස බැලීමේ දී අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ද යම් යම් ගැටලු සහගත තත්ත්වයන් පවතින බව පැහැදිලි වේ. 2009 වසරේ NEREC අධ්‍යයන වාර්තාවට අනුව හතරවන ශ්‍රේණියේ සිසුන්ගේ ගණිත විෂයය සාධනයේ මධ්‍යන්‍යය අගය සිංහල මාධ්‍යය සඳහා 77.4ක් හා දෙමළ මාධ්‍යය සඳහා 62.3ක් වේ.

එසේම මව්බස ලෙස සිංහල භාෂාව හදාරන සිසුන්ගේ මධ්‍යන්‍යය අගය 75.5 ක් ලෙසත් දෙමළ භාෂාව මව්බස ලෙස හදාරන සිසුන්ගේ මධ්‍යන්‍යය අගය 63.3 ක් ලෙසත් දක්වා ඇත. එමෙන් ම පාසල්වල පවතින යටිතල පහසුකම්වල විෂමතා ද අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණකි. ප්‍රාථමික අධ්‍යාපන පුහුණු ගුරුවරුන් ගේ හිඟය, හඳුන්වා දී ඇති ප්‍රතිමාන අනුව සකස් නොවූ පන්ති කාමර, ප්‍රාථමික පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ නිශ්චිත තත්ත්වයක් නොවීම, ලී බඩු හා උපකරණ හිඟය සහ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ අඩුපාඩු වැනි කරුණු මේ යටතේ දැක්විය හැකිය.

සුන්දර වූ ළමා කාලය සාර්ථක වූ, අත්දැකීම් බහුල වූ පරිසරයක් බවට පත් කිරීම පාසල මඟින් ඉටු කරනු ලබයි. ළමයෙකුට පාසල් යාම යනු ඉගෙන ගත් දේ සතුටෙන් බෙදාගැනීම, ජීවන කුසලතා වැඩි දියුණු කරගෙන ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කර ගැනීම මෙන්ම අනාගතය සකස් කරගැනීමට අවශ්‍ය හිතකර අත්දැකීම් ලබා ගැනීමක් ද වේ. මෙයට ගැළපෙන ප්‍රාථමික පාසලක් නිර්මාණය කිරීම සෑම සමාජයකම වගකීම වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා මෙවැනි පසුබිමක් සකස් කිරීමේ උපායමාර්ගයක් ලෙස ළමා මිතුරු පාසල හඳුන්වා දිය හැකිය.

"ළමා මිතුරු පාසල ඉතා ප්‍රියජනක ආරක්ෂාකාරී රැකවරණය සහිත හා සෑම ළමයෙකුගේ ම උපරිම විභව්‍යතා සංවර්ධනයට ඉඩ ප්‍රස්තා ලබාදෙන ස්ථානයකි. මේ සඳහා පාසල් ප්‍රජාවේ උපරිම දායකත්වය හා සහභාගීත්වය ද ඇතුළත් ය."

ළමා මිතුරු පාසල යනු විශ්ව ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට
අනුව සියලු ම ළමයින්ගේ සියලු ම අයිතිවාසිකම් සක්‍රීය ව සපුරාලන පාසලකි.

පාසලක ළමා මිතුරු භාවය සංවර්ධනය කිරීම යනු අඛණ්ඩ ව සිදුවිය යුතු ක්‍රියාවලියකි. මේ සඳහා පහත සඳහන් පරිදි මාන 6 කින් යුත් ආකෘතියක් හඳුනාගෙන ඇත.

- ★ අයිතිවාසිකම් පාදක වූ සක්‍රීය අන්තර්කරණය
- ★ ස්ත්‍රී පුරුෂ සමාජානුභාවයට ප්‍රතිචාරී වීම
- ★ ළමයින්ගේ ඉගෙනුම් ඵල සංවර්ධනය කිරීම
- ★ ළමයින්ගේ සෞඛ්‍යය, ආරක්ෂාව හා රැකවරණය තහවුරු කිරීම
- ★ ශිෂ්‍යයින්, පවුල් සහ ප්‍රජාවගේ සක්‍රීය දායකත්වය
- ★ ළමා මිතුරු පද්ධති ප්‍රතිපත්ති, පරිචය හා රෙගුලාසි මගින් සහය ලැබීම

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන ක්‍රියාවලිය තුළ සෑම පාසලක් ම මෙම මාන 06 ට විවිධ මට්ටම්වලින් අනුගත වී ඇත.

ළමා මිතුරු පාසල් වැඩසටහනේ අරමුණ වන්නේ සෑම පාසලක් ම දැනට පවතින තත්ත්වය හඳුනාගනිමින් මෙම මාන ඔස්සේ ප්‍රතිමානයන් ගොඩ නගා ගනිමින් සංවර්ධනය වීම ය. වසර 2002 දී වයඹ පළාතේ පාසල් 124ක ළමා මිතුරු පාසල් වැඩසටහන නියාමක ව්‍යාපෘතියක් ලෙස දියත් විය. අධ්‍යාපන අමාත්‍යාංශය හා වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් හා යුනිසෙෆ් ආධාර යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක විය.

මෙම නියමු වැඩසටහන තුළ ළඟා කර ගත් බොහෝ සාර්ථක ප්‍රතිඵල දක්නට ලැබුණි. නිදසුන් වශයෙන් සිසුන්ගේ දෛනික පැමිණීමේ වර්ධනය, ප්‍රසන්න හා සෞඛ්‍යය සම්පන්න පාසල් පිරියත, පාසල් ප්‍රජා සහභාගිත්වය, පාසල මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම හා සාර්ථකව මුහුණ දීම සඳහා සාමූහික ප්‍රයත්නයන් ආදිය දැක්විය හැකි ය.

මෙම නියමු ව්‍යාපෘතියේ සාර්ථකත්වය මත ළමා මිතුරු පාසල් වැඩසටහන 2004 වර්ෂයේ දී යුනිසෙෆ් ආයතනයේ ආධාර මත තවදුරටත් ප්‍රචලිත කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඒ අනුව යුනිසෙෆ් ආධාර ලබන දිස්ත්‍රික්කවල පාසල් සංඛ්‍යාවෙන් 30%ක් පමණ මෙම වැඩසටහනට ඇතුළත් විය. ඒ අනුව මේ වන විට දිවයිනේ පාසල් 1400කට ආසන්න සංඛ්‍යාවක මෙම ළමා මිතුරු පාසල් වැඩසටහන ක්‍රියාත්මක වේ.

## ළමා මිතුරු පාසල් උපදෙස් සංග්‍රහයක අවශ්‍යතාව

පාසලක ළමා මිතුරු භාවය සංවර්ධනය කිරීම යනු සාමූහික ක්‍රියාවලියකි.

ඒ සඳහා ළමා මිතුරු පාසල් ආකෘතියේ විවිධ පැතිකඩ නිවැරැදි ව අවබෝධ කර ගැනීම ඉතා වැදගත් ය. මේ සඳහා මගපෙන්වීමක් වශයෙන් උපදෙස් සංග්‍රහයක අවශ්‍යතාව මේ වන විට මතු වී ඇත. මෙම අවශ්‍යතාව සපුරාලීම සඳහා මෙම අත්පොත සකස් කර ඇති අතර මෙය ශ්‍රී ලංකාවේ ළමා මිතුරු පාසල් සඳහා පරිශීලනය කළ හැකි ලියවිල්ලකි. ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රතිපත්ති සම්පාදකයින් හා සැලසුම්කරුවන්ට, විවිධ මට්ටම්වල ප්‍රතිපත්ති සම්පාදනයේ දී ළමා මිතුරු පාසල් ප්‍රවේශය මගින් ඉදිරිපත් කර ඇති නිර්ණායක ඔස්සේ අවධානය යොමු කිරීමට මෙම උපදෙස් සංග්‍රහය මග පෙන්වනු ඇත.

## මෙහි අරමුණු

- ළමා මිතුරු පාසල් ආකෘතිය පිළිබඳ දර්ශනය, මූලධර්ම හා අන්තර්ගතය හඳුන්වා දීම
- ළමා මිතුරු පාසලේ සියලු ම පාර්ශවකරුවන් සංවේදීකරණය වීම
- ළමා මිතුරු පාසල අපේක්ෂිත ප්‍රතිඵල කරා ළඟා කර වීම සඳහා සැළසුම් කිරීමට හා ක්‍රියාකාරකම් සංවිධානය කිරීමට සියලු ම පාර්ශවකරුවන්ගේ ශක්‍යතා වර්ධනය කරලීම
- ළමා මිතුරු පාසල්, ක්‍රියාවලිය  නියාමනය හා ඇගයීම සඳහා සියලු ම පාර්ශවකරුවන් ශක්තිමත් කරවීම

## මෙහි අන්තර්ගතය

ළමා මිතුරු පාසල් සංකල්පයේ විවිධ මාන විග්‍රහ වන පරිදි මෙම උපදෙස් සංග්‍රහය පරිච්ඡේද 07 කින් සමන්විත ය.

- අයිතිවාසිකම් පාදක වූ සක්‍රීය අන්තර්කරණය
- ස්ත්‍රී පුරුෂ සමාජානුභාවයට ප්‍රතිචාරී වීම
- ළමයින්ගේ ඉගෙනුම් ඵල ගුණාත්මක ව සංවර්ධනය කිරීම
- ළමයින්ගේ සෞඛ්‍යය, ආරක්ෂාව හා රැකවරණය තහවුරු කිරීම
- ශිෂ්‍යයින්, පවුල් සහ ප්‍රජාවගේ සක්‍රීය දායකත්වය
- ළමා මිතුරු පද්ධති, ප්‍රතිපත්ති, පරිචය හා රෙගුලාසි මගින් සහය ලැබීම
- පාසල් ස්වයං තක්සේරුකරණය හා පාසල් සංවර්ධන සැලැස්ම

ළමා මිතුරු පාසලක සිසුහු දෙමාපියන්ට හා ගුරුවරුන්ට ආදරය කරති. ගුරුවරුන්ගේ කැපවීම අගය කරති. ගුරුවරුන් හා දෙමාපියන් පිළිබඳ ව සුභවාදී ව කතා කරති.

පළමුවන පරිච්ඡේදය

# පළමුවන මානය
# අයිතිවාසිකම් පාදක වූ සක්‍රීය අන්තර්කරණය

## හැඳින්වීම

වැඩිහිටියන්ට මෙන් ම ළමයින්ට ද සුවිශේෂ වූ මූලික අවශ්‍යතා රාශියක් ඇත. ළමයින්ගේ මූලික අවශ්‍යතා සම්පූර්ණ වීමට සුදුසු පරිසරය නිර්මාණය කිරීම සමාජයීය වගකීමකි.

මේ පිළිබඳ ව ඇති අඩු අවධානය නිසා, ළමයින්ගේ මූලික අවශ්‍යතා නොලැබී යන අවස්ථා ඇතැම් විට දක්නට ලැබේ.

එහෙයින් මෙම මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා නෛතික රාමුවක් ලෙස 1989 දී එක්සත් ජාතීන්ගේ මහා සමුළුවේ දී ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය සම්පාදනය කරන ලදී. මෙය 1991වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ සම්මත කර ගන්නා ලදී.

ඒ අනුව අධ්‍යාපනය ලබා ගැනීම සෑම ළමයෙකුගේ ම අයිතිවාසිකමකි. අධ්‍යාපනය ලබා ගැනීම සෑම ළමයෙකුගේ ම අයිතිවාසිකමක් ලෙස සළකා කටයුතු කිරීම සමාජයීය වගකීමක් වේ. විවිධ සමාජයීය හා ආර්ථික මට්ටම්, කායික හා මානසික තත්ත්වයන් සහ සංස්කෘතික වෙනස්කම් වැනි විෂමතාවයන් නොසළකා සියලුම ළමයින් අධ්‍යාපනයේ අන්තර්කරණය කිරීම ළමා මිතුරු පාසලෙහි පළමුවන මානයෙන් අපේක්ෂා කෙරෙයි.

## ළමා අයිතිවාසිකම්

**ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ වගන්ති 42 කින් ළමා අයිතිවාසිකම් දක්වා ඇත. මෙම අයිතිවාසිකම් ප්‍රධාන කාණ්ඩ හතරක් යටතේ ගොනු කළ හැකි ය.**

1. ජීවත් වීමට ඇති අයිතිය
2. රැකවරණයට ඇති අයිතිය
3. සංවර්ධනයට ඇති අයිතිය
4. සහභාගිත්වයට ඇති අයිතිය

ළමා මිතුරු පාසල් සංකල්පය තුළින් මෙම අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට වඩාත් සුදුසු තත්වයක් නිර්මාණය කළ හැකි වේ.

ළමයින්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමට බලපාන හේතු කිහිපයක් පහත දක්වා ඇත.


- දිළිඳුකම
- ගෘහස්ත ප්‍රචණ්ඩත්වය
- ජීවත්වීමට නිවසක් නොමැතිකම
- හාස්‍යයට ලක්වීම
- නොසළකා හැරීම
- සුව කළ හැකි රෝග පිළිබඳ ව නොසළකා හැරීම
- අධ්‍යාපන ප්‍රවේශයට ඇති අසමානතා
- ළමයින් ගේ විශේෂ අවශ්‍යතා පිළිබඳ ව අවධානය යොමු නොකිරීම
- මෙහෙකාර සේවයට යොදා ගැනීම
- යුද්ධමය තත්වයන්

මෙවැනි හේතු ළමයා ගේ අධ්‍යාපනයට අහිතකර ලෙස බලපෑම් ඇති කළ හැකි ය. ළමා මිතුරු පාසලෙහි කාර්යභාර්යය වනුයේ මෙම අහිතකර බලපෑම් හැකි තරම් අවම කිරීමට මැදිහත් වීමයි.

## අන්තර්කරණ අධ්‍යාපනය

අන්තර්කරණ අධ්‍යාපනය යනු සියලු ම ළමයින්ගේ විවිධත්වයට ගරු කරමින්, ළමයින් කිසිදු වෙනසකට භාජනය නොකර, අධ්‍යාපනය ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා සැලසීමයි.

අන්තර්කරණ අධ්‍යාපනය සඳහා පාසලේ සිටින දරුවන්ගේ විවිධතා සහ සමාජ, ආර්ථික හා පාරිසරික තත්ත්ව හඳුනාගැනීම ඉතා අවශ්‍ය වේ. එම සෑම දරුවෙකුගේ ම අවශ්‍යතා සපිරෙන ලෙස කටයුතු කිරීම ළමා මිතුරු පාසලක ප්‍රධාන ලක්ෂණයකි.



## අන්තර්කරණ අධ්‍යාපන සංකල්පයේ වැදගත් කරුණු

- ★ සෑම ළමයකුට ම පාසලකට ඇතුළත් වීමට සහ සමානව අධ්‍යාපනය ලැබීමේ ක්‍රියාවලියට සහභාගි වීමට අයිතියක් තිබීම පිළිගනිමින් එය ක්‍රියාත්මක කිරීම.
- ★ ආර්ථික තත්ත්වය, සමාජමය උස් පහත් මට්ටම්, ජාතිය, ආගම, භාෂාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ඉගෙනීමේ දුෂ්කරතා සහ කායික දුබලතා යන කරුණු කිසිවක් අනුව කිසිම ළමයකුට වෙනස් කොට නොසැළකීම හෝ කොන් නොකිරීම.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී කිසිම ළමයකු කොන් කිරීමට හෝ වෙනස් කොට සැළකීමට තර්ජනය කිරීමට කිසිදු නෛතික පදනමක් නැත.

ළමයින් සක්‍රීය ව හා සාමූහික ව සහභාගී වී ඉගෙනුම් කටයුතුවල නිරත වීමෙන් ඵලදායී අධ්‍යාපනයක් සාක්ෂාත් වේ. අන්තර්කරණ අධ්‍යාපනය නිසා ළමයින් ගේ සුභදතාවය වර්ධනය වී, අවබෝධය තුළින් වැඩ කටයුතු කිරීම පහසු කරයි. මෙසේ අන්තර්කරණ ක්‍රියාවලිය ඵලදායීව ක්‍රියාත්මක වීම නිසා ළමා මිතුරු පාසල ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ ප්‍රකාර ළමා අයිතිවාසිකම් සක්‍රීයව ළඟා කර දෙන පාසලක් ලෙස හැඳින්විය හැකි ය. ළමා මිතුරු පාසල් සංකල්පය යථාර්ථයක් බවට පත් වීමට නම් එවැනි පාසලක අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක වීම හා ළමා අයිතිවාසිකම් සුරැකීම යන කරුණු දෙකම ඉටුවීම අත්‍යවශ්‍ය බව පැහැදිළි වේ. එයට හේතුව වන්නේ අන්තර්කරණ අධ්‍යාපනය හා ළමා අයිතිවාසිකම් එකිනෙක හා බැඳී පැවතීමයි.

## නිර්ණායක

අයිතිවාසිකම් පාදක සක්‍රිය ව අන්තර්කරණය වූ පාසලක තිබිය යුතු යැයි හඳුනාගත් අපේක්ෂිත තත්ත්වයන් පහත සඳහන් කර ඇත. මේවා ළමා මිතුරු පාසල් ආකෘතියෙහි පළමුවන මානයට අයත් නිර්ණායක වේ.

- ★ පාසලෙන් ගිලිහෙන්නන් වැළැක්වීම සඳහාත් පාසල් නොයන ළමයින් පිළිබඳ ව සොයා බැලීම හා ප්‍රතිචාර දැක්වීම සඳහාත් ඵලදායී යාන්ත්‍රන තිබේ. ඒවා භාවිත කරයි.
- ★ පාසලේ ඇති ක්‍රියාකාරකම්වලට සහභාගීවීමට සහ සම්පත් භාවිතයට සියලු ම ළමයින්ට සමාන ප්‍රවේශයක් ඇත.
- ★ කායික හා මානසික දඬුවම් ක්‍රියාත්මක නොවේ. බිය වැද්දීම් හා හිරිහැර කිරීම් වැළැක්වීමේ ක්‍රියාමාර්ග හා එයට ප්‍රතිචාර දැක්වීම් ඇත.
- ★ ළමා අයිතිවාසිකම් පිළිබඳ ව සමස්ත පාසල් ප්‍රජාව ම දැනුවත් ය. එම අවබෝධය මත පාසලේ ක්‍රියාකාරකම් සිදු කරයි.

# පළමුවන නිර්ණායකය

පාසලෙන් ගිලිහෙන්නන් වැළැක්වීම සඳහාත් පාසල් නොයන ළමයින් පිළිබඳ ව සොයා බැලීම හා ප්‍රතිචාර දැක්වීම සඳහාත් ඵලදායී යාන්ත්‍රණ තිබේ. ඒවා භාවිත කරයි.

ළමා මිතුරු පාසල, සිසුන් ගේ පාසල් පැමිණීම පිළිබඳ ව විශේෂ අවධානය යොමු කළ පාසලකි. දිගු කාලයක් පාසල් නොපැමිණීම හා කඩින් කඩ පාසල් පැමිණීම හේතුවෙන් සිසුන් පාසලෙන් ඈදහැලෙන්නන් බවට පත් විය හැකි ය.

එබැවින් ළමා මිතුරු පාසල සිසු පැමිණීමේ ලේඛන අධ්‍යයනය කිරීමෙන්, ශිෂ්‍යයින් ගේ පවුල් පරිසර තත්ත්වයන් පිළිබඳ ව තොරතුරු යාවත්කාලීන ව පවත්වා ගැනීමෙන් හා ශිෂ්‍යයින් පිළිබඳ මනා වැටහීමක් තිබීමෙන්, ගිලිහීමට ලක් විය හැකි ළමයින් හඳුනා ගනියි. එක් එක් ශිෂ්‍යයාගේ පාසල් පැමිණීම අඩු වීමේ හේතු හඳුනා ගෙන ඒ අනුව අවශ්‍ය ප්‍රතිකාර්යය වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

ළමා මිතුරු පාසලක ළමයින් පාසලට ඇතුළත් වීම හා පැමිණීම පිළිබඳ ව සොයා බැලීම සඳහා පාසල් මට්ටමින් යාන්ත්‍රණයක් ඇත. මේ යටතේ විදුහල්පතිගේ ප්‍රධානත්වයෙන් අවුරුදු 5-14 වයසේ පාසල් නොයන ළමයින් හඳුනා ගැනීම හා පාසල් ගත කිරීම සඳහා කමිටුවක් පාසල් මට්ටමින් ක්‍රියාත්මක වේ.

(ඇමුණුම 01)

මෙම කමිටුව පාසලේ පෝෂිත ප්‍රදේශය තුළ ජීවත්වන පාසල් යායුතු වයසේ සිටින සෑම ගැහැණු හා පිරිමි දරුවකුට ම පාසලට ඇතුළත්වීමට ඉඩ ප්‍රස්ථා සලසා දෙයි, එසේම නොකඩවා පාසල් පැමිණීමට ඇති බාධා මඟහරවා ගැනීමට ද හැකි උපරිම අයුරින් මැදිහත්වීම් සිදු කරයි.

**සියලු ම දරුවන් අධ්‍යාපනයට අනුගත කර ගැනීම සඳහා ළමා මිතුරු පාසලක ක්‍රියාත්මක විය යුතු යාන්ත්‍රණය**

පෝෂක ප්‍රදේශයේ පාසල් යන වයසේ පසුවන, එහෙත් පාසල් නොයන ළමයින් පිළිබඳ තොරතුරු රැස් කිරීම හා දත්ත පවත්වා ගැනීම.

මෙම දරුවන් පාසලට ඇතුළත් කර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම හා ඒ සඳහා පවතින බාධා හඳුනා ගෙන ඒවා අවම කිරීම සඳහා සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ඇගයීම් තුළින් දුර්වල සිසුන් හඳුනා ගැනීම හා ප්‍රතිකාර්යය වැඩ සටහන් පැවැත්වීම.

සිසුන් පිළිබඳ තක්සේරු හා ඇගයීම් වාර්තා නිවැරදි ව පවත්වා ගැනීම.

දෙමාපියන් දැනුවත් කිරීම, ශිෂ්‍ය දක්ෂතා සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීම, ගිලිහී යාම පිළිබඳ සාකච්ඡා කිරීම හා මෙම තත්ත්වය අවම කර ගැනීමේ යෝජනා ඉදිරිපත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

ප්‍රගතිය වාර්තා කිරීම,

ක්‍රියාත්මක කිරීමේ දී පැන නැගුණු ගැටලු සාකච්ඡා කිරීම හා ඒවා අවම කර ගැනීම සඳහා විවිධ උපාය මාර්ග හඳුනා ගැනීම.

නැවත උචිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

මෙවැනි යාන්ත්‍රණයක් පාසල් මට්ටමින් ක්‍රියාත්මක වීම තුළ, දරුවන් පාසලට ඇතුළත් නොවීම, සහ ඇද හැලීම අවම කර ගැනීම කළ හැකි වේ.

බසයක් එනතුරු බලා සිටි විදුහල්පතිවරයාගේ නෙත ගැටුනේ බස් නැවතුම අසල පිහිටි පොදු වැසිකිළිය අසල සිටින පවුලක් වෙත ය. පියා යැයි සිතිය හැකි පුද්ගලයා වැසිකිළිය සේදීම ජීවන වෘත්තිය කරගෙන ඇතිබව ටික වේලාවක් බලා සිටින විට විදුහල්පතිවරයාට පැහැදිළි විය. අවුරුදු හයක් පමණ වේ යැයි සිතිය හැකි කුඩා පිරිමි දරුවෙක් මව අසල දැවටෙමින් සිටියේ ය. අත දරුවකු උකුලේ හොවාගත් මව වරින් වර වැඩිමහලු දරුවාට යමක් පවසනු පෙනුණි.

අධ්‍යාපන කාර්යාලයේ රැස්වීමේ දී ළමා අයිතිවාසිකම් පිළිබඳ ව කරන ලද දේශනය විදුහල්පතිවරයාගේ මනසට නැගුණි. පාසල් නොයන දරුවන් පාසල් ගත කිරීම සඳහා පිහිටුවා ඇති කමිටු ක්‍රියාත්මක කිරීමත් ඒ සඳහා උපාය මාර්ගයන් සාකච්ඡා කිරීමත් මෙදින රැස්වීමේ ප්‍රධාන මාතෘකාව විය. මේ සියලු දේ සමග ම මෙම පවුල සමග කථා කිරීමේ ආශාවක් විදුහල්පතිවරයාට ඇතිවිය.

එම සාකච්ඡාව තුළින් පහත සඳහන් කරුණු අනාවරණය කර ගැනීමට විදුහල්පතිවරයාට හැකිවිය.

- ★ මෙම පවුල මාස කිහිපයක සිට බස්නැවතුමේ ජීවත් වේ.
- ★ මෙයට අවුරුදු දෙකකට පමණ පෙර ඇති වූ ගංවතුර තත්ත්වයක් නිසා ඔවුන් ජීවත් වූ නිවස විනාශ වී ඇත.
- ★ අනවසර ඉඩමක ඉදිකරගෙන තිබූ නිවසක් බැවින් කිසිදු වන්දියක් ලැබී නොමැත.
- ★ ඉන්පසු විවිධ ස්ථානවල ජීවත් වී ඇති අතර මේ වන විට වැසිකිළිය සේදීමෙන් උපයා ගන්නා මුදලින් මේ පවුල ජීවත් වෙයි.
- ★ වැඩිමහල් දරුවාගේ වයස අවුරුදු හතකි. කිසිදිනක පාසල් ගොස් නැත.

දරුවා ළඟට ගත් විදුහල්පතිවරයා පාසල් යාමට කැමැති දැයි ඔහුගෙන් විමසුවේ ය. එම ප්‍රශ්නයට පිළිතුරු ලැබුණේ දරුවාගේ දීප්තිමත් නෙත් සඟලෙනි.

ඊළඟ සතියේ පැවැත් වූ ප්‍රාථමික අංශයේ දෙමාපිය රැස්වීමේ විදුහල්පතිවරයාගේ විශේෂ දේශනය ළමා අයිතිවාසිකම් පදනම් කරගෙන සිදුවිය. එහි දී පාසලට ආසන්නව ජීවත්වන පවුල්වල පාසල් නොයන දරුවන් හා පාසලින් ගිලිහුණු දරුවන් පිළිබඳ ව සොයා බැලීම හා ඔවුන් පාසලට ඇතුළත් කර ගැනීමේ වැදගත්කම පිළිබඳ ව සාකච්ඡා කරන ලදී.

එවැනි දරුවන් තම පාසලට ඇතුළු කරගැනීම සහ ඒ සඳහා උදව් කිරීම පිළිබඳ ව දෙමාපියන්ගේ එකඟතාවය විමසන ලදුව සියලු ම දෙමාපියන් එක හඬින් කැමැත්ත ප්‍රකාශ කරන ලදී. විදුහල්පතිවරයා දුටු පාසල් නොයන දරුවා පිළිබඳ ව තොරතුරු දැනගත් දෙවන ශ්‍රේණියේ ගුරු මහත්මිය සිය කැමැත්තෙන් ම එම දරුවා තම පන්තියට ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටියා ය.

# දෙවන නිර්ණායකය

පාසලේ ඇති ක්‍රියාකාරකම්වලට සහභාගීවීමට සහ සම්පත් භාවිතයට
සියලු ම ළමයින්ට සමාන ප්‍රවේශයක් ඇත.

සියලු ම ළමයින්ට පාසලේ ඇති ක්‍රියාකාරකම්වලට සහභාගීවීමට සමාන ප්‍රවේශ අවස්ථා සැළසීම ළමා මිතුරු පාසලක තිබිය යුතු අංගයකි.

- විෂය සහ විෂය සමගාමී කටයුතු සඳහා ගැහැණු, පිරිමි සැම ළමයකුට ම සමාන අවස්ථා සැපයීම
- පාසලේ සම්පත් සමසේ බෙදී යාම සිදුවිය යුතුයි.

මෙ මගින් සිසුන් ගේ ස්වයං අභිමානය, ස්වයං පෙළඹුම වර්ධනය වීමෙන් ස්වයං ඉගෙනුම කරා යොමු වෙයි.
ඒ නිසා ම ප්‍රීතිමත් ඉගෙනුම් පරිසරයක් ජනිත වෙයි. සිසු විභවයතා උපරිම අයුරින් සංවර්ධනය වෙයි. පාසලේ භෞතික සම්පත් කළමනාකරණය. කළමනාකරණයේ දී ස්ත්‍රී පුරුෂ බව, විශේෂ අවශ්‍යතා ඇතුළු සියලු සාධක සැළකිල්ලට ගෙන උචිත අයුරින් සකසා ගැනීම ළමා මිතුරු බව වර්ධනයට හේතු වේ.



පාසල් සැලසුම් සකස් කිරීමට සහභාගී වීමට ලැබුණු අවස්ථාවේ දී එක්තරා පාසලක දරුවන් තම අදහස් ප්‍රකාශ කළේ මේ ආකාරයටයි. "පාසලේ සෙල්ලම් මිදුලේ ඔන්චිල්ලා දෙකක් තියෙනවා. ඒත් හැම තිස්සේ ම ඔන්චිලි පදින්නේ එක ම සිසුන් කණ්ඩායමක් පමණයි." අනෙක් සිසුන්ට මේ සඳහා අවස්ථාව නොලැබුණු බව ගුරුවරුන් සහ විදුහල්පතිවරයා දැනගන්තේ පාසලේ තිබෙන පහසුකම් සියලු ම සිසුන්ට සමාන ව පරිහරණය කරන්නට අවස්ථා තිබේ ද යන්න සොයා බැලීමට සිසුන් ද සහභාගී කර ගත් නිසයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස සෙල්ලම් මිදුල විධිමත් ව පරිහරණය කිරීමට සියලු දෙනා ම එකතුව කාලසටහනක් සැදුවා. දැනුවත් කළා. ක්‍රියාත්මක කළා. සොයා බැලුවා. ඒ නිසා හැම දෙනාට ම සමාන අවස්ථා ලැබුණා.

"ළමා මිතුරු පාසල් සංකල්පය මගේ සහ පාසල් ප්‍රජාවේ ආකල්ප වෙනස් කොට සෑම දරුවෙකුට ම සමාන ව ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි පාසලේ ඇති සම්පත් මනාව කළමනාකරණය කිරීමට අප යොමු කළා. අපේ පාසල කුඩා පාසලක් වුවත් 1 - 5 දක්වා සෑම පන්තියක ම දරුවන්ට විෂය සමගාමී ක්‍රියාකාරකම්වල නිරතවීමට දැන් අවස්ථා බොහෝයි. දරුවන් මේ තුළින් නවමු අත් දැකීම් ලබමින් සතුටු වනු දැකීම අප සතුටට පත් කරයි."

- විදුහල්පතිවරයෙක් -

# තුන්වන නිර්ණායකය

කායික හා මානසික දඬුවම් ක්‍රියාත්මක නොවේ. බිය වැද්දීම් හා හිරිහැර කිරීම් වැළැක්වීමේ ක්‍රියාමාර්ග හා එයට ප්‍රතිචාර දැක්වීම් ඇත.

අපේ පාසල් පද්ධතිය තුළ ළමා අයිතිවාසිකම් උල්ලංඝනය වන කායික දඬුවම පිළිබඳ ව තවමත් අසන්නට ලැබෙන අවස්ථා එමට ය.

ළමා අයිතිවාසිකම් උල්ලංඝනය සිදු වන්නේ කායික දඬුවම නිසා ම පමණක් නොවේ. නොසළකා හැරීම, දරුවා අවමානයට පත් වන වචන භාවිතය, හෙලා දැකීම, අපහසුතාවයට පත් කිරීම වැනි මානසික දඬුවම් ද ඒ අතර බහුල ය.

කායික දඬුවම් පැමිණවීම නිසා වේදනාව හා ශාරීරික ආබාධිත තත්ත්වයන් ඇති විය හැකි ය. එසේම කායික හා මානසික දඬුවම් දරුවා ලැජ්ජාවට හා අවමානයට පත් කරයි. දරුවා තුළ කාංසාව, ද්වේශය හා වෛරය මතු කරයි. මෙවැනි ගැටලු සහිත දරුවන් පසුකාලීන ව මානසික රෝගීන් බවට පත්විය හැකි ය. එසේම මෙවැනි නොසළකා හැරීම්වලට ලක්වන දරුවන් පසුකාලීන ව සාමාජයීය ගැටලු ඇති කිරීමට තුඩු දෙන සමාජ විරෝධීන් බවට පත්විය හැකි ය. මෙය වඩාත් බරපතල ය.

කායික දඬුවම් පමුණුවන බොහෝ දෙනෙකු එසේ කරන්නේ පාරම්පරික ව ලද ආභාෂය නිසා විය හැකි ය. පැරණි කාලවල දී එය ප්‍රතිඵලදායී ක්‍රමයක් ලෙස අනුගමනය කළත් අද වන විට එහි ඵල විපාක බොහෝ සෙයින් අවබෝධ වී ඇත. එමෙන් ම අද විනය සංවර්ධනය සඳහා ධනාත්මක ක්‍රමවේද භාවිත වෙමින් පවතී. මේ නිසා දඬුවම් බැහැර කිරීමට කාලය එළඹ ඇත. ළමයින් විවිධ වැරදිවලට පෙළඹීමට හේතු වන කරුණු සමහරක් පහත සඳහන් වේ.

- ★ පාඩමට ප්‍රමාණවත් සූදානමක් නොමැතිකම
- ★ ඉගැන්වීමේ ක්‍රමවේදවල ඇති නොගැළපීම
- ★ පාඩම පිළිබඳ සිසුන් දක්වන උදාසීන බව
- ★ පන්ති කළමනාකරණයේ දුර්වලතා
- ★ සිසුන් පිළිබඳ ව ගුරුවරයා තුළ ඇති අශුභවාදී ආකල්ප
- ★ කාලයේ වටිනාකම පිළිබඳ ඇති අවතක්සේරුව
- ★ අවාසිදායක පරිසර තත්ත්වයන් නිසා අවධානමට ලක් වීම

වැඩිහිටියන් ආශ්‍රයෙන් කරන ලද සොයා බැලීම් වල දී ඔවුන්ගේ පාසල් ජීවිතයේ වඩාත් අකමැති අවස්ථා අතරින් එකක් ලෙස දක්වා ඇත්තේ කායික දඬුවම් ලැබූ අවස්ථා බව පැහැදිලි ය.

එමෙන් ම දරුවන්ගේ අත් වැරදි හා අතපසුවීම්වලට කිසිසේත් ම දඬුවම් නොකළ යුතු ය. අත්වැරදිවලට දඬුවම් ලැබෙන විට, වඩාත් භයානක හා හානිදායක අවස්ථාවලට මුහුණදීමට සිදු වීමේ දී වැඩිහිටියන්ගෙන් උදව් ඉල්ලීමට දරුවෝ මැලිවෙති.

## දඬුවම් ලබා දෙන තත්ත්ව වැළැක්වීමට ගත හැකි පියවර

| | |
|---|---|
| **1. සාධාරණ සීමා නියම කිරීම.** | "පන්තියෙන් කාට හරි එළියට යන්න ඕනෑ නම් පන්තියේ ඉන්න ගුරුවරයාගෙන් අවසර අරගෙන යන්න." |
| **2. සීමා හොඳින් පැහැදිලි කිරීම.** | " අපේ පාසල තුළ හැසිරෙන්නට ඕනෑ ආකාරය අපි හැමෝ ම දන්නවනෙ. ඒ අනුව කටයුතු කෙරුවම හැමෝටම පහසුයි " |
| **3. කළ යුතු දේ හා නොකළ යුතු දේ පෙන්වා දීම.** | " පිරිසිදු පන්තියක් හරිම ලස්සනයි නේ ද? අපි මොනව ද පන්තිය පිරිසිදු ව තියා ගන්න කරන්න ඕනෑ." |
| **4. අයහපත් හැසිරීම්වල ප්‍රතිඵල කලින් ම දරුවාට කියා තිබීම.** | "ගෙදර දී කරගෙන එන්නට එකඟ වුණු වැඩ ටික කරගෙන ආවේ නැත්නම් පාඩම තේරුම් ගැනීම අපහසු වෙනවා. විවේක කාලයේ දී හරි ඒ ටික කරන්න වෙයි." |
| **5. දරුවන්ගේ වයස් මට්ටම සැලකිල්ලට ගැනීම. දරුවා වෙතින් ආශ්චර්ය බලාපොරොත්තු නොවීම. ඔවුනට කළ හැකි හා නොකළ හැකි දේ වටහා ගැනීම.** | "හෙට උදේ එනවිට මේ ඉංග්‍රීසි වචන 20 න් පුළුවන් ප්‍රමාණයක් පාඩම් කරගෙන එන්න ඕන." |

## දරුවන්ගේ වැරදි සහගත හැසිරීම් හමුවේ වැඩිහිටි අපි මෙසේ කරමු

- ★ අවබෝධයෙන් නිවැරදි වීමට දරුවාට අවස්ථාව ලබාදීම.
- ★ වරද පැහැදිලි කොට නිවැරදි කර ගැනීමට අවස්ථාව ලබා දීම
- ★ වැරැද්ද සිදුවී ඇත්තේ නොදැනුවත්කමට නම් එය නොකළ යුතු දෙයක් හා එහි අයහපත් බව පෙන්වා දීම.
- ★ දරුවකු අතින් සිදු වූ වැරදි නැවත නැවත මතක් නොකිරීම හා සිදු වූ වැරදි තුළින් නිවැරදි දේ ඉගෙන ගැනීමට පෙළඹවීම
- ★ දරුවන් නිවැරදි කිරීමේ දී ඔබට දඬුවම් පමුණුවා නොගැනීම. දරුවන් ඉදිරියේ කෝප වීම, කෑගැසීම තුළින් බිඳ වැටෙන්නේ වැඩිහිටියන්ගේ ප්‍රතිරූපයයි.

ළමයාට සමීපව ඔහුට දයාව, කරුණාව දක්වන උදව් කරන හා විශ්වාසවන්ත ව සවන් දෙන ගුරුවරුන් හට දරුවෝ ද හොඳින් සවන් දෙති. ඒ නිසා ම හොඳින් හැසිරෙති. එවැනි ගුරුවරුන් සමග කටයුතු කරන ළමයින් තුළ යහපත් හැසිරීම් රටා ඇති වේ.

"අපේ පන්තියේ මැජික් කන්නාඩියක් තියෙනවා. අපිට තරහා ගියා ම කන්නාඩියෙන් බලන්න කියලා අපේ ගුරුතුමිය අපිට කියලා තියෙනවා. එහෙම වේලාවට අපේ මුහුණ හරිම කැතයි. කළු වෙලා, කට ඇද වෙලා, ඉතින් අපි මැජික් කන්නාඩිය බලලා හිනා වෙනවා. එත කොට අපි ලස්සනට පේනවා. තරහත් නැතිවෙලා යනවා.
අපේ ගුරුතුමියට තරහා ගියා ම, අපි කියනවා ගුරුතුමියටත් කන්නාඩියෙන් බලන්න කියලා, එතකොට ගුරුතුමියත් කන්නාඩිය දිහා බලලා හිනා වෙලා තරහා නිවා ගන්නවා. දැන් අපේ ගුරුතුමිය අපට බනින්නේ, ගහන්නේ නෑ, තරහා ගන්නේ නෑ. ගුරුතුමියට තරහ යන වැඩ අපි කරන්නෙත් නෑ."

ළමා මිතුරු පාසලේ ප්‍රතිජනනාත්මක ඇගයීමට මුල් තැන දෙමු.
දඬුවම බැහැර කරමු.

# හතරවන නිර්ණායකය

ළමා අයිතිවාසිකම් පිළිබඳ ව සමස්ත පාසල් ප්‍රජාව ම දැනුවත් ය. එම අවබෝධය මත පාසලේ ක්‍රියාකාරකම් සිදු කරයි.

★ ළමා අයිතිවාසිකම් හා අන්තර්කරණ අධ්‍යාපන සංකල්පය ආරක්ෂා වීම තුළින් දරුවා සමාජයට ළැදි හා සමාජ සම්මතවලට ගරු කරන පුද්ගලයකු බවට පත් වේ. ළමා අයිතිවාසිකම් තහවුරු නොවීම තුළ දරුවා ගොඩ නැගෙන්නේ මානසික ව පීඩා විඳින හා වැඩුණු පසු සමාජ සම්මතවලට එරෙහිව කටයුතු කරන සමාජ විරෝධියකු ලෙසය. සමාජ සම්මතයන්ට ගරු කරන යහපත් පුද්ගලයකු ලෙස සංවර්ධනය කිරීමට නම් පාසල සහ නිවස ළමා අයිතිවාසිකම් හා අන්තර්කරණ සංකල්පය ආරක්ෂා වන ආකාරයට නිරතුරුව ම කටයුතු කිරීම අවශ්‍ය වේ.

★ අධ්‍යාපන ක්‍රියාවලියේ තෘප්තිමත් ව නිරත වීමට හා එහි සක්‍රීය කොටස්කරුවකු වීමට අවශ්‍ය මානසික සූදානම ළමයෙකුට තිබිය යුතු ය. පංති කාමරය තුළ අඩු පෙළඹීමකින් කටයුතු කරන බොහෝ දරුවන් පිළිබඳ ව කරන ලද අධ්‍යයනවලින් අනාවරණය වන්නේ, ඔවුන්ට දරුවකු ලෙස වැඩීමට අවශ්‍ය මානසික හා භෞතික තත්ත්වවල දුර්වලතා පවතින බව යි. එනිසා ළමා අයිතිවාසිකම් තහවුරු වන තත්ත්වයන් මැද වැඩෙන දරුවා අධ්‍යාපනයේ ඉහළ තලවලට පහසුවෙන් ළඟා වේ. එවැනි පරිසරයක් ළඟා කර දීම වැඩිහිටියන් ගේ වගකීමක් බව අවබෝධ කර ගැනීම හා ඒ සඳහා ක්‍රියාත්මක වීම අවශ්‍ය වේ.

★ රටක ආර්ථික සංවර්ධනය රඳා පවතින ප්‍රධාන සාධකයක් වන්නේ එහි පුරවැසියන්ගේ නීරෝගී බව ය. ළමා අයිතිවාසිකම් තහවුරු වීම තුළ දරුවාට නිවැරදි පෝෂණය හා යහපත් සෞඛ්‍ය පුරුදු ඇති වේ. ඒ තුළින් ජාතික සංවර්ධනයට අවශ්‍ය නීරෝගී සෞඛ්‍යවත් පුද්ගලයන් තැනීම සිදු වේ.

- ★ අද සමාජයේ පවතින ප්‍රබල ගැටලුවක් වන්නේ තමන් සමඟ කටයුතු කරන අන් අයව නිවැරදි හා සාධාරණ විනිශ්චයකට ලක් නොකිරීමයි. ආයතනයක් තුළ මෙවැනි තත්ත්වයක් ඇති වු විට එය විශාල අර්බුදයක් කරා යා හැකි ය. යම් පුද්ගලයකුට මෙවැනි මානසික තත්ත්වයක් ඇති වීමට හේතුව විය හැක්කේ ඔහුගේ ළමා කාලය තුළ තම ගරුත්වය රැක දෙන අන්දමේ විනිශ්චයන්ට ලක් නොවීම විය හැකි ය. එබැවින් දරුවන්ගේ ආත්ම අභිමානය රැකෙන පරිදි කටයුතු කිරීමත්. ඔවුන් නිවැරදි විනිශ්චයන්ට ලක් කිරීමත් සිදු විය යුතු ය. එවැනි තත්ත්වයන් අත් විඳි දරුවන් පසුකාලීන ව අන් අයව නිවැරදි විනිශ්චයන්ට ලක් කිරීමට යොමු වේ.

- ★ ශ්‍රී ලංකාවේ සමාජ ප්‍රචණ්ඩත්වයේ වර්ධනයක් දැක ගත හැකි ය. පුද්ගලයන් මෙවැනි තත්ත්වයන්ට පත්වී ඇත්තේ කුඩා කළ මුහුණ පෑ සිදුවීම් මත බව බොහෝ විට අනාවරණය වේ. විවිධතා සහිත දරුවන්ට සමානව සලකන විවිධත්වයට ගරු කරන පාසලක වැඩෙන දරුවන් නිතැතින් ම විවිධත්වයට ගරු කරන පුරවැසියන් බවට පත්වීම සිදුවේ. එවිට තමන් සමඟ කටයුතු කරන අන් අය සමඟ යහපත් අන්තර් පුද්ගල සබඳතා පවත්වා ගැනීම පහසු වෙයි. මෙය සමාජ ඒකාග්‍රතාවය සඳහා අත්‍යවශ්‍ය දෙයකි. මේ අනුව ළමා අයිතිවාසිකම් රැකෙන පරිසරයක් නිර්මාණය කිරීම තුළ සමාජ ප්‍රචණ්ඩත්වය වැනි ගැටලු බොහෝ දුරට අනාගත සමාජයෙන් තුරන් කිරීමට හැකි වනු ඇත.

රවීෂාට හැමදා ම ගැටලුවක් හැටියට දැනුන දෙයක් අන් අයට දැන්වීමට ඇය පාසලේ යෝජනා පෙට්ටිය කදිම ලෙස උපයෝගි කරගත්තා. පුස්තකාලයේ පොත් රාක්කවල ඉහළ තට්ටුවල තියෙන හොඳ පොත් කවදාවත් කියවන්න බැරි වුණේ ඒවා ගන්න රවීෂාට උස නැති නිසයි. ඇය උසින් ඇති පොත් ගැනීමට පුංචි ඉනිමගක් ඉල්ලලා කොළයක ලියලා පාසලේ යෝජනා පෙට්ටියට දැම්මා. මේ යෝජනාවට ඉහළ ප්‍රතිචාරයක් ලැබුණා. එහි ප්‍රතිඵලයක් ලෙස පුස්තකාලයට පුංචි ඇලුමිනියම් ඉණිමං තුනක් ම ලැබුණා. පාසල දරුවන් ගේ අදහස්වලට කන්දීමට සුදානම් බව පෙන්වීමට ඉතා ම හොඳ ක්‍රමවේදයක් ලෙස යෝජනා පෙට්ටිය ළමා මිතුරු පාසලට හඳුන්වා දිය හැකියි.

- ★ පාසලේ සතුටින් ගත කිරීමට හා මාගේ අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට උදව්වන්න.
- ★ මාගේ වර්ධන අවශ්‍යතාවන් පිළිබඳ ව සැළකිලිමත් වන්න.
- ★ මට ක්‍රීඩා හා විනෝද ජනක කටයුතු සඳහා අවස්ථා ලබා දෙන්න.
- ★ මගේ ඉගෙනීමේ කටයුතු සඳහා සහාය දෙන්න.
- ★ මගේ යහළුවන්ට හැකි අයුරින් උදව් වීමට මා පොළඹවන්න.
- ★ මා වැනි පාසල් යා යුතු වයසේ සිටින පාසල් නොයන දරුවන් පාසලට ගෙන්වා ගැනීමට කටයුතු කරන්න.
- ★ පාසල සම්බන්ධ ව ගනු ලබන තීරණවල දී අපේ අදහස් ද ලබා ගන්න.
- ★ මට ගැළපෙන ආකාරයට ඉගෙනීමට ඉඩ දෙන්න. ඒ සඳහා උදව් කරන්න.

දෙවන පරිච්ඡේදය

# දෙවන මානය
# ස්ත්‍රී පුරුෂ සමාජානුභාවයට ප්‍රතිචාරී වීම

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සියලු ම ළමයින්ට ගැහැනු හා පිරිමි වශයෙන් භේදයකින් තොරව අධ්‍යාපනය සඳහා සම අවස්ථා ලබා දී ඇත. අධ්‍යාපන අමාත්‍යාංශ සංඛ්‍යාලේඛනවලට අනුව සෑම වසරක ම පළමුවන ශ්‍රේණියට ඇතුළත් වන ගැහැණු හා පිරිමි ළමයින්ගේ සංඛ්‍යාව බොහෝ දුරට සමාන වේ. එමෙන් ම ප්‍රාථමික අධ්‍යාපන අවධිය තුළ පාසලේ රැඳී සිටීමේ ප්‍රතිශතය ද ගැහැණු සහ පිරිමි ළමයින් සඳහා බොහො දුරට සමාන වේ. මේ අනුව ප්‍රාථමික අධ්‍යාපන අවධියේ දී අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශ අවස්ථා ගැහැණු සහ පිරිමි යන දෙපාර්ශවයට ම ලැබී ඇති අතර ස්ත්‍රී හා පුරුෂභාවය යන සාධකය මත වෙනස් කොට සැළකීමක් නැත. එසේ ම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ද සියලු ම සිසුන් ක්‍රියාකාරී සහභාගී වීම තුළ ස්ත්‍රී පුරුෂභාවය බලපෑමක් ඇති කරන සාධකයක් වී නොමැත. ළමා මිතුරු පාසලේ මෙම තත්ත්වය වඩාත් හොඳින් පිළිඹිබු වන අතර ගැහැනු හා පිරිමි යන දෙපාර්ශවයට ම ගැළපෙන යටිතල පහසුකම් සපයා දීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත.

## නිර්ණායක

ස්ත්‍රී පුරුෂ සමාජානුභාවයට ප්‍රතිචාරී වන පාසලක තිබිය යුතු යැයි හඳුනාගත් අපේක්ෂිත තත්ත්වයන් පහත සඳහන් කර ඇත. මේවා ළමා මිතුරු පාසල් ආකෘතියෙහි දෙවන මානයට අයත් නිර්ණායක වේ.

- ★ ප්‍රාථමික අධ්‍යාපනය සපුරාලීමට හා ද්විතීයික අධ්‍යාපනයට පිවිසීම සඳහා ගැහැනු හා පිරිමි ළමයින්ට සමාන අවස්ථා ඇත.
- ★ පාසලේ සියලු ම ක්‍රියාකාරකම්වල දී (විෂයමාලාව හා විෂය සමගාමී) ගැහැණු සහ පිරිමි ළමයි සමාන පදනමකින් සහභාගී වෙති.
- ★ පාසලේ භෞතික පහසුකම් ගැහැණු ළමයින්ට හා පිරිමි ළමයින්ට උචිත පරිදි පවතී.

# පළමුවන නිර්ණායකය

ප්‍රාථමික අධ්‍යාපනය සපුරාලීමට හා ද්විතීයික අධ්‍යාපනයට පිවිසීම සඳහා ගැහැණු හා පිරිමි ළමයින්ට සමාන අවස්ථා ඇත.

ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික මට්ටමේ දත්තවලට අනුව සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මෙවැනි තත්ත්වයක් පිළිඹිබු වෙයි. එහෙත් එක් එක් පාසල වශයෙන් මෙම තත්ත්වය ළඟා කරගෙන තිබේ ද යන්න පිළිබඳ ව සැළකිලිමත් විය යුතු ය. ප්‍රාථමික අධ්‍යාපනය අවසන් කරන දරුවන්ට ද්විතීයික අධ්‍යාපනය සඳහා වෙනත් පාසලකට ඇතුළත් වීමට සිදුවන අවස්ථාවල දී එම පාසල ට යාමට ඇති දුර ප්‍රමාණය ගමන් පහසුව ආරක්ෂාව වැනි තීරණාත්මක සාධක බොහෝ ඇත. එම විවිධ වු සාධක හමුවේ දී ගැහැණු දරුවකු වීම නිසා ද්විතීයක පාසලට යැවීම අපහසු ය යන තීරණය මත අධ්‍යාපනය අවසන් කිරීමට සිදුවන අවස්ථා තිබිය හැකි ය. එසේ ම අවාසිදායක සමාජ ආර්ථික තත්ත්වයන් යටතේ දී පිරිමි දරුවෙකුට අඩු වයසක දී ම පවුලේ ආර්ථිකයට උර දීම සඳහා පාසල් අධ්‍යාපනය නවතා දැමීමට සිදුවිය හැකි ය. මෙවැනි තත්ත්වයක් උද්ගත වේ යැයි අනුමාන කළ හැකි දරුවන් හඳුනා ගැනීමත් එම අවදානම් තත්ත්වයන් මග හරවා ගැනීමට දිය හැකි උපරිම සහයෝගය ලබා දීමත් ළමා මිතුරු පාසලෙන් අපේක්ෂා කෙරෙයි.

# දෙවන නිර්ණායකය

පාසලේ සියලු ම ක්‍රියාකාරකම්වල දී (විෂයමාලාව හා විෂය සමගාමී) ගැහැණු සහ පිරිමි ළමයි සමාන පදනමකින් සහභාගී වෙති.

විෂයමාලා ක්‍රියාකාරකම්වලදී සහ විෂය සමගාමී ක්‍රියාකාරකම්වලදී ද ගැහැණු සහ පිරිමි ළමයින් සියලු දෙනාම සහභාගි විය යුතු ය. පිරිමි ළමයින් සඳහා වෙන්වූ ක්‍රියාකාරකම් හෝ ගැහැණු ළමයින් සඳහා වෙන් වු ක්‍රියාකාරකම් ලෙස විශේෂිත ක්‍රියාකාරකම් ප්‍රාථමික අධ්‍යාපන අවධියේ දී ක්‍රියාත්මක නොවේ. ගැහැණු හා පිරිමි ළමයින්ට තමන්ගේ විභව්‍යතා උපරිම ලෙස සංවර්ධනය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාකාරකම් ළමා මිතුරු පාසලක සංවිධානය කර ක්‍රියාත්මක වෙයි.

# තුන්වන නිර්ණායකය

පාසලේ භෞතික පහසුකම් ගැහැණු ළමයින්ට හා පිරිමි ළමයින්ට උචිත පරිදි පවතී.

පාසලක යටිතල පහසුකම් සැපයීමේ දී එම පහසුකම් ගැහැණු සහ පිරිමි යන දෙපාර්ශවයට ම උචිත පරිදි සැපයිය යුතු වේ.

සනීපාරක්ෂක පහසුකම් ගැහැණු ළමයින්ට සහ පිරිමි ළමයින්ට වෙන් වෙන් ව ලබාදිය යුතු වේ. එසේම ක්‍රීඩා භාණ්ඩ සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය උපකරණ වැනි දේ දෙපාර්ශවයට ම ගැළපෙන ලෙස ලබා දීම අවශ්‍ය වේ.

ළමා මිතුරු පාසල සෑම ළමයෙකු පිළිබඳ ව ම සැළකිලිමත් වෙයි. එහි දී ගැහැණු ළමයින් සඳහා මෙන්ම පිරිමි ළමයින් සඳහා ද අවශ්‍ය සියලු තත්ත්වයන් සපයා දීමට ක්‍රියාත්මක වෙයි.



තුන්වන පරිච්ඡේදය

# තුන්වන මානය
# ළමයින්ගේ ඉගෙනුම් ඵල සංවර්ධනය කිරීම

## හැඳින්වීම

සෑම සිසුවකුට ම තම විභවයතාවන් උපරිම ලෙස සංවර්ධනය කර ගැනීමටත් අත්‍යවශ්‍යයෙන් ම ළඟා කරගත යුතු නිපුණතා ළඟා කර දීමටත් අවශ්‍ය පසුබිම සකස් කිරීම සෑම ගුරුවරයකුගේ ම වගකීමකි.

ඒ සඳහා සිසුන්ගේ විවිධත්වය හඳුනා ගෙන ඉගැන්වීමේ ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම බෙහෙවින් ම වැදගත් වේ.

ගුරුවරයා අනුගමනය කරන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිසුන් ඉගෙනුම් ඵල කරා ළඟාවීමට බලපාන තීරණාත්මක සාධකයකි. එබැවින් ශිෂ්‍යයන් හොඳින් හඳුනා ගෙන ඔවුන්ගේ රුචි අරුචිකම් මැනවින් වටහා ගෙන, ඔවුන්ගේ ඉගෙනුම් රටාවන් හඳුනා ගෙන ගුරුවරයා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අවතීර්ණවීම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය කරුණකි.

අධ්‍යාපනයේ ඵලදායිතාව රඳා පවතින්නේ එහි අන්තර්ගතය හා ක්‍රියාවලිය මත ය. ගුණාත්මක අධ්‍යපනය සඳහා පහත සදහන් ක්ෂේත්‍ර පහ ඔස්සේ අන්තර්ගතය හා ක්‍රියාවලිය සකස් විය යුතු ය.

- ★ ඉගෙනුමට ළමයාගේ ඇති කායික හා මානසික සූදානම-පරිසරය, සෞඛ්‍යය හා පෝෂණ තත්ත්වය
- ★ ඉගෙනුම් පරිසරය - ළමයා සතු අත්දැකීම්, නිවෙස් පරිසරය සහ පාසල් පරිසරය
- ★ ඉගෙනුම් අන්තර්ගතය - විෂයමාලාව, පෙළපොත්, අනිකුත් මූලාශ්‍ර සහ ඉගෙනුම් සම්පත්
- ★ ඉගෙනුම් ක්‍රියාවලිය - ප්‍රවීණ ගුරුවරු, ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලිය
- ★ ඉගෙනුම් නිපුණතා - සාධන මට්ටම්, අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සහ අභිමත ඉගෙනුම් නිපුණතා නිවරැදි තක්සේරුව

# ගුණාත්මක අධ්‍යාපනයක් ලැබීම ළමා අයිතිවාසිකමකි.

ළමා මිතුරු පාසලක සියලු ම සිසුන්ගේ විභවයතාව උපරිම ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය පරිසරය හා පහසුකම් සැලසීම සිදුවිය යුතු ය.

ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය කරා ළඟා වීමේ දී සිසුන්ගේ ප්‍රාප්ති මට්ටම්වල විවිධත්වය හඳුනා ගැනීම වැදගත් ය. තුන්වන මානයෙන් අවධානය යොමු කරනුයේ සිසුන්ගේ ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනයටයි. මෙම තත්ත්වය ළඟා කර ගැනීම සඳහා පහත සඳහන් සංකල්ප පිළිබඳ ව නිවැරැදි අවබෝධය හා අවධානය යොමු වීම ළමා මිතුරු පාසලක සියලු ම පාර්ශවයන්ගෙන් අපේක්ෂා කෙරෙයි.

## නිපුණතාව

නිපුණතාවක් යනු දැනුම කුසලතා ආකල්ප හා භාවිතයන්ගේ සංකලනයකි. නිපුණතාවක් කරා ළඟාවීම දීර්ඝකාලීන ක්‍රියාවලියකි. ළමයින්ගේ වර්ධන අවධීන්ට ගැළපෙන කෙටි කාලීන ව ළඟා විය හැකි නිපුණතා මට්ටම් හඳුනාගත හැකි ය. එම නිපුණතා මට්ටම් කරා ළඟාවීම සඳහා සිසුන්ට අවශ්‍ය ඉගෙනුම් පරිසරය නිර්මාණය කිරීම ගුරුවරයාගේ වගකීමයි.

## අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා

ප්‍රාථමික අවධියේ දී සෑම සිසුවෙකු ම ඊළඟ ප්‍රධාන අවධිය ආරම්භ කිරීමට අත්‍යවශ්‍යයෙන් ම අත්පත් කර ගෙන තිබිය යුතු නිපුණතා මට්ටම් සමූහය අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ලෙස හඳුන්වයි. පළමු ප්‍රධාන අවධිය අවසානයේ දී අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා 40 ක් ද, දෙවන ප්‍රධාන අවධිය අවසානයේ දී අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා 52 ක් ද තුන්වන ප්‍රධාන අවධිය අවසානයේ දී අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා 55 ක් ද විෂය මාලා සම්පාදකයින් විසින් හඳුන්වා දී ඇත.

## අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා තහවුරු කිරීම

එක් එක් ප්‍රධාන අවධිය අවසානයේ දී සියලු ම සිසුන් සෑම අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවයක ම ප්‍රවීණතාවයට ළඟා කරවීමට අවශ්‍ය කටයුතු කිරීම එක් එක් ප්‍රධාන අවධිය භාරව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නියැලෙන සෑම ප්‍රාථමික අධ්‍යාපන ගුරුවරයෙකුගේ ම වගකීමකි.
ශිෂ්‍යයා එක් ක්‍රියාකාරකමක් හෝ එක් අභ්‍යාසයක් නිම කළ පමණින් ම එයට අදාළ නිපුණතාවයෙහි ප්‍රවීණතාවයට පත් වුවේ යැයි නිගමනය කිරීම අසීරු ය. එහි දී විය යුත්තේ ක්‍රියාකාරකම් හෝ අභ්‍යාස මඟින් අදාළ නිපුණතාව පිළිබඳ විවිධ පැතිකඩ ඔස්සේ සිය හැකියා වර්ධනය කර ගැනීමට ශිෂ්‍යයාට ඉඩකඩ සලසා දීම තුළින් එම නිපුණතාවෙහි ප්‍රවීණතාවට පත් වීම තහවුරු කර ගැනීම ය.



## නිර්ණායක

සිසුන් ගේ ඉගෙනුම් ඵල සංවර්ධනය වීම යන තුන්වන මානය යටතේ තිබිය යුතු යැයි හඳුනාගත් අපේක්ෂිත තත්ත්වයන් පහත සඳහන් කර ඇත. මේවා ළමා මිතුරු පාසලක තුන්වන මානයට අයත් නිර්ණායක ලෙස සැළකෙයි.

1. ඉගෙනුමට සහාය වීම සඳහා මානව සම්පත් හා පන්ති කාමර පහසුකම් ප්‍රමාණවත් ව ඇත.
2. පන්ති කාමර වාතාවරණය අන්තර්කරණය වේ. ආතතියෙන් තොර වේ. ප්‍රජාතන්ත්‍රවාදී වේ. ඉගෙනුමට යෝග්‍ය වේ.
3. දේශීය පරිසරය සංස්කෘතිය පිළිබඳ ව දැනුම ලබා දීම සඳහා පාසල් විෂය මාලාව සුදුසු සේ අනුවර්තනය කර ඇත.
4. සපයන ලද අවස්ථා තුළින් හා ස්වයං පෙළඹවීමෙන් ගුරුවරුන් තම හැකියා අඛණ්ඩ ව වර්ධනය කර ගනියි.
5. ඉගැන්වීමේ දී ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රමවේද භාවිත කෙරෙයි.
6. අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ක්‍රමානුකූල ව තක්සේරු කෙරෙයි. සියලු ම සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවල ප්‍රවීණතාවට පත් කිරීම සඳහා ඵලදායි ක්‍රියා මාර්ග ගනු ලැබේ.

# පළමුවන නිර්ණායකය

ඉගෙනුමට සහාය වීම සඳහා මානව සම්පත් හා පන්ති කාමර පහසුකම් ප්‍රමාණවත් ව ඇත.

ප්‍රාථමික පන්ති කාමරය තුළ ලබන ඉගෙනුම් අත්දැකීම් සෑම විෂයයක ම සංකල්ප සාධනයට අවශ්‍ය මූලික පදනම ලබා දෙයි. මෙම පදනම ස්ථාවර පදනමක් වන්නේ ගුරුවරයා සංකල්ප පිළිබඳ ව මනා අවබෝධයකින් හා නිවැරදි වැටහීමකින් යුක්තව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදීමෙන් පමණකි. සිසුන්ගේ විවිධත්වය හා ඔවුන් පසුවන අවධීන් හඳුනාගෙන උචිත ඉගෙනුම් ක්‍රමවේද සකස් කර ගැනීමට නම් ගුරුවරයාගේ වෘත්තීය නිපුණතාව වැදගත් වේ. එය ගුණාත්මක ප්‍රාථමික අධ්‍යාපනයක් සඳහා වන තීරණාත්මක සාධකයකි.

ළමා මිතුරු පාසලක ප්‍රාථමික අධ්‍යාපන අවධියේ ඉගෙනුම් - ඉගැන්වීමේ ක්‍රියාවලියෙහි නිරත වන සියලු ම ගුරුවරුන් ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ව මනා පුහුණුවක් හා පරිචයකින් යුක්ත වීම අපේක්ෂා කෙරෙයි. සිසුන් අපේක්ෂිත ඉගෙනුම් ඵල කරා ළඟා කරවීමට ගුරුවරයා දිනපතා පාසලට පැමිණීමත් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ ඵලදායි ලෙස නිරත වීමත් අත්‍යවශ්‍ය වේ.

ඉගෙනුම් - ඉගැන්වීමේ ක්‍රියාවලිය නිසි පරිදි සිදුකිරීම සඳහා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය වී තිබීම වඩාත් වැදගත් වේ. 1998 හඳුන්වා දුන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් පාසලක ප්‍රාථමික අධ්‍යාපන අංශයේ තිබිය යුතු ප්‍රතිමානයන් පාසල් විෂය මාලාවේ අන්තර්ගත කොට ඇත.


ප්‍රාථමික ගුරුවරියක් ලෙස වසර කිහිපයක පළපුරුද්දක් ඇති ඉනෝකා බොහෝ විට මුහුණ දුන් ගැටලුවක් වූයේ තම පන්තියේ සිසුන් සියලු දෙනාට ම එකම පාඩම ක්‍රියාත්මක කරන නමුත් අපේක්ෂිත ඉගෙනුම් නිපුණතා මට්ටම් කරා ළඟා වන්නේ සිසුන් යම් ප්‍රමාණයක් පමණක් වීමයි. සිසුන් සෑම දෙනා ම එකම මට්ටමට ළඟා කර ගැනීමේ දුෂ්කරතාවයයි. මේ වනවිට 3 වන ශ්‍රේණියේ ගුරුවරියක ලෙස කටයුතු කළ ඉනෝකාට ඇයගේ පන්තියේ ඉගෙන ගන්නා ධනුෂ්ක සහ රොෂාන්ගේ පැමිණීමේ දුර්වලතාව ද විශාල ගැටලුවකි.

ඔවුන්ට පන්තියේ අනිත් සිසුන් සමග එකට වැඩ කිරීම බොහෝ දුරට අපහසු වී ඇත. විවිධ හේතූන් නිසා මෙවැනි ඉගෙනුම් දුෂ්කරතා ඇති සිසුන් කිහිපදෙනා ඇයට දැනුනේ තම රාජකාරිය නිසි පරිදි ඉටු කිරීමට පවතින බාධක ලෙසයි. මේ අතර ඉනෝකාට ගුරු පුහුණුවකට කැඳවීමක් ලැබුණි. එහි දී විවිධ නිපුණතා මට්ටම්වල සිටින සිසුන්ට ගැළපෙන පරිදි එකම පාඩමක් තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් සකස් කිරීම පිළිබඳ ව පුහුණු වීමට ඇයට අවස්ථාව හිමි විය. ඇයගේ සිහියට නැගුනේ ධනුෂ්ක හා රොෂාන් ඇතුළු තම පන්තියේ පසුබට සිසුන් කණ්ඩායමයි.

ඔවුන් සිටින්නේ ද විවිධ දක්ෂතා මට්ටම්වල බව ඇයට සිහිපත් විය. විවිධත්වයන්ට ගැළපෙන පරිදි පාඩමක් සාර්ථක ව සකස් කිරීමට වැඩමුළුවේ දී ඉනෝකාට හැකි විය.

දැන් ඇය බොහෝ පාඩම්වලට අදාළ ව බහුතල ඉගෙනුම් ක්‍රමවේද ක්‍රියාත්මක කරයි. එකම පාඩම සඳහා විවිධ මට්ටම්වල ක්‍රියාකාරකම් සකස් කර ඇත. විවිධ ඉගෙනුම් උපකරණ භාවිත කරමින් සිසුන්ට සංයුක්ත චින්තන අවධියේ සිට වියුක්ත චින්තන අවධිය දක්වා සංකල්ප වර්ධනය සඳහා උදව් කරයි. සිසුන් සියලු දෙනා ම පහසුවෙන් පන්ති කාමර ක්‍රියාකාරකම්වලට අනුගත වී ඇත.

සෑම සිසුවෙක් ම තමාගේ හැකියාවන් අනුව අදාළ ඉගෙනුම් නිපුණතා මට්ටම්වලට ළඟාවෙමින් සිටියි. ඉගෙනුම් ඵලයන් කරා ළඟා කරවීම සඳහා එක් එක් දරුවාට ගැළපෙන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම මිස එකම ක්‍රමවේදයක් තුළින් සියලු දෙනාම ඉගෙනුමට අනුගත කර ගැනීම කළ නොහැකි බව ඉනෝකා වටහාගෙන ඇත. ඒ නිසා ම ධනුෂ්ක හා රොෂාන් මෙන් ම අනෙකුත් කිසිම සිසුවකු ඉගෙනුම් ක්‍රියාවලියෙන් මග හැරී නැත. සිසුන් අතර සංසන්දනයක් වැදගත් නොවන බව දැන් ඉනෝකා තේරුම් ගෙන ඇත. සෑම දරුවෙකුට ම ඉගෙනුම කළ හැකි ය යන විශ්වාසය ඉනෝකා තුළ මෙන්ම සියලු ම සිසුන් තුළ ද ගොඩ නැගී ඇත.



# දෙවන නිර්ණායකය

පන්ති කාමර වාතාවරණය අන්තර්කරණය වේ. ආතතියෙන් තොර වේ.
ප්‍රජාතන්ත්‍රවාදී වේ. ඉගෙනුමට යෝග්‍ය වේ.

ස්ත්‍රී පුරුෂ භාවය සමාජ ආර්ථික පසුබිම කායික හා මානසික විවිධතා විවිධ ඉගෙනුම් හැකියා ආදිය නොසලකා සියලු ම ශිෂ්‍යයින්ට එක හා සමාන ව සැළකීම ළමා මිතුරු පාසලක තිබිය යුතු ගුණාංගයකි.

එනම් පන්ති කාමරයේ සුරක්ෂිත වූ දරුවන් මිස ප්‍රතික්ෂේප වූ දරුවන් නොසිටිය යුතු ය.

ළමා මිතුරු පාසලේ ගුරුවරයා සිසුන් ඉදිරිපත් කරන අදහස්වලට ක්‍රියාකාරී ලෙස සවන් දෙන්නෙකු මෙන් ම ප්‍රතිජනනාත්මක ව සන්නිවේදනය කරන්නෙකු ද වීම ප්‍රජාත්‍රන්ත්‍රවාදි ඉගෙනුම් වාතාවරණයක් සඳහා හේතු වේ. සිසුන් ඉදිරිපත් කරන අදහස්වලට ගුරුවරයා ඉතා ඕනෑකමින් සවන් දිය යුතු ය.

මෙසේ ගුරුවරයා හා ශිෂ්‍යයා අතර ගොඩ නැගෙන සක්‍රීය සමීප සම්බන්ධතාව සිසු සංවර්ධනයෙහිලා ඉතා වැදගත් වන සාධකයකි.

බොහෝ විට ශිෂ්‍යයෝ ගුරුවරුන් ආදර්ශයට ගනිමින් කටයුතු කරති. එසේම මේ සමීප සම්බන්ධතාව සිසුන් තුළ ඉගෙනුමට පෙළඹවීමක් ඇති කිරීමට ද සමත් වේ.



## ප්‍රතිජනාත්මක සන්නිවේදනය

**චර්යාව හෝ අවස්ථාව හෝ විස්තර කරන්න**

ඔක්කොම අය පොත්වලට පිටකවර දාලා නේද? බලන්න කොච්චර ලස්සන ද කියලා.

**ප්‍රතිජනාත්මකව උපදෙස් දෙන්න**

හොඳ දරුවෝ වගේ ශාලාව ඇතුළේ සෙමින් නිශ්ශබ්දව ගමන් කරන්න.

**දිරි ගැන්වීම් කරන්න**

1-6 දක්වා ගණිත ගැටලු ඔක්කොම හරියට ම හදලා ඉවරයිනේ නේ ද? බොහොම හොඳයි. දැන් 7-9 ගැටලු විසඳන්න.

**සුවිශේෂී කාර්යයන් ප්‍රශංසාවට ලක් කරන්න.**

චිත්‍රයට යොදලා තියෙන විවිධ වර්ණ නිසා ඇත්තෙන් ම චිත්‍රය ප්‍රාණවත් වෙලා.

විවෘත ශාලාවේ පන්ති කිහිපයක් පැවැත්වීමේ දුෂ්කරතාව පිළිබඳ ව ගුරුභවතුන් නිතර නිතර නගන මැසිවිලි හේතුවෙන් තාවකාලික පන්ති කාමර වෙන් කිරීමක් සඳහා වැඩපිළිවෙළක් විදුහල්පතිවරයා විසින් සැලසුම් කරන ලදී. ඒ සඳහා දායකත්වය ලබා ගැනීමට කිහිපවරක් ම දෙමාපියන්ට පණිවුඩ යැවූ මුත් එය සාර්ථක නොවී ය. සිසුන් පාසල් ප්‍රජාව හා ගුරු මණ්ඩලය සහභාගී වීමෙන් සිදු කළ පාසල් තක්සේරුකරණය හා සංවර්ධන සැලැස්ම සැකසීමේ දී ඇති වූ සංවාදයක් පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| **බාහිර සුසාධ්‍යකාරක** | - | මෙම ශාලාවේ පැවැත්වෙන පන්තියක ඉගෙන ගන්නා දරුවෙකු කරුණාකර නැගිටින්න. **(ශිෂ්‍යාවක් නැගී සිටියි)** |
| **බාහිර සුසාධ්‍යකාරක** | - | දුව ඉගෙන ගන්නේ මොන පන්තියේ ද? |
| **ශිෂ්‍යාව** | - | හතරවන ශ්‍රේණියේ |
| **බාහිර සුසාධ්‍යකාරක** | - | අපි හිතමු ඔයාලා ලස්සන චිත්‍රයක් ඇඳලා පන්තියේ ඒවා එල්ලන්න හදනවා කියලා මොකක් ද තියෙන ලොකුම ගැටලුව? |
| **ශිෂ්‍යාව** | - | අපිට ඒවා එල්ලන්න පන්තියක් නෑ |
| **බාහිර සුසාධ්‍යකාරක** | - | ඇයි ඔයගොල්ලෝ ඉගෙන ගන්න පන්තිය |
| **ශිෂ්‍යාව** | - | ඒක අපිට විතරක් නෙමෙයි එහා පන්තියටත් අයිතියි. අපි කැමතියි අපිට වෙනම පන්ති කාමරයක් තිබුණානම් |
| **තවත් ශිෂ්‍යාවක් නැගී සටියි** | - | අපිට වෙනම පන්තිකාමරයක් තිබුණා නම් එහා පන්තියේ ඝෝෂාව ඇහෙන්නෙත් නෑ. අපිට පන්තියේ කවුරු හරි බැන්නොත් ඒක එහා පන්තියේ ළමයි දකින්නෙත් නෑ |
| **පළමු ශිෂ්‍යාව** | - | අපේ පන්තිය ලස්සනට තියා ගන්නත් පුළුවන් |

**මේ පිළිතුරු වලින් රැස්ව සිටි සියලු දෙනා ම පුදුමයට පත් කරවූ අතර පන්ති කාමර වෙන් කිරීම තුළින් ළමයින්ට අභිමානය රැකෙන අයුරින් ඉගෙනීමට ඉඩ ප්‍රස්ථාව ඇති වන බව වටහා ගත් දෙමාපියෝ ඉතා කඩිනමින් පන්ති කාමර වෙන් කිරීමට දායක වීමට තීරණය කළහ.**

# තුන්වන නිර්ණායකය

දේශීය පරිසරය සංස්කෘතිය පිළිබඳ ව දැනුම ලබා දීම සඳහා පාසල් විෂයමාලාව සුදුසු ලෙස අනුවර්තනය කර ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාව ජාතික මට්ටමින් සම්පාදනය වුව ද එයට ප්‍රාදේශීය සංස්කෘතිය හා දැනුම ඇතුළත් කරගැනීම සඳහා විෂය මාලාව සුදුසු පරිදි අනුවර්තනය කරගැනීමට ඉඩ ප්‍රස්ථා සලසා දී ඇත. තම පරිසරය ඇසුරෙන් යොදා ගන්නා සංයුක්ත අත්දැකීම් නිසා සිසුන්ට සංකල්ප සාධනය වඩා පහසු වේ. එසේ ම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් තම වටපිටාව සමඟ බද්ධ කර ගැනීම මගින් අධ්‍යාපනයේ එක් පරමාර්ථයක් වන සංස්කෘතිය පවරාදීමට මෙන් ම දේශීය අනන්‍යතාව රැකගැනීමට ද පිටුවහලක් වේ.

**දේශීය සංස්කෘතිය හා දැනුම පාසල් විෂය මාලාවට එක් කර ගැනිමේ ක්‍රියා මාර්ග පිළිබඳ විද්වත් සාකච්ඡාවක දී මතු වූ අදහස් කිහිපයක් පහත දැක්වේ.**

- ප්‍රදේශයේ ජීවත් වන විවිධ නිර්මාණාත්මක කුසලතා හා පාරම්පරික දැනුම සහිත පුද්ගලයන්ගේ නාමාවලියක් හා ඔවුන්ගෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ගත හැකි සහයෝගය පිළිබඳ ව ලේඛනයක් සකස් කිරීම.
- සැම විටම ප්‍රදේශයේ සම්පත්වලට වටිනාකමක් ලැබෙන පරිදි ඉගෙනුම් ක්‍රියාකාරකම් සකස් කිරීම.
- ආගම් එසේ ම විවිධ වෘත්තීන් හා බැඳුනු සංස්කෘතීන්ට ගැළපෙන සේ ක්‍රියාකාරකම් සකස් කිරීම.
- ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජිත ස්ථාන වෙනුවට පාසල් සජීව පරිසරයේ ඇති ස්ථාන යොදා ගැනීම. (කර්මාන්ත ශාලා ඓතිහාසික වැදගත් ස්ථාන ආදිය)
- ප්‍රාදේශීය වශයෙන් වැඩි වටිනාකමකින් යුතු ජන ගී, ජන ප්‍රවාද සහ ජන ක්‍රීඩා ආදිය යොදා ගැනීම.
- ප්‍රාදේශීය වශයෙන් භාවිත වන භාෂා ව්‍යවහාර යොදා ගැනීම.


# හතරවන නිර්ණායකය

සපයන ලද අවස්ථා තුළින් හා ස්වයං පෙළඹවීමෙන් ගුරුවරු තම හැකියා අඛණ්ඩ ව වර්ධනය කර ගනිති.

ගුරුවරයා යනු නිරන්තරයෙන් වෙනස් වන ලෝකයත් සමඟ නව අත් දැකීම් ලබමින්, එම අත් දැකීම් සිසුන් වෙත සම්ප්‍රේෂණය කරනු ලබන සජීවී පුද්ගලයෙකි.

ළමා මිතුරු පාසලක ගුරුවරු නිරතුරුවම නව අත්දැකීම් ලබා ගැනීමට යුහුසුළු වෙති.

පාසලේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ලබන අත්දැකීම් ගැටලු ආදියට විසඳුම් සෙවීම සඳහා ඔවුහු පර්යේෂකයින් ලෙස කටයුතු කරති. මෙහිදී කාර්යමූලික පර්යේෂණ වැනි ක්‍රමවේද මඟින් තම වෘත්තීකභාවය වඩාත් සංවර්ධනය කර ගැනීමට පෙළඹෙති.



නාලිකා කුඩා පාසලක ගුරු මහත්මියකි. මෙම පාසලේ සිටින මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 27කි. ඇය හැරුණු විට එම පාසලේ සේවය කළේ විදුහල්පතිනිය හා තවත් එක ගුරුවරියක පමණි. නාලිකාට භාර වුයේ 1, 2 හා 3 වන ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුන් 11 දෙනෙකුට ඉගැන්වීමයි. විෂයමාලාව අනුව බහු ශ්‍රේණි ලෙස තම ඉගෙනුම්-ඉගැන්වීම් සංවිධානය කර ගැනීමට ඇයට සිදු විය. මීට අමතර ව තවදුරටත් කළ යුතු කාර්යයන් බොහෝමයක් තිබෙන බව නාලිකාට පසක් විය.

කාර්ය මූලික පර්යේෂණ පිළිබඳ ව තමා තුළ ඇති දැනුම ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමට සුදුසු පරිසරයක් මෙම කුඩා පාසලෙහි ඇති බව අවබෝධ කර ගත් නාලිකා තුන්වන ශ්‍රේණියේ සිටි සිසුන් තිදෙනාගේ ලිවීමේ කුසලතා වර්ධනය කිරීම ඇයගේ කාර්ය මූලික පර්යේෂණ තේමාව කර ගත්තා ය. මෙම සිසුන් තිදෙනාගේ ම අත් අකුරු ඉතා දුර්වල මට්ටමක තිබුණි. පළමු ව පිල්ලම් රහිත අකුරු නිවැරැදි ව හා ලස්සනට ලිවීමට සිසුන් තිදෙනා ම යොමුකර නොකඩවා ඒවායේ තත්ත්වය පරීක්ෂා කරමින් හොඳ මට්ටමකට ගෙන ඒමට ඇය සමත් වුවා ය. දෙවනුව පිල්ලම් සහිත අකුරු ඇතුළත් වචන ද ඉන්පසුව පිටපත් ලිවීම ද අනතුරුව අසා ලිවීම දක්වා අදාළ නිපුණතාව කරා ළඟා වන තුරු ඔවුනට උදව් කිරීම නොකඩවා කරන ලදී. දැන් සිසුන් තිදෙනාගේ ම අත් අකුරු නිවැරැදි ය. එමෙන් ම පියකරු ය. මෙම සාර්ථකත්වය තුළ නාලිකා තවදුරටත් මෙම සිසුන්ගේ නිර්මාණාත්මක ලිවීමේ කුසලතා වර්ධනය කිරීමට ද පෙළඹුන අතර සිසුන්ට ද අකුරු ලිවීම ප්‍රීතිජනක අත්දැකීමක් බවට පත්විය.

කලාප අධ්‍යාපන කාර්යාලය මගින් සංවිධානය කළ ගුරු තත්ත්ව කවයක දී ඇයට සිය අත්දැකීම් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබුණි. තමා අනුගමනය කළ ක්‍රියාපිළිවෙළ අනුපිළිවෙළින් ඉදිරිපත් කළ නාලිකාට සිය ප්‍රයත්නයන් සහ ප්‍රතිඵල දැඩි ආත්ම විශ්වාසයකින් යුතුව ඉදිරිපත් කිරීමට හැකි වුයේ ඒ පිළිබඳ අඛණ්ඩ ව පවත්වාගෙන ආ ප්‍රත්‍යවේක්ෂණ වාර්තා උපකාරී කර ගැනීමෙනි. එහි දී ඇයට ලැබුණු පැසසුම්වලට වඩා නාලිකා සතුටු වුයේ තවත් සහෝදර ගුරු පිරිසක් මෙවැනි දේ සඳහා උනන්දු කරවීමට අවස්ථාවක් ලැබීම ගැනයි. සිසුන්ගේ නිපුණතා නංවාලීමට අලුත් විදියක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම නිසා තම වෘත්තීකභාවයේ සාර්ථකත්වය තහවුරු වූ බවත් එය තම ගුරු ජීවිතයේ වාසනාවන්ත සිදුවීමක් බවත් ඇය සිය ඉදිරිපත් කිරීම අවසානයේ දී පැවසුවා ය.

# පස්වන නිර්ණායකය

## ඉගැන්වීමේ දී ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රමවේද භාවිත කරයි

ළමා මිතුරු පාසලෙහි ප්‍රධාන ම ලක්ෂණයක් වන ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම ක්‍රියාත්මක වීම මගින් සෑම ශිෂ්‍යයෙකුට ම සක්‍රීය ව සහභාගී විය හැකි සාර්ථක ඉගෙනුම් වාතාවරණයක් නිර්මාණය වී ඇත.

මේ හේතුවෙන් ස්වයං ඉගෙනුම සඳහා ද සිසුන් පෙළඹී ඇත. ස්වයං ඉගෙනුම ස්වයං අභිමානය වැනි තත්ත්වයන් නිසා පූර්ණ පෞරුෂ වර්ධනයක් සඳහා සුදුසු අඩිතාලමක් සෑම සිසුවෙකු තුළ ම ප්‍රදර්ශනය වේ.

ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් සඳහා යොදා ගත හැකි ක්‍රමවේද කිහිපයක් පහත දක්වා ඇත.

- චරිතාපදාන අධ්‍යයන හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්
- නාට්‍ය හා භූමිකා රංගන
- කණ්ඩායම් අතර කෙරෙන විවාද
- තරග
- ක්‍රීඩා
- ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්
- සම වයස් ඉගෙනුම් අවස්ථා
- පළමුවන ප්‍රධාන අවධිය සහ 6 වන ශ්‍රේණියේ සිසුන් අතර අන්තර් සබඳතා
- බුද්ධි කලම්බන වැඩසටහන්
- ක්ෂේත්‍ර චාරිකා
- ව්‍යාපෘති
- අත්හදා බැලීම්
- සෞන්දර්ය ක්‍රියාකාරකම්
- නිරීක්ෂණ, ගවේෂණ, පරීක්ෂණ සඳහා අවස්ථා

## හයවන නිර්ණායකය

අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ක්‍රමානුකූල ව තක්සේරු කරයි. සියලු ම ළමයින් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවල ප්‍රවීණතාවට පත් කිරීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගනු ලැබේ.

ප්‍රාථමික අධ්‍යාපනයේ දී එක් ප්‍රධාන අවධියක සිට ඊළඟ ප්‍රධාන අවධිය කරා පිවිසෙන විට සියලු ම සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවල ප්‍රවීණතාවට ළඟා වී සිටීම අපේක්ෂා කරයි.

ප්‍රවීණතාවට පත් වීම තහවුරු කර ගැනීම සඳහා එක් එක් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාව පිළිබඳ ව විවිධ පැතිකඩ යටතේ තක්සේරුකරණය සිදු කිරීම ගුරුවරයාගේ වගකීම වේ.

පහත සඳහන් වන්නේ මේ සඳහා නිදසුනකි. අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාව-සරල වැකියක් නිවැරදි උක්ත අඛ්‍යාත සම්බන්ධය ඇති ව ලියයි.

එයට එක් ළමයකු දුන් පිළිතුරක් පහත දැක්වේ.

1. ගොවියා කුඹුරු කොටයි.
2. ගොවියෝ කුඹුරු කොටති.
3. ගොවියෝ කුඹුරු කෙටුවෝ ය.


ඉහත දක්වා ඇති වගන්ති තුන නිවැරදි ව ලියූ පමණින් ම මෙම සිසුවා උක්ත ආඛ්‍යාත සම්බන්ධය පිළිබඳ ව ප්‍රවීණත්වයට ළඟා වූයේ යැයි නිගමනය කිරීම උචිත නොවේ.

ශිෂ්‍යයා වගන්ති ලිවීම ආරම්භ කිරීමේ අවස්ථාවේ සිට ම ගුරුවරයා විසින් අඛණ්ඩ ව අවිධිමත් ව කරනු ලබන තක්සේරු කිරීම තුළින් ශිෂ්‍යයා පිළිබඳ ව ඇති කරගන්නා අවබෝධය ඉතාම වැදගත් ය.

ප්‍රවීණත්වය තහවුරු කර ගැනීම සඳහා විවිධ ක්‍රමවේද උපයෝගී කර ගනිමින් සරල වගන්ති ලිවීමේ පරිසරයක් පන්ති කාමරය තුළ ඇති කළ යුතු ය.

පහත දක්වා ඇත්තේ එය කළ හැකි විවිධ ක්‍රම කිහිපයක් පමණි.

මෙවැනි විවිධ ක්‍රම භාවිත කිරීම තුළින් මව්බස විෂයයට අදාළ කාල භේදය, ලිංග භේදය, ප්‍රාණවාචී - අප්‍රාණවාචී ආදී නිවැරදි ව භාෂා හැසිරවීමේ නිපුණතාවයේ ප්‍රවීණත්වයට ළඟා වේ යැයි අපේක්ෂා කළ හැකි ය.




මෙවැනි විවිධ පැතිකඩ ඔස්සේ සිසුන් ගේ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා තක්සේරු කිරීමෙන් පසු ප්‍රවීණතාව පිළිබඳ ව තීරණ ගත යුතු වේ.

ළමා මිතුරු පාසලක සියලු ම සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවල ප්‍රවීණතාවට පත්වීම කෙරෙහි ගුරුවරු සැළකිලිමත් වෙති. එක් ප්‍රධාන අවධියක අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවල ප්‍රවීණතාවට පත්වීම යනු එම සිසුන් ඊළඟ ප්‍රධාන අවධියේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය මූලික මට්ටමට ළඟා වී ඇති බවයි. ඒ අනුව ළමා මිතුරු පාසල සෑම අවස්ථාවක දී ම එක් ප්‍රධාන අවධියක ඉගෙනුම ලබන සියලු ම සිසුන් නිවරැදි තක්සේරුකරණය මඟින් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවල ප්‍රවීණතාවට පත්වීම තහවුරු කිරීමේ කාර්යභාර්යය ඉටු කරනු ලැබේ.

නව විදුහල්පතිවරයා ගේ දේශනයෙන් පසු පාසලේ වෙනසක් කිරීමේ අධිෂ්ඨානයෙන් යුතු ව තම වගකීම් කෙරෙහි පැහැදිළි මනසකින් සිතා බැලූ ශංකර් ගුරු මහතා තම පන්තියේ සිටින සිසුන් තිදෙනාගේ ම ඉගෙනුම් මට්ටම නංවාලීම තම වගකීම බව නිතර ම සිහිපත් කළේ ය. පසුගිය වසර දෙක තුළ තමා විසින් පළමුවන හා දෙවන ශ්‍රේණි අවසන් කර තුන්වන ශ්‍රේණියට බාර දුන් සිසුන් අට දෙනාගෙන් යම් තරමකට හෝ සතුටුදායක තත්ත්වයක සිටියේ සිසුන් දෙදෙනෙක් පමණක් බව ද වරින් වර ශංකර්ගේ මතකයට නැගුණි. වසරින් වසර ම පාසලේ සිසුන් අඩුවීම සිසුන්ගේ හා දෙමාපියන්ගේ වරදක් ලෙස සිතීම සාධාරණ නොවන බව ද තමා ද ඇතුළු ව පාසල ද එම තත්ත්වයට වගකිව යුතු බව පසක් වන විට ඔහුට පසුතැවිල්ලක් ඇතිවිය.

කෙසේ නමුත් දැන් තමාගේ වගකීම මෙම සිසුන් තිදෙනා ම ඉගෙනුම් ක්‍රියාවලියට එක් කර ගැනීම බවත් කෙසේ හෝ සුදුසු ඉගෙනුම් ක්‍රමවේද මගින් තිදෙනා ම අත්‍යවශ්‍ය නිපුණතාවල ප්‍රවීණතාවට හා අභිමත ඉගෙනුම් නිපුණතා කරා ළඟා කරවීම බවත් ශංකර් අවබෝධ කර ගත්තේ ය. වසර දෙකක අත්දැකීම් සහිත නවක උපාධිධාරී ගුරුවරයකු වන තමා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ව බොහෝ දෑ ඉගෙන ගත යුතු බව සිතූ ශංකර් ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ව මනා දැනුමක් සහිත නව විදුහල්පතිවරයා සමග සහෝදර ගුරු මහත්මීන් තිදෙනා ම එකතු කර ගෙන පාසලේ වෙනසක් කිරීමට දැඩි උත්සාහයක් ගැනීමට සිතා ගත්තේ ය.

හතරවන පරිච්ඡේදය

# හතරවන මානය
# ළමයින් ගේ සෞඛ්‍යය, ආරක්ෂාව හා රැකවරණය තහවුරු කිරීම

## හැඳින්වීම

සෞඛ්‍ය යනු හුදෙක් ලෙඩරෝගවලින් හා දුබලතාවලින් තොරවීම පමණක් නොව පුද්ගලයෙකුට ආර්ථික හා සාමාජයීය වශයෙන් ඵලදායීව ජීවත් වීමට අවශ්‍ය වන්නා වූ කායික, මානසික, සමාජයීය හා අධ්‍යාත්මික යහපැවැත්ම නිසි පරිදි පවත්වා ගෙන යාමයි.

මෙහි දී සෞඛ්‍යයට බලපාන අහිතකර සාධක අවම කර හිතකර සාධක සංවර්ධනයට උපකාර කිරීම සෞඛ්‍ය සුරක්ෂිතතාවයි. ආරක්ෂාකාරී පරිසරය යනු හිංසනයෙන් තොර අනතුරුදායක ස්ථාන නොමැති ප්‍රමාණවත් ආලෝකය හා වාතාශ්‍රය සහිත ප්‍රියජනක පරිසරයකි.

ශ්‍රී ලංකාවේ ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය වන්නේ රෝග වළක්වා ගැනීම හා සෞඛ්‍ය ප්‍රවර්ධනය තුළින් ආයු අපේක්ෂණය හා ජීවිතයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමයි. මේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී විශේෂ අවධානයක් පාසල් කෙරෙහි යොමු වෙයි. එහෙයින් ළමා මිතුරු පාසල එහි භෞතික පරිසරය තුළින් මෙන් ම මානසික හා සාමාජයීය වශයෙන් ද ළමයාට ආරක්ෂිත ස්ථානයක් විය යුතු ය. එය ළමයින් ගේ ආරක්ෂාව මෙන් ම යහ පැවැත්ම වෙනුවෙන් ද ඉහළ ම ප්‍රමුඛතාවක් ලබා දෙන සහ ළමයින් ගේ එදිනෙදා ක්‍රියාවන් අගය කිරීම තුළින් ඔවුන්ට ආදරය දැක්වීම පිළිඹිබු කෙරෙන ස්ථානයක් ද වෙයි.

> සෞඛ්‍ය යනු හුදෙක් ලෙඩ රෝගවලින් හා දුබලතාවන්ගෙන් තොර වීම පමණක් නොව කායික, මානසික හා සමාජයීය යහපැවැත්මේ පූර්ණත්වයට පත්වීම යි.
>
> ලෝක සෞඛ්‍ය සංවිධානය

## කායික යහ පැවැත්ම සඳහා

- පෝෂ්‍යදායි ආහාර ලබා ගැනීමට පහසුකම් සැපයීම
- ක්‍රියාකාරී බව වර්ධනය කිරීම
- ක්‍රීඩා ලෝලිත්වය වර්ධනය කිරීම
- යහපත් සෞඛ්‍ය පුරුදු ප්‍රවර්ධනය කිරීම
- වයසට සරිලන පෙනුම (වයසට නියමිත උස හා උසට නියමිත බර ශරීර ස්කන්ධ දර්ශකය රැක ගැනීමට යොමු කිරීම)
- විවේකය ඵලදායි ව ගත කිරීමට යොමු කිරීම
- අනතුරු ආපදා කළමනාකරණය
- පෞද්ගලික ස්වස්ථතාව පිළිබඳ ව සොයා බැලීම

## මානසික යහ පැවැත්ම සඳහා

- ආදරය, සෙනෙහස දැක්වීම
- මානසික ආතතිය අවම කිරීම
- අන්‍යෝන්‍ය සහයෝගයට යොමු කිරීම
- අදහස් දැක්වීමට ඉඩ සැලසීම
- සැමට සමාන ව සැළකීම
- විශ්වසනීයත්වය තහවුරු කිරීම
- සුරක්ෂිත බව තහවුරු කිරීම

## සාමාජයීය යහ පැවැත්ම සඳහා

- ප්‍රියජනක සම්බන්ධතා ඇති කිරීම
- උපකාරශීලිත්වයට යොමු කිරීම
- පරිත්‍යාගශීලී බව වර්ධනය කිරීම
- අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩ නැගීමට යොමු කිරීම
- කණ්ඩායමක් ලෙස වැඩ කිරීමේ හැකියාව වර්ධනය කිරීම
- අන්‍ය මත ඉවසීමට හුරු කිරීම

## පාසලක සෞඛ්‍ය සුරක්ෂිතතාව හා ආරක්ෂාකාරී පරිසරයක් ඇති කිරීමේ වැදගත්කම

ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට එකඟ වූ රටක් බව අපි දනිමු.

එබැවින් ළමා අයිතිවාසිකම් තහවුරු කිරීමත් 2015 දී සහශ්‍ර දර්ශක/පරමාර්ථ ළඟා කර ගැනීමත් අපගේ වගකීමකි.

ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ 24, 25, 31 වගන්ති ද සහශ්‍ර සංවර්ධන ඉලක්කවල (Millenium Development Goals ) 4, 5, 6 ඉලක්ක ද සෞඛ්‍ය සුරක්ෂිතතාව හා සෘජුව ම බැඳී ඇත.

## පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන

පාසල් ළමයින් තමන්ගේ, තම පවුලේ හා ප්‍රජාවේ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමට ස්වයං හැකියාවක් ඇති අය බවට බලවත් කිරීම පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය වේ.

මෙහි දී පාසල් දරුවන්, ගුරු හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය ඇතුළු පාසල් ප්‍රජාව තම පූර්ණ සංවිධානාත්මක ශක්තිය සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා යොදවයි.

සෞඛ්‍ය පිළිබඳ ඉගෙනීමට, දැනුම ලබා ගැනිමට ඉඩ සැලැස්වීම සෞඛ්‍ය අධ්‍යාපනයයි. ප්‍රාථමික අංශයේ පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් තුළින් ද 6-11 ශ්‍රේණිවල සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂය තුළින් ද සෞඛ්‍ය අධ්‍යාපනය ලැබේ. එහෙත් පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය වඩා පුළුල් පරාසයක පැතිරෙන අතර සෞඛ්‍ය අධ්‍යාපනය යනු එහි එක් අංගයකි.

සෞඛ්‍ය ප්‍රවර්ධනය ඇති කිරීමේ දී ප්‍රධාන අංග පහ ඇතුළත් වන පරිදි ක්‍රියාකාරකම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු ය.

1. සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් ප්‍රතිපත්ති සැකසීම.
2. පාසල් සිසුන් තුළ සෞඛ්‍ය ප්‍රවර්ධන දැනුම හා නිපුණතා ඇති කිරීම.
3. සෞඛ්‍යයට හිතකර පාසල් පරිසරයක් ඇති කිරීම.
4. පාසල සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීම.
5. සෞඛ්‍ය සේවා ප්‍රතිසංවිධානය කිරීම.

ළමා මිතුරු පාසලක ඉහත අංග පහ පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු කර ඇත.
විදුහල්පති, ගුරුවරුන්, සිසුන්, දෙමාපියන් ඇතුළු සියලු පාසල් ප්‍රජාව මේ අංග පහ යටතේ ක්‍රියා කිරීමෙන් සෞඛ්‍ය ප්‍රවර්ධනය කරා ළඟා විය හැකි බව දැනුවත් ය.

## නිර්ණායක

ළමයින්ගේ සෞඛ්‍ය, ආරක්ෂාව හා රැකවරණය තහවුරු කිරීම යන හතරවන මානය යටතේ තිබිය යුතු යැයි හඳුනාගත් අපේක්ෂිත තත්ත්වයන් පහත සඳහන් කර ඇත. මේවා ළමා මිතුරු පාසලක හතරවන මානයට අයත් නිර්ණායක ලෙස සැළකෙයි.

- ★ සෞඛ්‍ය සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ පාසල් මට්ටමේ ප්‍රතිපත්ති තිබේ.
- ★ ආහාර, ජලය හා සනිපාරක්ෂාව සම්බන්ධව පහසුකම් පාසලෙහි ප්‍රමාණවත්ව තිබේ.
- ★ ආහාර, ජලය, සනීපාරක්ෂක පහසුකම් හා පාසල් පරිසරය ආරක්ෂාකාරී ලෙස පවත්වාගෙන යනු ලැබේ.
- ★ ශිෂ්‍යයන් සඳහා නිපුණතා පාදක සෞඛ්‍ය අධ්‍යාපනය ඵලදායීව ක්‍රියාත්මක වේ.
- ★ ඵලදායි මනෝ සමාජීය සහාය හා යොමු කිරීමේ සේවාවන් තිබේ. භාවිත කෙරෙයි.
- ★ හිංසනයෙන්, අපයෝජනයෙන් හා පීඩාවෙන් ළමයින් ආරක්ෂිත ය.
- ★ ආපදා කළමනාකරණය සඳහා සැලසුම් සහගත සූදානමක් ඇත. එය ක්‍රියාත්මක වේ.

# පළමුවන නිර්ණායකය

සෞඛ්‍ය සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ පාසල් මට්ටමේ ප්‍රතිපත්ති තිබේ.

ළමා මිතුරු පාසලක සෞඛ්‍ය සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ පාසල් ප්‍රතිපත්ති ගොඩනගා ඇත. පාසල් ප්‍රජාවගේ සෞඛ්‍ය සුරක්ෂිතතාව හා ආරක්ෂාව තහවුරු කිරීමට බාධා වන හෝ අවහිර කරන සාධක අවම කර ගනිමින් පවතින පරිසරය හිතකර පරිසරයක් බවට සංවර්ධනය කිරීමට පාසල් ප්‍රජාව විසින් ම ගනු ලබන තීරණ පාසල් සෞඛ්‍ය ප්‍රතිපත්ති ලෙස හැඳින්වේ.

## නිදසුනක්

දිරාපත් නොවන පොලිතින් භාවිතය බහුල වීමෙන් පාසල් පරිසරය අහිතකර තත්ත්වයට පත් වීම ගැටලුවකි.

## විසඳුම් සඳහා යෝජනා

- ★ පොලිතීන් භාවිතය අවම කිරීම
- ★ නැවත භාවිතය
- ★ ප්‍රතිචක්‍රීකරණය කිරීම හෝ ඒ සඳහා යොමු කිරීම

## පාසල් ප්‍රතිපත්ති විය හැක්කේ

පාසලේ එකතු වන පොලිතින් ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීම හෝ පොලිතීන් නැවත භාවිතය ප්‍රවර්ධනය කිරීම හෝ පොලිතින් භාවිත නොකිරීම යි.

මෙසේ එක ම ගැටලුව නිරාකරණය කර ගත හැකි ප්‍රතිපත්ති අතුරින් සුදුසු ප්‍රතිපත්තිය තීරණය කීමේ දී එය පාසල් පරිසරයට අනුකූල ව සිදු කිරීම වැදගත් ය.



මෙම ප්‍රතිපත්ති සම්බන්ධයෙන් පාසල් ප්‍රජාවේ සියලු පාර්ශවයන්ගේ නියෝජනයක් අවශ්‍ය වේ. මෙහි දී බුද්ධි කලම්බන, සාකච්ඡා වැනි ක්‍රමවේද මගින් පවතින තත්ත්ව අනාවරණය කර ගැනීම හා යෝජනා ලබා ගැනීම සිදු විය යුතු ය. මෙලෙස සැමගේ එකඟතාවයෙන් සකස් කර ගනු ලබන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පහසු වේ. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සියලු පාසල් ප්‍රජාවගේ දායකත්වය ලැබීම තුළ සිදුවන බලවත්වීම මගින් පාසල් පරිශ්‍රය පමණක් නොව අවට පරිසරය හා නිවෙස්වල ද ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන වතාවරණයක් දැකිය හැකි වේ.

ළමා මිතුරු පාසල තම පාසල් ප්‍රජාව බලගැන්වීම තුළින් පවතින වතාවරණය අධ්‍යයනය කර සුදුසු ප්‍රතිපත්ති සකස් කර ක්‍රියාත්මක කිරීමට යොමු වේ.

## දෙවන නිර්ණායකය

ආහාර, ජලය හා සනීපාරක්ෂාව සම්බන්ධ ව පහසුකම් පාසලෙහි ප්‍රමාණවත් ව තිබේ.

## තුන්වන නිර්ණායකය

ආහාර, ජලය, සනීපාරක්ෂක පහසුකම් හා පාසල් පරිසරය ආරක්ෂාරී ලෙස පවත්වාගෙන යනු ලැබේ.

මෑතක දී සිදුකරන ලද විවිධ පර්යේෂණ මගින් පාසල් යන වයසේ දරුවන් අතර විවිධ පෝෂණ ගැටලු පවතින බව අණාවරණය වී ඇත.

උදෑසන ආහාරය නිසි පරිදි නොලැබීමත් පාසල් කාලය තුළ දී ක්ෂණික ආහාර, පැණි බීම ආදිය භාවිතයත් මෙම තත්ත්වයට හේතු වේ. එහෙයින් ආපනශාලා ප්‍රමිතීන් සහ විවිධ පෝෂණ වැඩසටහන් මේවන විට හඳුන්වා දී ඇත. ළමා මිතුරු පාසලක මෙම ප්‍රමිතීන් හා සුදුසු භාවිතයන් පවත්වා ගැනීම අපේක්ෂා කෙරෙයි.

පාසලක ප්‍රමාණවත් ලෙස පානීය ජලය හා සනිපාර-ක්ෂක පහසුකම් පැවතීම ඉතා වැදගත් වේ. පාසලේ සිටින සිසුන් සංඛ්‍යාව අනුව සනිපාරක්ෂක පහසුකම් සීමා සහිත වීම හා ප්‍රමාණවත් පරිදි ජල පහසුකම් නොපැවතීම නිසා හෝ අපිරිසිදුකම නිසා ඇතැම්විට ළමයින් අඩුවෙන් කෑම ගැනීම, අඩුවෙන් ජලය පානය කිරීම වැනි අවස්ථා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මූත්‍රා මාර්ගවල ආබාධ හා ශරීරයට අවශ්‍ය ජලය ප්‍රමාණය නොලැබීම නිසා ඇති වන වෙනත් සෞඛ්‍ය ගැටලු රාශියක් ඇතිවිය හැකි ය.

පැය 6ක් පමණ කාලයක් තුළ වැසිකිළි නොයෑම නිසා ශිෂ්‍යයන්ට මානසික පීඩනයක් ඇති විය හැකි ය. පාසලක බීමට සුදුසු ජලය නොමැති වීමෙන් අපිරිසිදු ජලය පානය කිරීම නිසා උණ සන්නිපාතය, සෙංගමාලය, පාචනය, කොළරාව වැනි රෝග වැළඳීමට ඉඩ ඇත. එහෙයින් පාසලක සිසුන් සංඛ්‍යාවට ප්‍රමාණවත් වන සේ තිබිය යුතු සනීපාරක්ෂක පහසුකම් හා පානීය ජල පහසුකම් පිළිබඳ ප්‍රමිතීන් ජාතික වශයෙන් හඳුනාගෙන පාසල් දැනුවත් කර ඇත. මෙම පහසුකම් ප්‍රමාණවත් ව තිබීම මෙන් ම ඒවායේ නඩත්තුව ද නිසියාකාර ව සිදුවිය යුතුවේ. පාසලක ශිෂ්‍ය සංඛ්‍යාවට අනුව ප්‍රමාණවත් සේ සනීපාරක්ෂක පහසුකම් සැපයීම යුතුකමක් මෙන් ම වගකීමක් ද වෙයි. (ඇමුණුම 2) ආපන ශාලාවේ ඇති ආහාර හොඳින් ආවරණය කර තැබීම, ආහාර ලබාදීමේ දී සුදුසු උපකරණ භාවිත කිරීම, ඉවතලන ආහාර ද්‍රව්‍ය දැමීම සඳහා කසල බඳුන් භාවිත කිරීම ආදිය මගින් සනීපාරක්ෂාව මෙන් ම ආපනශාලා පරිසරය ක්‍රමවත් ව හා පිරිසිදු ව පවත්වා ගත හැකි වේ. විෂබීජ නාශක යොදා වැසිකිලි පිරිසිදු කිරීම මගින් වැසිකිලි ද දෛනික ව හොඳින් නඩත්තු කළ යුතු වේ. ජලය සීමිත සම්පතක් බැවින් ජලය අපතේ යන ක්‍රම හඳුනා ගැනීම මෙන් ම ඒවා වළක්වා ගැනීමේ ක්‍රමවේද ද පාසලේ ක්‍රියාත්මක කළ යුතු වේ. ආහාර පහසුකම් සනීපාරක්ෂක හා පානීය ජල පහසුකම් නිසි ප්‍රමිතීන්ට අනුව පවත්වා ගෙන යාම මෙන් ම ඒවා නිසි පරිදි නඩත්තු කිරීම ද ළමා මිතුරු පාසලක අත්‍යවශයෙන් ම තිබිය යුතු තත්ත්වයකි.



පෝෂ්‍යදායී ආහාර, පානීය ජලය හා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සහිත ළමා මිතුරු පාසල් සිසුහු ක්‍රියාශීලී ලෙස ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට සහභාගි වෙති.

වියළි කලාපයේ දුෂ්කර ප්‍රාථමික පාසලක් වූ නාමල් බැද්ද පාසල සිසුන්ට ප්‍රමාණවත් පරිදි ජලය සම්පාදනය කර ගැනීමේ දුෂ්කරතාවකට මුහුණ දී ඇත. පාසල ආසන්නයේ ජලය ලබා ගැනීමේ ජල ප්‍රවාහයක් ද නැත. මේ නිසා බීමට අවශ්‍ය ජලය ගෙන ඒම අනිවාර්ය වූ අතර පාසල් වත්තේ ඇති වගාවට යෙදීමට හෝ වැසිකිළිවල භාවිතය සඳහා හෝ ජලය නොමැතිකම බරපතල ගැටලුවක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස පාසල් වත්තේ අඩු තරමින් එක් පාත්තියක් හෝ දක්නට නොලැබුණු අතර වැසිකිළි ද ඉතා අපිරිසිදු විය. වැසිකිළිවල අපිරිසිදු බවට හේතුව ලෙස හැමදා ම ඉදිරිපත් වුයේ ජල හිඟකමයි.

පාසල් සංවර්ධන සමිති රැස්වීමේ දී පාසලේ අති විශාල ගැටලුවක් ලෙස මෙය සාකච්ඡාවට භාජනය විය. කිසියම් ආයතනයක් හරහා අවශ්‍ය ජල පහසුකම් ලබා ගැනීමට යොමු විය යුතු බව බොහෝ දෙනාගේ අදහස විය. රැස්වීම් ශාලාවේ එක් කොනක සිටි මව්වරු කිහිප දෙනෙක් අපූරු යෝජනාවක් ඉදිරිපත් කළහ. ඔවුන්ගේ යෝජනාව වුයේ සිය දරුවන් පාසලට ඇරලවීමට එන සෑම මවක පියෙකු හෝ වැඩිහිටියෙකු විසින් ජල බාල්දියක් උදැසන ම ගෙනවිත් පාසලේ ටැංකියකට පිරවුවහොත් පාසලේ දෛනික ජල අවශ්‍යතා ඒ මගින් විසඳා ගත හැකි බවයි.

මෙම යෝජනාවට සෑම දෙනාම එකඟ විය. අද පවා උදේ කාලයේ මෙම පාසලට යන ඕනෑම කෙනෙකුට දක්නට ලැබෙන සුලබ දර්ශනයක් වන්නේ තම කුඩා දරුවන් කැටුව ජල බාල්දියක් ද අතින් එල්ලාගෙන එන මව්වරුන් හා පියවරුන් ය. දැන් පාසලේ වැසිකිළි අසල ඇති ජල ටැංකියේ උදැසන සිට ම ජලය පිරී ඇති අතර ඒ හේතුවෙන් වැසිකිළි ද පිරිසිදු ව ඇත.

# හතරවන නිර්ණායකය

ශිෂ්‍යයන් සඳහා නිපුණතා පාදක සෞඛ්‍ය අධ්‍යාපනය ඵලදායී ව ක්‍රියාත්මක වේ.

සෞඛ්‍ය සුරක්ෂිතතාවයෙහි දී නිපුණතා සංවර්ධනය වීම අත්‍යාවශ්‍ය වෙයි. විෂය නිර්දේශය තුළින් දැනුම හා කුසලතා ලබාදීම මේ වැඩසටහනේ තිරසාර පැවැත්මට වැදගත් ය. එමෙන් ම කාලීන වෙනස්කම් හා අභියෝග පිළිබඳ නව දැනුම ලබාදීම ද ඉතා අවශ්‍ය වෙයි. පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන සෞඛ්‍ය සමාජ මගින් මෙහෙයවනු ලබන විවිධ ක්‍රියාකාරකම් මීට උපකාරී වෙයි.

මෙවැනි වැඩසටහන් මගින් සිසුන්ගේ සෞඛ්‍ය සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ නිපුණතා මෙන් ම මෙවැනි ගැටලු විසඳීමට අවස්ථා ලබා දීම තුළින් සිසුන්ගේ

- ★ නිර්මාණාත්මක චින්තනය
- ★ විවේචනාත්මක චින්තනය
- ★ තීරණ ගැනීමේ හැකියාව
- ★ ස්වයං අවබෝධය
- ★ සන්නිවේදන නිපුණතාව
- ★ අන්තර් පුද්ගල සම්බන්ධතා
- ★ සහානුභූතිය වැනි නිපුණතා ද සංවර්ධනයට ඉඩ ප්‍රස්ථා සැලසේ

## පස්වන නිර්ණායකය

එලදායි මනෝ සමාජීය සහාය හා යොමු කිරීමේ සේවාවන් තිබේ. භාවිත කෙරෙයි.

පාසලට ඇතුළු වන මොහොතේ සිට මානසික ව කායික ව හෝ සමාජයීය වශයෙන් මුහුණ දෙන්නට සිදුවන ඕනෑ ම තත්ත්වයකට සතුටින් හා සැහැල්ලුවෙන් මුහුණදිය හැකි ධනාත්මක ව සිතන යහපත් අන්තර් සම්බන්ධතා ගොඩනගා ගන්නා පාසල් ප්‍රජාවක් සිටීනම් එම පාසලේ යහපත් මනෝ සමාජීය පරිසරයක් ඇති බව තහවුරු වේ.

සාමාන්‍යයෙන් ආදරය හා කරුණාව නොලැබීම, අනවබෝධය, නොසලකාහැරීම, අපචාර හා වැරදිකරුවෙකු යැයි හංවඩු ගැසීම වැනි කරුණු නිසා ළමයින්ට මානසික සෞඛ්‍යමය ගැටලු ඇති විය හැකි ය. මෙවැනි තත්ත්වයක දී ප්‍රවේසම් සහගත, සුරක්ෂිත පරිසරයක් ඇති කරලීම පාසලක වගකීම වේ. මනෝ සමාජයීය වශයෙන් එලදායි ලෙස සිසුන්ට උපකාර ලබාදීම සහ අවශ්‍ය නම් උදව් ලබා ගැනීම සඳහා සුදුසු පුහුණු පුද්ගලයන්ට යොමු කිරීමේ සේවාවන් ළමා මිතුරු පාසල්වල ඇත.


පාසල් ප්‍රජාවේ සියලු සාමාජිකයන් තම වගකීම් ඉටුකරන්නේ නම් දරුවන්ගේ අයිතියක් වන යහපත් මනෝ සමාජයීය පරිසරය ගොඩනැගෙනු ඇත.

# භයවන නිර්ණායකය

හිංසනයෙන්, අපයෝජනයෙන් හා පීඩාවෙන් ළමයින් ආරක්ෂිත ය.

ළමයින් ගේ කායික, මානසික, සමාජයීය සමබරතාවට හානි වන ආකාරයට ක්‍රියාත්මක වන ඕනෑ ම දෙයක් ළමා අපයෝජනය වන අතර කායික හා මානසික වර්ධනයට බාධා නොවන්නා වූ ක්‍රමවේදයන් සහිත පරිසරයක් නිර්මාණය කිරීමෙන් ළමා ආරක්ෂාව තහවුරු කළ හැකි ය.

ළමා අපචාර යන්නෙන් අදහස් වන්නේ ලිංගික අපචාරය පමණක් නොවේ. ළමයාගේ කායික මානසික සමාජයීය සමබරතාව සඳහා අහිතකර ලෙස බලපානු ලබන ඕනෑම සිද්ධියක් ළමා අපචාරයන්නට අයත් වේ. දෙමාපියන් හෝ වැඩිහිටියන් විසින් තදින් තරවටු කිරීම දඬුවම් කිරීම හෝ බැණ වැදීම ආදියත් ප්‍රජාව විසින් දරුවන් මෙහෙකාරකමට යොදා ගැනීමත් ළමා අපචාර සඳහා උදාහරණ වේ. නිවසේ පවතින සුරක්ෂිතභාවය ළමයාගේ පාසලට පැමිණීම සහ ඉගෙන ගැනීම සඳහා සෘජුව ම බලපාන සාධකයක් වේ.



ළමයකුගේ යහපත සඳහා ඉතාමත් නිවැරැදි ව එවැනි තත්ත්වයනට මැදිහත් වීමට සෑම ගුරුවරයෙකුට ම හැකියාව තිබිය යුතු ය. දරුවන්ට අයහපත් ලෙස බලපාන පවුල් පරිසර තත්ත්ව පවා ගුරුවරුන්ගේ නිවැරැදි මැදිහත්වීම තුළින් යහපත් ලෙස හැඩගැසුණු අවස්ථා බොහෝ ඇත. ප්‍රජා නායකයින්ගේ උදව් උපකාර හා අවවාද මේ සඳහා ලබාගත හැකි ය. පාසලට පැමිණීම හා පාසල අවසන් වී නැවත ගෙදර යාම පවා සුරක්ෂිත ලෙස සිදු වීම වැදගත් කරුණක් ලෙස ළමයින් දැනුවත් කිරීම අවශ්‍ය වන අතර ඒ පිළිබඳ ව දෙමාපියන් ගේ අවධානය යොමු කරවීමට ද පාසල සැළකිලිමත් විය යුතු ය.

හිංසනයෙන්, අපයෝජනයෙන් හා පීඩනයෙන් තොර පරිසරයක් පවත්වා ගෙන යන ළමා මිතුරු පාසල සියලු ම ළමයින්ට ප්‍රියජනක ස්ථානයකි.

නව වසරේ තමාට ලැබුණු පන්තියේ සිසුන් අතර මුලු ගැන්වුණු දැරියක් ලෙස අමාලි ව හඳුනා ගැනීමට ගුරුතුමිය සමත් වූවා ය. අමාලි ගේ ලිපිගොනුව වෙත නෙත යැවීමේ දී අමාලි අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා කරාවත් ළඟා වී නොමැති බව පැහැදිළි විය. පෙර වසරේ ගුරුතුමිය පැවසුයේ අමාලිගේ පියා ඉතා තදින් මත්පැනට ඇබ්බැහිවූවකු බවත් නිවසේ අයහපත් වාතාවරණය නිසා ම අමාලි ගේ පාසල් පැමිණීම ද සතුටුදායක නොවන බවත්ය. අමාලි සමග අදහස් හුවමාරු කර ගැනීමෙන් එය තව දුරටත් තහවුරු විය.

වඩු කාර්මිකයකු වූ අමාලි ගේ පියා පාසලේ කටයුතුවලට සම්බන්ධ කර ගැනීමෙන් මෙම තත්ත්වයෙන් මුදවා ගත හැකි වේ යැයි කල්පනා කළ ගුරුතුමිය අමාලි ගේ පියා මුණ ගැසීමට නිවෙසට ගියා ය. ගුරුතුමිය ගේ පැමිණීමෙන් මහත් සතුටට පත් අමාලි ගේ මව සහ පියා ගුරුතුමිය සතුටින් පිළිගෙන පැමිණි කාරණා විමසූහ.

එළඹෙන සතියේ දී පැවැත්වීමට නියමිත පාඩමට වඩු උපකරණ හඳුන්වා දීමට ඇති බවත් ඒ සඳහා අමාලි ගේ පියාට පාසලට පැමිණ එම කාර්යයට තමාට උදවු කරන ලෙසත් ගුරුතුමිය ඉල්ලා සටියා ය. තව ද මේ පාඩමට ඔහුගේ අත්දැකීම්වල වටිනාකම පිළිබඳ ව ද ගුරුතුමිය පැහැදිළි කළා ය. මුලින් ම මැලිකමක් දැක්වූව ද ගුරුතුමියගේ ඉල්ලීම හමුවේ ඔහු එකඟ විය.

නියමිත දිනයේ දී පිළිවෙලට හැඳ පැළඳ ගත් අමාලි ගේ පියා වඩු උපකරණ කට්ටලයත් රැගෙන පාසලට පැමිණියේ ය. පෙර දැනුම් දීමක් කර තිබූ බැවින් සිසුන් ආයුබෝවන් කියා අමාලි ගේ පියා පිළිගැනීම ම ඔහුට මෙන් ම අමාලිට ද මහත් සතුටක් වූ බව ඔවුන් ගේ ඉරියව්වලින් ම පැහැදිළි විය.

අමාලි ගේ පියා ගේ උදවුවෙන් ප්‍රායෝගික ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් දියත් වන අතරතුර එම ස්ථානයට පැමිණි විදුහල්පතිතුමා ගේ විශේෂ ඇගයීමට ද අමාලි ගේ පියා ලක් විය.

මේ සිද්ධියෙන් පසු අමාලි ගේ පියාට වරින් වර පාසලේ කටයුතුවලට සම්බන්ධ වීමට ගුරුතුමිය අවස්ථා උදා කර දුන්නා ය.

ටික කලකට පසු පාසලට පැමිණි අමාලි ගේ මව පැවසුවේ පියා ගේ හැසිරීම බොහෝ දුරට යහපත් අතට හැරී ඇති බවත් එය අමාලිටත් තමාටත් විශාල සහනයක් බවත් ය. ක්‍රියාශීලි ලෙස අධ්‍යාපන කටයුතුවල නිරත වන අමාලි දුටු ගුරුතුමියට මහත් අභිමානයක් ඇති විය.

# හත්වන නිර්ණායකය

ආපදා කළමනාකරණය සඳහා සැලසුම් සහගත සූදානමක් ඇත. එය ක්‍රියාත්මක වේ.

බලාපොරොත්තු නොවන අවස්ථාවක දී ඇතිවන විපත් හදිසි ආපදා වෙයි. මේවා මිනිසා විසින් ඇති කරණු ලබන ක්‍රියා හා ස්වාභාවික විපත් වශයෙන් ප්‍රධාන කොටස් දෙකකි. උදාහරණ ලෙස විෂ වායු, යුද්ධ, ගිනි ගැනීම්, පරිසර විනාශය නිසා ඇතිවන හානි මිනිසා විසින් සිදුකරනු ලබන ක්‍රියා නිසා ඇති වන ආපදාවන් වේ. ස්වාභාවික විපත් ලෙස භූ චලන, නියඟ, ගං වතුර සුළි සුළං, ගිනි කඳු පිපිරීම්, ලැව් ගිනි ආදිය ගත හැකිය. හදිසි ආපදාවල දී ප්‍රථමාධාර ලබාදීම සිදුවිය යුතු වේ. ආපදා කළමනාකරණය සඳහා සෑම පාසලකට ම ක්‍රමවත් සැලසුමක් තිබිය යුතු වේ. ආපදා පිළිබඳ ව දැනුවත්භාවය ලබා දීම මෙන් ම ආපදාවක දී පිළිපැදිය යුතු ක්‍රමවේදයන් පිළිබඳ ව ද මනා අවබෝධයක් හා කුසලතා ලබාදීම එම සැලසුමෙහි අන්තර්ගත විය යුතුයි.

### හදිසි ආපදාවක දී කළ යුතු දේ

- ★ ජීවිත බේරා ගැනීම
- ★ මූලික අවශ්‍යතා සැපයීම
- ★ රෝග නිවාරණය
- ★ මානසික සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම
- ★ නැවත පදිංචි කිරීම
- ★ ඉගෙනීමට අවස්ථා සැලසීම

### මේ සඳහා පහත සඳහන් දෑ කළ හැකි ය.

- ★ හදිසි අවස්ථාවල දී ගත යුතු ක්‍රියාමාර්ග ගැන ප්‍රජාව දැනුවත් කර තිබීම.
- ★ රෝහල් ගත කළ යුතු අය වෙන් කිරීම.
- ★ හදිසි ගිලන් රථ ගෙන්වා ගැනීමට කටයුතු කිරීම.
- ★ ආහාර, බීමට ජලය, ඇඳුම්, හිසට වහලක්, බෙහෙත් හේත්, වැසිකිළි පහසුකම් වැනි ජීවත් ව සිටින රෝගී නොවන අයගේ මූලික අවශ්‍යතා ගැන සොයා බැලීම.
- ★ ප්‍රාදේශීය ලේකම්, පොලිසිය වැනි අදාළ අනෙකුත් නිළධාරීන් දැනුවත් කිරීම.
- ★ සුදුසු තාවකාලික නවාතැන් සැපයීම.
- ★ දරුවන්ට ඉගැන්වීමට කඳවුරු තුළින් ම කෙනෙක් සොයා ගැනීම.
- ★ සෑම ක්‍රියාකාරකමක් ම නිසි ලෙස සිදු වේ දැයි නියාමනය.
- ★ සම්බන්ධ වන සියලු ම පාර්ශව අතර මනා සම්බන්ධතා ජාලයක් ඇති කර ගැනීම.

ක්‍රමවත් සැලසුමක් තුළ ක්‍රියාත්මක වන නිසා ළමා මිතුරු පාසලේ සියලු ම සිසුන් ආපදා කළමනාකරණය පිළිබඳ දැනුවත් ය. හදිසි අවස්ථා සඳහා සූදානම් ව ඇත.

පස්වන පරිච්ඡේදය

# පස්වන මානය
# ශිෂ්‍යයින් පවුල් සහ ප්‍රජාවගේ සක්‍රීය දායකත්වය

## හැඳින්වීම

පාසලක අභිවෘද්ධිය කෙරෙහි බලපාන වැදගත් සාධකයක් වන්නේ පාසල් ප්‍රජාවයි.

## පාසල් ප්‍රජාවට අයත් කණ්ඩායම්

- විදුහල්පති ඇතුළු ගුරු මණ්ඩලය
- සිසුන්
- අනධ්‍යයන කාර්ය මණ්ඩලය
- ආදි සිසුන්
- සිසුන්ගේ දෙමාපියන්, භාරකරුවන් ඇතුළු පවුලේ අය
- පෝෂිත ප්‍රදේශය තුළ වැඩ වසන පූජ්‍ය පක්ෂය
- ප්‍රදේශයේ ජීවත් වන අනෙකුත් පවුල්වල සමාජිකයන්
- සුභ පතන්නන්
- ප්‍රදේශයේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන
- ප්‍රදේශයේ සමිති සමාගම්

ඉහත කී කණ්ඩායම් පාසලේ අභිවෘද්ධියට අත දෙමින් එක ම දැක්මක් කරා සහයෝගයෙන් කටයුතු කිරීම තුළින් ළමා මිතුරු පාසල ගොඩනැගීම සඳහා මහත් දායකතත්වයක් ලබා දෙයි.

පාසල් ප්‍රජාවේ සහභාගිත්වය පහත සඳහන් පරිදි විවිධ විය හැක.

## ප්‍රජා සහභාගිත්වය

### නිශ්ක්‍රීය සහභාගිත්වය

- පැමිණීමෙන් පමණක්,
- අදහස් ප්‍රකාශ කිරීමෙන් පමණක්,
- විරුද්ධ වීමෙන් පමණක්
- ප්‍රතිචාරවලට අවනත වීමෙන් පමණක්,
- පැවරෙන කාර්ය ඉටුකර තම වගකීම අවසන් කිරීමෙන් පමණක්,

### ඵලදායී සහභාගිත්වය

- ඉලක්ක කරා ළඟා වීමට ගැටලු හඳුනා ගැනීමෙන්,
- විකල්ප යෝජනා ඉදිරිපත් කිරීමෙන්,
- ප්‍රශස්ත යෝජනා ක්‍රියාත්මක කිරීමෙන්,
- ක්‍රියාත්මක කිරීමේ දී පැන නගින ගැටලුවලට විසඳුම් සොයමින් ඉදිරියට යාමෙන්,
- අපේක්ෂිත ප්‍රතිඵලය කරා ළඟා වීමේ සතුට භුක්ති විඳීමෙන්.

ළමා මිතුරු පාසලක ඵලදායී ප්‍රජා සහභාගිත්වයක් ඇත. ළමා මිතුරු නිර්ණායකවලට අනුකූලවන සේ පාසල පවතින තත්ත්වය හඳුනා ගෙන ප්‍රශස්ථ මට්ටමට ළඟාවීම සඳහා ඉලක්ක පිහිටුවා ගනිමින් ඒ සඳහා සාමූහිකව ක්‍රියාත්මක වීම එබඳු ප්‍රජා සහභාගීත්වයකින් අපේක්ෂා කෙරෙයි. ළමා මිතුරු පාසලක මෙබඳු සහභාගීත්වයක දී ප්‍රජාවෙන් පාසලට මෙන් ම පාසලෙන් ප්‍රජාවට ද ප්‍රතිලාභ සැලසේ.

## පාසල් ස්වයං තක්සේරුකරණය

පාසල් ප්‍රජාවේ ඵලදායි සහභාගිත්වය තුළින් ළමා මිතුරු පාසල් නිර්ණායක ඔස්සේ පාසල පිළිබඳ ව කරනු ලබන තක්සේරුවයි. මේ සඳහා සියලු ම ප්‍රජා කණ්ඩායම්වල සහභාගිත්වය ලැබිය යුතු ය.

## පාසල් සංවර්ධන සැලැස්ම

ළමා මිතුරු නිර්ණායක අනුව කරන ලද තක්සේරුවේ දී හඳුනාගත් ප්‍රමුඛ අවශ්‍යතා සම්පූර්ණ කරගැනීම සඳහා සකස් කරනු ලබන සැලැස්මයි. සැලැස්ම සකස් කිරීමේ දී ද සියලු ම ප්‍රජා කණ්ඩායම් ඵලදායීව සහභාගි විය යුතු වේ. පාසල් සංවර්ධන සැලැස්ම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය යන සියලු ම අවස්ථාවල දී පාසල් ප්‍රජාවේ සහභාගීත්වය ඉතා වැදගත් වේ.

## නිර්ණායක

ශිෂ්‍යයින් පවුල් සහ ප්‍රජාවගේ සක්‍රීය දායකත්වය යන පස්වන මානය යටතේ තිබිය යුතු යැයි හඳුනාගත් අපේක්ෂිත තත්ත්වයන් පහත සඳහන් කර ඇත.

මේවා ළමා මිතුරු පාසලක පස්වන මානයට අයත් නිර්ණායක ලෙස සැළකෙයි.

- ★ ශිෂ්‍යයින්ගේ ද පවුල්වල ද ප්‍රජාවන්හි ද ඵලදායි සහභාගිත්වයෙන් පාසල් ස්වයං තක්සේරුකරණය සිදු කෙරෙයි. පාසල් සංවර්ධන සැලසුම් සකස් කෙරෙයි.
- ★ පාසල් සංවර්ධන සැලැස්ම (SDP) ක්‍රියාත්මක කිරීමේ දී විදුහල්පති, ගුරුවරු, ශිෂ්‍යයෝ, පවුල් හා ප්‍රජාව ක්‍රියාකාරීව සහභාගි වෙති.
- ★ පාසල් සංවර්ධන සැලැස්ම (SDP) නියාමනයේ දී හා ඇගයීමේ දී විදුහල්පති, ගුරුවරු, ශිෂ්‍යයෝ, පවුල් හා ප්‍රජාව ක්‍රියාකාරීව සහභාගි වෙති.
- ★ ළමා මිතුරු නිවස/ප්‍රජා පරිසරය ප්‍රවර්ධනයේ දී පාසල සක්‍රීය ව සහභාගි වේ.

# පළමුවන නිර්ණායකය

**ශිෂ්‍යයින්ගේ ද පවුල්වල ද ප්‍රජාවන්හි ද ඵලදායී සහභාගිත්වයෙන් පාසල් ස්වයං තක්සේරුකරණය සිදු කෙරෙයි. පාසල් සංවර්ධන සැලසුම් සකස් කෙරෙයි.**

පාසලේ ස්වයං තක්සේරුකරණය කරනු ලබන්නේ පාසලේ සියලු පාර්ශ්වයන් නියෝජනය වන පරිදි සැදුම් ලත් කණ්ඩායමක් විසිනි.

විවිධ පැතිකඩ ඔස්සේ මේ කණ්ඩායම සාකච්ඡා කිරීම් සහ සොයා බැලීම් තුළින් තොරතුරු ලබා ගනියි. තොරතුරු සෙවීම සඳහා සිසුන් එක් කණ්ඩායමක් ලෙසත් දෙමාපියන් තවත් කණ්ඩායමක් ලෙසත් ගුරුවරුන් වෙනත් කණ්ඩායමක් ලෙසත් ආදී වශයෙන් එක් එක් පාර්ශව වෙන වෙන ම හමු වී සාකච්ඡා කළ යුතු ය. සාකච්ඡාව පවත්වාගන යා යුත්තේ ළමා මිතුරු නිර්ණායකවලට අදාළව ය. මෙහිදී සිදුවිය යුතු වන්නේ ළමා මිතුරු නිර්ණායකවලට අදාළ ව පාසලේ වත්මන් තත්ත්වය හඳුනා ගැනීම ය. මෙවැනි සාකච්ඡා මගින් පාසලේ සැබෑ තත්ත්වය අවබෝධ කර ගැනීමට හැකි වේ. එක් එක් කණ්ඩායම වෙන් වෙන් ව තක්සේරු කිරීමේ දී සැබෑ තත්ත්වය අවබෝධ වන්නේ එම කණ්ඩායමට සුවිශේෂී ව ය. ළමා මිතුරු පාසලක පැවතිය යුතු යැයි අපේක්ෂිත තත්ත්ව පිළිබඳ සියලු දෙනාට ම අවබෝධයක් ඇත. අවසානයේ දී සියලු ම කණ්ඩායම් තම කණ්ඩායම්වල තක්සේරුවට අදාළව පාසලේ පවතින සැබෑ තත්ත්වය විස්තර කළ යුතු වේ. මෙහි දී එක ම නිර්ණායකය පිළිබඳ ව විවිධ කණ්ඩායම් විවිධ අදහස් ඉදිපත් කළ හැකි වේ. එසේ ම අපේක්ෂිත තත්ත්ව කරා ළඟා වීම සඳහා විවිධ යෝජනා ද ඉදිරිපත් කරනු ලැබේ. මෙම විවිධ යෝජනා ප්‍රමුඛතා අනුව පෙළ ගස්වා පාසල් සංවර්ධන සැලැස්ම සකස් කරනු ලැබේ.

මෙහි දී පාසල් ප්‍රජාව විසින් පාසලේ පවතින තත්ත්වය වටහා ගනු ලැබීමෙන් පසු වඩාත් ළමා මිතුරු තත්ත්ව ඇති කිරීම සඳහා ඉලක්ක පිහිටුවා ගනියි. එම ඉලක්ක කරා ළඟා වීම සඳහා පාසල් සංවර්ධන සැලැස්ම සකස් කෙරෙයි. මෙම සංවර්ධන සැලැස්මේ ඉලක්ක, ක්‍රියාකාරකම්, ඒ සඳහා අවශ්‍ය සම්පත්, කාලරාමුව, වගකීම් ඉලක්ක කරා ළඟා වුවා දැයි දැන ගැනීම සඳහා දර්ශක දක්වා ඇත.

# දෙවන නිර්ණායකය

## පාසල් සංවර්ධන සැලැස්ම (SDP) ක්‍රියාත්මක කිරීමේ දී විදුහල්පති, ගුරුවරු, ශිෂ්‍යයෝ, පවුල් හා ප්‍රජාව ක්‍රියාකාරීව සහභාගී වෙති.

පාසල් සංවර්ධන සැලැස්මෙහි සඳහන් විවිධ වූ ක්‍රියාකාරකම් සඳහා පාසල් ප්‍රජාවෙන් ක්‍රියාකාරී නායකත්වයක් ලැබිය යුතු අතර සෑම දෙනාට ම වගකීම් පැවරීමත් අරමුණු කරා ළඟා වන තෙක් සක්‍රීය සහභාගිත්වයත් තිබිය යුතු වේ. මෙහි දී ක්‍රියාවලියේ පාරදෘශ්‍යභාවය පවත්වා ගැනීම ඉතා වැදගත් වේ.





# තුන්වන නිර්ණායකය

**පාසල් සංවර්ධන සැලැස්ම (SDP) නියාමනයේ දී හා ඇගයීමේ දී විදුහල්පති, ගුරුවරු, ශිෂ්‍යයෝ, පවුල් හා ප්‍රජාව ක්‍රියාකාරීව සහභාගී වෙති.**

පාසල් තක්සේරුකරණ වැඩසටහනේ දී සකස් කර ගන්නා ලද පාසල් සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීම සඳහා ඵලදායී නියාමනය හා ඇගයීම ඉතා වැදගත් වේ.

නියාමනය යනු සැලසුමේ අඩංගු ක්‍රියාකාරකම් ඉටු වෙමින් පවතියි ද යන්න නිරතුරුව සොයා බැලීමයි. මෙහි දී අදාළ ක්‍රියාවලියෙන් බැහැරවීමක් සිදු වේ නම් සුදුසු ප්‍රතිකාර්ය ක්‍රියාමාර්ග තුළින් එය නිවැරදි මාර්ග යට දිශානත කර ගත යුතු වෙයි. එනම් නියාමනය යනු සැලැස්ම ක්‍රියාත්මක වීම ආරම්භයේ සිට අවසානය දක්වා ම සිදුවන්නකි.

ඇගයීම යනු සැලැස්ම ක්‍රියාත්මක කර අවසාන වූ පසු සිදු කරනු ලබන්නකි. මෙහි දී සැලැස්මේ අපෙක්ෂිත අරමුණු හා ඉලක්කවලට ළඟා වූයේ ද යන්න තහවුරු කරගනු ලැබේ. ළඟා වී නොමැතිනම් එසේ වීමට බලපා ඇති හේතු හඳුනා ගෙන ඉදිරි සැලසුම්වල දී ඒවා අවම කර ගැනීම සඳහා කටයුතු කළ යුතු ය. ළමා මිතුරු පාසලක පාසල් සංවර්ධන සැලැස්ම නියාමනය හා ඇගයීම සියලු පාර්ශවකරුවන් ගේ සහභාගිත්වයෙන් සිදුවිය යුතු ක්‍රියාකාරකමකි.



# හතරවන නිර්ණායකය

## ළමා මිතුරු නිවස / ප්‍රජා පරිසරය ප්‍රවර්ධනයේ දී පාසල සක්‍රීය ව සහභාගි වේ.

ළමයෙකුගේ පූර්ණ පෞරුෂ සංවර්ධනය සඳහා පාසල පමණක් නොව නිවස සහ සමාජ සම්බන්ධතා ද තීරණාත්මක සාධකයන් වේ.

ළමා මිතුරු පාසල තම ප්‍රජා සම්බන්ධතා මගින් පාසලෙන් ද ඔබ්බට විහිදෙන ඊට අවශ්‍ය ළමා මිතුරු පරිසරයක් ප්‍රවර්ධනය සඳහා දායකත්වය ලබා දෙයි.

එක් පාසලක පාසල් ස්වයං තක්සේරුකරණය හා පාසල් සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ කාර්යයේ දී ළමා මිතුරු නිර්ණායක අනුව දැනට තම පාසලේ පවතින තත්ත්වය තක්සේරු කර, ඊට අදාළ ගැටලු හඳුනා ගන්නා ලදි. එබඳු එක් ගැටලුවක් වුයේ පාසලට ළමයින් ඇතුළත්වීමේ අඩු ප්‍රතිශතයයි. ළමයින් ඇතුළත් වීමේ ප්‍රතිශතය වැඩිකර ගැනීම පාසල් සංවර්ධන සැලැස්මෙහි එක් ක්‍රියාකාරකමක් ලෙස හඳුනා ගන්නා ලදි. එම ක්‍රියාකාරමට අදාළ ව පාසල් නොයන දරුවන් පිළිබඳ ව සොයාබැලීම සඳහා පාසල් මට්ටමේ කමිටුවක් පිහිටුවා ගන්නා ලද අතර පහත සඳහන් පරිදි එහි කාර්යභාර්යය හා වගකීම් හඳුනා ගන්නා ලදී.

### පාසල් නොයන දරුවන් පිළිබඳ ව සොයා බැලීමේ පාසල් මට්ටමේ කමිටුව

- සති දෙකකට වරක් රැස්වීම,
- හඳුනාගත් පාසල් නොයන ළමුන් පාසල් ගත කිරීම,
- ඔවුන්ගේ අඩුපාඩු සපුරා දීම,
- ඔවුන් නොකඩවා පාසලට එන බව තහවුරු කිරීම,
- පාසල් පැමිණීම පිළිබඳ පන්ති මට්ටමේ තොරතුරු ලබා ගෙන, පැමිණීම දුර්වල සිසුන් එසේ වීමට හේතු සොයාබලා පිළියම් යෙදීමට ගුරුවරුන් දෙදෙනෙකු, දෙමාපියන් දෙදෙනෙකු හා සිසුන් දෙදෙනෙකුගෙන් සමන්විත අනු කමිටුවක් පිහිටුවා ගැනීම,
- පාසල් පැමිණීම දිරිගැන්වීම සඳහා සිසු ඇගයීම් ක්‍රමවේදයක් ඇති කිරීම.
- මෙම පාසල ක්‍රියාත්මක කළ ඉහත කී සාර්ථක ක්‍රමවේදය තුළින් සිසුන් ගේ පාසල් පැමිණීමේ කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණි.

හයවන පරිච්ඡේදය

# හයවන මානය
# ළමා මිතුරු පද්ධති, ප්‍රතිපත්ති, පරිචය හා රෙගුලාසි මගින් සහාය ලැබීම

## හැඳින්වීම

පාසල යනු හුදකලා ආයතනයක් නොවේ. පාසල එය අයත්වන අධ්‍යාපන පද්ධතියේ පවතින අධ්‍යාපනයට සෘජුව ම සම්බන්ධ වන ආයතන සමග ද එයින් පරිබාහිර වූ ආයතන සමග ද නොයෙකුත් ආකාරයේ අන්තර් සම්බන්ධතා පවත්වයි.

පාසලේ ක්‍රියාකාරීත්වයට එය අයත් පද්ධතිය තුළ පවතින ප්‍රතිපත්ති, පරිචයන් හා රෙගුලාසි ද රටෙහි පවතින ප්‍රතිපත්ති ද බලපායි. එපමණක් නොව අන්තර්ජාතික වශයෙන් පවතින අදාළ සම්මුතීන් හා ප්‍රඥප්තීන් ද මෙම ක්‍රියාකාරීත්වයට බලපෑම් ඇති කරයි. එහෙයින් පාසලක ළමා මිතුරුභාවය කෙරෙහි එය අයත් අධ්‍යාපන පද්ධතියේ හා රටෙහි පවතින ප්‍රතිපත්ති ඉතා වැදගත් වේ.

## ප්‍රතිපත්ති

ප්‍රතිපත්තිය යන්න සුවිශේෂීව අර්ථ දැක්විය නොහැකි සංකල්පයක් වන අතර විවිධ අවස්ථාවල දී විවිධ ආකාරයට අර්ථ නිරූපණය වන්නකි. වෙබ්ස්ටර් ශබ්ද කෝෂයට අනුව ප්‍රතිපත්තිය යන්න "රජයක්, ආයතනයක්, කණ්ඩායමක් හෝ තනි පුද්ගලයෙකු විසින් වර්තමාන හා අනාගත තීරණයන් නිර්ණය කිරීම සඳහා දෙන ලද තත්ත්වයන් හා මග පෙන්වීම් යටතේ පවතින විකල්පයන් අතුරින් තෝරා ගනු ලබන නිශ්චිත ක්‍රමවේදයක් හෝ ක්‍රියාමාර්ගයක්" ලෙස හැඳින්විය හැකි ය.

(A definite course or method of action selected (by government, institution, group or individual) from among alternatives and in thelight of given conditions to guide and usually to determine present and future decisions. – Webster Dictionary)

බොහෝ විට ප්‍රතිපත්ති පිළිබඳ ව කථා බහ කිරීමේ දී අවධානය යොමු කරනු ලබන්නේ රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් පමණක් වුව ද පුද්ගලයෙකුට අනන්‍ය වූ ප්‍රතිපත්ති මෙන් ම යම් කණ්ඩායමකට, සංවිධානයකට හෝ ආයතනයකට හෝ පමණක් සීමා වූ ප්‍රතිපත්තීන් ද තිබිය හැකි බව මෙම අර්ථ නිරූපණය මගින් පැහැදිළි වෙයි.

රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් සැළකීමේ දී පුරවැසියන්ට එය බලපාන ආකාරය අනුව පහත සඳහන් පරිදි වර්ග කළ හැකි ය.

- ★ බෙදා හැරීම් සම්බන්ධ ප්‍රතිපත්ති - සුබ සාධන අධ්‍යාපන ආදී ප්‍රතිපත්ති
- ★ පාලනයන් සම්බන්ධ ප්‍රතිපත්ති - වේග සීමාවන්
- ★ ව්‍යවස්ථාව හා සම්බන්ධ ප්‍රතිපත්ති - විධායකය, ව්‍යවස්ථාදායකය හා ශ්‍රේෂ්ඨාධිකරණය
- ★ වෙනත් ප්‍රතිපත්ති - වන ජීවීන් ආරක්ෂාව

සුබ සාධනයට මුල් තැන දෙන රාජ්‍යයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ඉතා ශක්තිමත් සුබ සාධන ප්‍රතිපත්ති පවතියි.දශක කිහිපයක සිට ක්‍රියාත්මකවන නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය ඒ අතර වැදගත් ස්ථානයක් ගනියි. සාක්ෂරතාව, පාසලට ඇතුළුවන්නන්ගේ ප්‍රමාණය, ආදී දර්ශක සංවර්ධිත රටවල අගය ද ඉක්මවා යාමට නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය වැදගත් කාර්යභාර්යයක් ඉටු කළ අතර නොමිලයේ පෙළ පොත් හා නිල ඇඳුම් ලබා දීම, සහන මිලට රාජ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම, අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා ශිෂ්‍යාධාර සැපයීම වැනි සහායක ප්‍රතිපත්ති ද විශාල බලපෑමක් කර ඇත. අධ්‍යාපනය සම්බන්ධ ප්‍රතිපත්ති මෙන් ම නිදහස් සෞඛ්‍ය ප්‍රතිපත්තීන් මගින් සෞඛ්‍යයට අදාළ දර්ශක ද ඉහළ මට්ටමක පවත්වා ගැනීමට ශ්‍රී ලංකාව සමත් වී ඇත. සෞඛ්‍ය දර්ශක ඉහළ මට්ටමක පැවතීම අධ්‍යාපන පද්ධතියට ශක්තියක් වන අතර සාක්ෂරතාව ඉහළ අගයක් වීම වැනි හේතූන් සෞඛ්‍ය දර්ශක ඉහළ නංවාලීමට සෘජුව ම දායක වේ. මෙලෙස එක් එක් ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්තීන් එම ක්ෂේත්‍රයේ සංවර්ධනයට මෙන් ම සමස්ත ප්‍රතිපත්ති රාමුව රටෙහි සංවර්ධනයට බලපායි. මේ අනුව රටක් වශයෙන් ද අධ්‍යාපන පද්ධතිය වශයෙන් ද සළකන විට ශ්‍රී ලංකාවට ඉතා හිතකර ප්‍රතිපත්ති රාමුවක් පවතින අතර එය ළමා මිතුරු මෙන් ම තවදුරටත් ළමා මිතුරු බව වර්ධනය කර ගැනීමට සහාය සපයන්නක් ද වෙයි.

## රෙගුලාසි

ශක්තිමත් රාජ්‍ය ප්‍රතිපත්ති පැවතීම මෙන් ම ඒවා ක්‍රියාත්මකවීම ද එක සේ වැදගත් වේ. එහෙයින් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ දී එය නෛතික වශයෙන් බල ගැන්වීම අවශ්‍ය වේ. රෙගුලාසියක් යනු ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් වන නෛතික බල ගැන්වීම වේ. මෙසේ ප්‍රතිපත්ති නෛතික වශයෙන් බල ගැන්වීම ආකාර කිහිපයකට සිදු වේ. එනම්,

- ★ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු වීම
- ★ පාර්ලිමේන්තු පනතක් ලෙස සම්මත කිරීම
- ★ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම
- ★ අධිකරණ තීන්දු
- ★ චක්‍රලේඛ ආදී වශයෙනි

## පරිචයන්

නෛතික වශයෙන් බල ගැන්වීමක් සිදු නොවුව ද සමහර ප්‍රතිපත්ති රීතීන් ලෙස හෝ කාලයක් මුළුල්ලේ පුරුද්දක් ලෙස පැවත එම නිසා පිළිපැදීම හෝ ක්‍රියාත්මක වීම සිදු වේ. පාසලක සැඟවුණු විෂයමාලාව හා බැඳුනු ප්‍රතිපත්ති මෙබඳු පරිචයන් සඳහා නිදසුන් වේ.

## නිර්ණායක

ළමා මිතුරු පාසලක හයවන මානය සඳහා හඳුනාගත් නිර්ණායක පහකි.

1. රාජ්‍ය ප්‍රතිපත්ති රෙගුලාසි හා ඒවා ක්‍රියාත්මක කිරීම ළමා මිතුරු පාසල සංවර්ධනය සඳහා උපකාරී වේ.
2. අදාළ සියලු රාජ්‍ය ආයතන අතර හැම මට්ටම්වල දී ම ඵලදායී සම්බන්ධීකරණයක් පවතියි.
3. විවිධ මට්ටම්වල දී මූල්‍ය සම්පත් උචිත ලෙස ප්‍රදානය කෙරේ.
4. ගුණාත්මක තාක්ෂණික ආධාර පද්ධති සියලු ම මට්ටම්වල දී පවතියි.
5. විෂය මාලාවෙහි පෙළ පොත්වල හා ගුරු උපදේශන සංග්‍රහවල ළමා මිතුරු මූලධර්ම අන්තර්ගත වේ.

# පළමුවන නිර්ණායකය

### රාජ්‍ය ප්‍රතිපත්ති රෙගුලාසි හා ඒවා ක්‍රියාත්මක කිරීම ළමා මිතුරු පාසල සංවර්ධනය සඳහා උපකාරී වේ.

රජය විසින් ප්‍රතිපත්ති සම්පාදනය මෙන් ම එම රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීම ද අවශ්‍ය වේ.

ඒ සඳහා එම ප්‍රතිපත්තියට අදාළවන සෑම තලයක දී ම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන යාන්ත්‍රණයන් පැවතිය යුතු වේ. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, ක්‍රියාත්මකවන ආකාරය සොයා බැලීම (නියාමනය) හා සමාලෝචනය මගින් සංශෝධනය විය යුතු කරුණු හඳුනා ගැනීම ද එම යාන්ත්‍රණයේ අඩංගු වේ.

ජාතික මට්ටමේ සිට පාසල දක්වා ම මෙබඳු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන්නේ නම් ප්‍රතිපත්තීන් සහ ක්‍රියාත්මක තත්ත්වය අතර පරතර අවම කර ගත හැකි ය. එනම් ප්‍රතිපත්ති මගින් ඉටු කර ගැනීමට අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීම සිදු වේ. ළමා මිතුරු රාජ්‍ය ප්‍රතිපත්ති සකස් වී ඇති අප රටෙහි පාසල්වල ළමා මිතුරුභාවය සංවර්ධනය කර ගැනීමට එම ප්‍රතිපත්ති උචිත ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සෑම පාසලක ම වගකීම වේ.

## දෙවන නිර්ණායකය

### අදාළ සියලු රාජ්‍ය ආයතන අතර හැම මට්ටම්වල දී ම ඵලදායී සම්බන්ධීකරණයක් පවතියි.

ශ්‍රී ලංකාවේ ළමයින්ගේ සුබ සිද්ධිය වෙනුවෙන් ක්‍රියාත්මක වන අමාත්‍යාංශ හා ආයතන රාශියකි.

මේ සෑම ආයතනයක් විසින් ම තම තමන්ගේ විෂය පථයට අදාළ ව දරුවන් වෙනුවෙන් විශාල කාර්යභාර්යයක් ඉටු කරයි. එම කාර්යයන් අතර මනා සම්බන්ධීකරණයන් පවතින්නේ නම් අපේක්ෂිත ප්‍රතිඵල වඩාත් ඵලදායී මෙන් ම අර්ථවත් ද වේ. ළමා මිතුරු පාසල ළමයින් වෙනුවෙන් කටයුතු කරන ආයතන හා ඒවායේ විෂය පථයන් නිවරැදි ව හඳුනා ගනිමින් හා මනා සම්බන්ධීකරණයන් පවත්වා ගනිමින් තම පාසලේ ළමා මිතුරු තත්ත්වයන් සංවර්ධනයට මෙම ආයතනවල සහාය ලබා ගනියි.

## තුන්වන නිර්ණායකය

### විවිධ මට්ටම්වල දී මූල්‍ය සම්පත් උචිත ලෙස ප්‍රදානය කෙරේ.

අධ්‍යාපන අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ සියලු ආයතනවල 2006 වර්ෂයේ සිට ආංශික සංවර්ධන ප්‍රවේශ රාමුවක් ක්‍රියාත්මක වන අතර එය අධ්‍යාපන ආංශික සංවර්ධන ප්‍රවේශ රාමුව හා වැඩසටහන (Education Sectorwide Development Framework and Programme) ලෙස හඳුන්වයි.

පාසල් මට්ටමේ සිට කලාප, පළාත් හා ජාතික මට්ටම දක්වා ම මෙම ප්‍රවේශ රාමුව ක්‍රියාත්මක වන අතර එය පහත සඳහන් පරිදි ප්‍රධාන තේමා හතරකින් සමන්විත වේ.

1. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා සම සාධාරණ ප්‍රවේශ අවස්ථා හා සහභාගිත්වය වැඩිදියුණු කිරීම.
2. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය දියුණු කිරීම.
3. සම්පත් බෙදා හැරීමේ දී සම සාධාරණත්වය හා කාර්යක්ෂමතාව තහවුරු කිරීම.
4. අධ්‍යාපනයේ යහ පාලනය හා සේවා සැපයීම් ශක්තිමත් කිරීම.

අධ්‍යාපන පද්ධතියේ පවතින සෑම ආයතනයක් ම මෙම තේමා හතරට අනුගතව තම වාර්ෂික සංවර්ධන සැලැස්ම හා මධ්‍ය කාලීන සැලසුම් ඉදිරිපත් කළ යුතු අතර ඒ අනුව අදාළ ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම සිදු වේ. ළමා මිතුරු පාසල ද මෙම ප්‍රවේශ රාමුවට අනුගත වී පාසල් ස්වයං තක්සේරුකරණය මගින් හඳුනාගන්නා ප්‍රමුඛතා මත පාසල් සංවර්ධන සැලැස්ම සකස් කරනු ලැබේ. ඒ අනුව මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමටත් සැලැස්ම අනුව ක්‍රියාත්මක වීමටත් ළමා මිතුරු පාසලට හැකි වේ.

# හතරවන නිර්ණායකය

## ගුණාත්මක තාක්ෂණික ආධාර පද්ධති සියලුම මට්ටම්වලදී පවතී.

අධ්‍යාපනය යනු නිරන්තරයෙන් ම නව දැනුම එකතුවන ක්ෂේත්‍රයක් බැවින් පාසල් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලෙන පුද්ගලයින්ගේ දැනුම යාවත්කාලීන වීම ඉතා වැදගත් වේ.

ස්වයං ඉගෙනුම මගින් මෙන් ම ශබ්‍යතා වර්ධන වැඩසටහන් තුළින් ද මෙම යාවත්කාලීන වීම සිදු වේ. මේ සඳහා සෑම මට්ටමක දී ම අවස්ථා සම්පාදනය වී තිබීම ඉතා වැදගත් ය. තම පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා නිවරැදි ව හඳුනා ගැනීමත් එම අවශ්‍යතා

සපිරෙන පරිදි අවස්ථා සම්පාදනය කිරීම පාසලෙහි මූලික වගකීමකි

එලෙසම අනෙකුත් සියලුම තල විසින් පාසල් මට්ටමේ සංවර්ධනය සඳහා උචිත ක්‍රමෝපායයන් හඳුනා ගෙන සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ. විවිධ මට්ටම් මගින් තම පාසල වෙත ලබා ගත හැකි ගුණාත්මක තාක්ෂණික ආධාර පද්ධතීන් නිවැරැදි ව හඳුනා ගැනීමත් සියලු ම පාර්ශවකරුවන්ගේ සංවර්ධනය සඳහා එම තාක්ෂණික සහායයන් ඵලදායී ලෙස යොදා ගැනීමත් ළමා මිතුරු පාසලේ එක් කාර්යයභාරයක් වේ.

# පස්වන නිර්ණායකය

## විෂය මාලාවෙහි පෙළ පොත්වල හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ළමා මිතුරු මූලධර්ම අන්තර්ගත වේ.

ජාතික පොදු අරමුණු කරා ළඟා වීම සඳහා පාසල් අධ්‍යාපනය මගින් සංවර්ධනය කළ යුතු නිපුණතා හඳුන්වා දී ඇති අතර එම නිපුණතා පාදක කර ගනිමින් විෂයමාලාව සකස් කර ඇත.

විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන්, පෙළ පොත්, වැඩ පොත් වැනි විෂයමාලා ද්‍රව්‍ය උපයෝගී

කර ගෙන පාසලේ ක්‍රියාත්මක කරනු ලබන අධ්‍යාපන ක්‍රියාවලිය සෑම ළමයකුගේ ම අවශ්‍යතා සපිරෙන පරිදි ක්‍රියාත්මක විය යුතු වේ. සෑම විෂයකට ම අදාළ ව විෂය නිර්දේශ තුළ පවතින ළමා මිතුරු ලක්ෂණ ඉස්මතු කර ගනිමින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම පාසලේ වගකීමකි. එමගින් පාසලෙහි ළමා මිතුරු බව වඩාත් තහවුරු වේ.

හත්වන පරිච්ඡේදය

# පාසල් ස්වයං තක්සේරුකරණය

## හැඳින්වීම

ළමා මිතුරු පාසලක් ලෙස තම පාසල සංවර්ධනය කර ගැනීමේ දී ප්‍රජාව, සිසුන් හා ගුරු මණ්ඩලයේ සෘජු දායකත්වය ලැබිය යුතු බව මීට පෙර පරිච්ඡේදයේ දී ද ඉදිරිපත් විය.

මෙය ඉටු කර ගැනීම සඳහා පාසල කෙසේ ක්‍රියාකාරී විය යුතු ද යන්න පැහැදිලි කිරීම මෙම පරිච්ඡේදයෙන් අපේක්ෂා කෙරෙයි. පාසලේ සියලු ම කණ්ඩායම් "ළමා මිතුරු පාසල" යනු කුමක් ද යන්න මැනවින් අවබෝධ කර ගැනීම මෙහි මූලික පියවර වේ. මෙම කාර්යෙහි ලා ප්‍රධාන වගකීම පැවරෙන්නේ විදුහල්පතිවරයාට ය. මෙය දැනුවත් කිරීමකට වඩා පාසලේ සියලු ම කණ්ඩායම්වලට ළමා මිතුරු පාසල යන්න දැනෙන්නට සැලැස්වීමක් ලෙස හැඳින්වීම වඩා නිවැරදි ය. එබැවින් මෙය සංවේදීකරණය ලෙස හැඳින්වීම වඩාත් උචිත වේ. දැනුවත් කිරීමකට වඩා පුළුල් අරමුණක් සංවේදීකරණය තුළින් අපේක්ෂිත ය. සංවේදීකරණය තුළින් දැනුවත් වීම, සහභාගි වීම, ක්‍රියාත්මක වීම සහ ඇගයීම යන සියලු ම අංශ සඳහා යොමු කිරීමක් සිදු වේ

## සංවේදීකරණය සඳහා අනුගමනය කළ යුතු පියවර

විදුහල්පතිවරයා මෙහි දී ප්‍රධානත්වය ගත යුතු ය. එහි දී පාසලේ ගුරුවරුන් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය, දෙමාපියන්, ආදි ශිෂ්‍යයින්, සුබ පතන්නන් හා පාසල අවට ප්‍රජාව වැනි සියලු ම කණ්ඩායම් රැස් කර ඔවුන්ට තම පාසලෙහි සංවර්ධනාත්මක අවශ්‍යතාව පැහැදලි කර ඒ සඳහා ළමා මිතුරු ප්‍රවේශයක් අනුගමනය කළ යුතු බව අවධාරණය කරන්න. පාසල, පාසල් ප්‍රජාවගේ ය. පාසලක කාර්යභාරයයේ ප්‍රතිලාභ ලබන්නේ පාසල් ප්‍රජාවයි. "පාසල අපගේ ය" යන හැඟීම ඇති වූ විට පාසල් ප්‍රජාව පාසලේ කාර්යභාර්යයට උර දීමට නොපැකිල ව එකතු වේ.


ළමා මිතුරු සංකල්පය පිළිබඳ ව පාසල් ප්‍රජාවේ සාර්ථක සංවේදීකරණය එම වැඩසටහන දියත් කිරීම සඳහා ශක්තිමත් පදනමක් ගොඩ නගයි.

## එක් පාසලක විදුහල්පතිවරයෙක් පාසල් ප්‍රජාව සංවේදීකරණය ආරම්භ කළ ආකාරය

අපේ පාසලෙහි තව දුරටත් දියුණු කළ යුතු දේ බොහෝ ඇති බව මට හැඟී තිබෙනවා. මා හිතනවා ඔබත් මා සමග එකඟ වෙයි කියා. මේ දරුවන් හැම දෙනාට ම හිතෙනවා ඇති අපේ පාසල මෙන්න මේ වගේ උනොත් හොඳයි කියා නේ ද? දරුවනේ ඔයගොල්ලො කැමති ඇති පාසල් වත්ත ලස්සනට තියෙනවා බලන්න. ඒ වගේ ම දෙමව්පියෝ කැමති ඇති තමන්ගේ දරුවන්ට පිරිසිදු බොන වතුර පාසලේ තියෙනවා නම්. ගුරු මණ්ඩලය හිතනවා ඇති හැම දරුවකු ම දිනපතා පාසල් එනවා දකින්න. ඉතින් මේ වගේ දේවල් ගැන කල්පනා කරන විට හැම දෙනාට ම ඇති තමන්ගේ පාසල මෙසේ විය යුතු යැයි හිතන විදිහක්, තවත් විදියකට කිව්වොත් තමන්ගේ "සිහින පාසල්" මැවෙනවා ඇති. මං අද කියන්න යන්නේ අපි හැම දෙනාට ම මේ සිහින පාසලට ළඟා වෙන්න හොඳ මාර්ගයක් පෑදිලා තියෙනවා. අපිට "ළමා මිතුරු පාසල්" කියල අලුත් අදහසක් ලැබිලා තියෙනවා. ඒ අදහස අනුව බලන විට අපි මීට කලින් නොහිතපු හුඟාක් දේවල් ගැන අවධානය යොමු කරන්න අපිව මෙහෙයවනවා. ළමා මිතුරු පාසල් වැඩසටහන ගැන දැන ගන්න අපි මේ පෝස්ටර් ටික / වීඩියෝ පටය බලලා ඉඳිමු.

පාසල් ප්‍රජාවේ සියලු ම පාර්ශවකරුවන් සංවේදීකරණය කිරීමෙන් පසු ඔවුන්ගේ කැමැත්ත මත පාසල් ස්වයං තක්සේරුකරණය සඳහා නියෝජිත කණ්ඩායමක් තෝරා ගැනීම අවශ්‍ය වේ.

සියලු පාසල් ප්‍රජාව නියෝජනය වන මේ කණ්ඩායම පාසලට ගැළපෙන පරිදි 10-25 දක්වා කණ්ඩායමක් වීම වඩාත් සුදුසු ය.



ශ්‍රී ලංකාවේ පාසල්වල ළමා මිතුරු පරිසරයක් සඳහා පැවතිය යුතු තත්ත්ව දැක්වෙන නිර්ණායක හා දර්ශක ඇමිණුම 3 යටතේ දක්වා ඇත. සුදුසු ක්‍රමවේද මගින් මේ පිළිබඳ ව මනා අවබෝධයක් මේ නියෝජිත කණ්ඩායමට ලබා දිය යුතු ය. එහි දී ළමා මිතුරු පාසලක් මාන 6 ක් ඔස්සේ සංවර්ධනය විය යුතු බව පැහැදිලි කළ යුතු වේ. මෙහි දී ළමා අයිතිවාසිකම්, පාසලේ කාර්ය සඳහා පාසල් ප්‍රජාව මූලිකත්වය ගැනීම වැනි කරුණු වඩාත් ඉස්මතු වන සේ විවිධ ක්‍රමවේද උපයෝගී කර ගනිමින් මේ පාසල් නියෝජිත කණ්ඩායම දැනුවත් කිරීම සුදුසුය. මේ සඳහා පළාත් හෝ කලාප මට්ටමේ සම්පත් පුද්ගල කණ්ඩායම්වල සහාය ලබා ගත හැකි ය. මෙවැනි ආරම්භයකට පසු අවශ්‍ය වන්නේ ළමා මිතුරු පාසලක ලක්ෂණ හඳුන්වා දීමය. පැමිණි පිරිසට එක් එක් මානය ප්‍රදර්ශනය වන ආකාරයට සුදුසු ක්‍රමවේදයක් මගින් මෙය ඉදිරිපත් කළ යුතු ය. මෙම ඉදිරිපත් කිරීම්වල දී සහභාගී වන්නන්ට යම් ගැටලුවක් මතු වුවහොත් ප්‍රශ්න විමසීමට අවස්ථාව ලබා දිය යුතු වේ.

## පාසල් ස්වයං තක්සේරුකරණ ක්‍රියාවලියේ පියවර

ළමා මිතුරු පාසල පිළිබඳ ව පාසල් ප්‍රජාව සංවේදීකරණය

↓

සියලු පාසල් ප්‍රජාව නියෝජනය වන ලෙස කණ්ඩායමක් තෝරා ගැනීම

↓

ළමා මිතුරු පාසල් සංකල්පය, මාන හා නිර්ණායක පිළිබඳ නියෝජිත කණ්ඩායම දැනුවත් කිරීම

↓

නියෝජිත කණ්ඩායම විසින් ළමා මිතුරු පාසල් නිර්ණායක හා දර්ශකවලට අදාළ ව තම පාසලේ පවතින තත්ත්වය තක්සේරු කිරීම

↓

තක්සේරු කිරීමෙන් ලබා ගත් දත්ත පිළිබඳ ව සාකච්ඡා කිරීම හා ප්‍රමුඛතා තීරණය කිරීම

↓

ප්‍රමුඛතා අනුව එම අවශ්‍යතා සපුරන පාසල් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම

↓

සැලසුම ක්‍රියාත්මක කිරීම

↓

නියාමනය

↓

ඇගයීම

ළමා මිතුරු පාසලක සිසුන්ට, ගුරුවරුන්ට, දෙමාපියන්ට සහ පාසලට සම්බන්ධ සියලු ම පාර්ශවයන්ට පාසල තව දුරටත් සංවර්ධනය කිරීමේ සැබෑ උවමනාවක් ඇත.

පාසලේ සැබෑ අවශ්‍යතා හඳුනා ගන්නේ පාසලයි. එම නිසා පාසල තව දුරටත් සංවර්ධනය කිරීමට මේ හැම දෙනා ම සතු ශක්තිය, දැනුම් සම්භාරය සහ කුසලතා මෙන් ම පාසල ගැන ඇති උනන්දුව ද එක් තැන් කිරීම සඳහා පාසල් ස්වයං තක්සේරුව වැදගත් වේ.

පාසල් ස්වයං තක්සේරුකරණයේ දී සිසුන් එක් කණ්ඩායමක් ලෙසත් ගුරුවරුන් තවත් කණ්ඩායමක් ලෙසත් දෙමාපියන් වෙනත් කණ්ඩායමක් ලෙසත් වෙන වෙන ම පාසලේ තත්ත්වය ළමා මිතුරු පාසල් නිර්ණායක අනුව සසඳා බැලීම සිදු වේ. අනතුරු ව තම තමන්ගේ තක්සේරුව සියලු දෙනා වෙත ඉදිරිපත් කෙරේ. මෙහි දී සමහර තත්ත්ව සම්බන්ධයෙන් බොහෝ වෙනස් තක්සේරු මට්ටම් තිබිය හැකි ය. මෙවැනි තත්ත්ව මේ වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක කර ගෙන යාම සඳහා බාධාවක් කර නොගත යුතු ය. එවැනි අවස්ථාවල දී මේ පිළිබඳ ව ඉතා හොඳින් සොයා බැලීම සඳහා කලාප සම්පත් කණ්ඩායම සටහන් පවත්වා ගැනීම අවශ්‍ය වේ. පසු ව එවැනි තත්ත්ව පිළිබඳ ව හොඳින් කරුණු සොයා බලා විග්‍රහයක් කිරීම අවශ්‍ය වේ.

**එක් නිදසුනක් බලමු.**

## ළමා මිතුරු පාසල් නිර්ණායකය

පාසලින් ගිලිහෙන්නන් වැළැක්වීම සඳහාත් පාසල් නොඑන ළමයින් පිළිබඳ ව සොයා බැලීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහාත් ඵලදායී යාන්ත්‍රණ තිබේ. භාවිත කෙරේ.

මෙම නිර්ණායකය කරා ළඟා වීම සඳහා විවිධ වැඩ සටහන් පාසලේ ක්‍රියාත්මක වනු ඇත. ඒ අනුව මෙම නිර්ණායකය යටතේ ලබා දී ඇති දර්ශක ඔස්සේ තම පාසල පවතින තත්ත්වය වාර්තා කිරීම පාසල් ස්වයං තක්සේරුකරණයේ දී සිදු වේ. එය සිදුකරන ආකාරය පහත දක්වා ඇත.

### දර්ශකය:

පාසලින් ගිලිහෙන්නන් හා පාසල් නොඑන ළමයින් සඳහා පාසලේ ක්‍රියාකාරී කමිටුවක් තිබේ.

මේ දර්ශකය අනුව පාසල් නොඑන හා ගිලිහෙන ළමයින් පිළිබඳ ව සොයා බැලීම සඳහා ක්‍රියාකාරී කමිටුවක් පාසලේ සිටී ද යන්න සොයා බැලිය යුතු ය. සිටී නම් එම කමිටුවේ සංයුතිය හා ක්‍රියාකාරීත්වය පිළිබඳ ව සොයා බැලිය යුතු ය. එවැනි සොයා බැලීමකින් පසු ඒ පිළිබඳ ව වාර්තා කළ යුතු ය.

### දර්ශකය :

පෝෂක ප්‍රදේශයේ සිටින සියලු ළමයින් පාසල්වලට ඇතුළත් වී ඇති දැයි දනිති.

මෙම දර්ශකය අනුව පාසලට ඇතුළත් නොවුණු ළමයින් එසේ ඇතුළත් නොවීම සඳහා බලපාන හේතු සොයා බැලීමත් එම ළමයින්ට උදව් කිරීම සඳහා සුදුසු ක්‍රමවේද සැලසුම් කිරීමත් පාසලේ සිදු විය යුතු ය. එසේ ම එම සැලසුම් ක්‍රියාත්මක කිරීම නිසා එම දරුවන් පාසලට ඇතුළත් වී සිදු ව ඇති වෙනස් වීම් පිළිබඳ ව පාසල දැනුවත් වී සිටිය යුතු ය.



## දර්ශකය:

එක් එක් ළමයා පිළිබඳ දත්ත (පන්ති භාර ගුරුවරුන් විසින් පවත්වා ගෙන යනු ලබන පැමිණීමේ ලේඛන හා නිරීක්ෂණ) පාසලේ ඇත. අවදානම් සහිත ළමයින් කවුරුන් දැයි දනිති.

එහි දී ඒ ඒ ළමයා ගිලිහී යාමේ අවදානම් සඳහා හේතු දනිති. අවදානම් සහිත ළමයින්ට උදව් කළ හැකි දැයි සාකච්ඡා කරති. ඒ ඒ ළමයාට පාසලට පැමිණීමට උදව් කිරීම සදහා නිශ්චිත හා උචිත ක්‍රියාකාරකම් සැලසුම් කරති. ඔවුන්ගේ ක්‍රියාකාරකම්වල බලපෑම ඇගයීමට ලක් කරති.

මේ දර්ශකය අනුව ගිලිහී යාමේ අවදානම් සහිත සිසුන් පිළිබඳ ව පාසල සොයා බැලීම් සිදු කළ යුතු ආකාරය පිළිබඳ ව පැහැදිළි වැඩ සටහනක් තිබිය යුතු ය. මේ උදාහරණයෙහි දක්වා ඇති අන්දමට දර්ශකවලට අනුකූල ව පාසලේ පවතින තත්ත්වය පිළිබඳ ව ස්වයං තක්සේරුවක් පාසල් ප්‍රජාවේ නියෝජිත කණ්ඩායම විසින් සිදු කරනු ඇත. අනතුරු ව සියලු කණ්ඩායම්වල තක්සේරු වාර්තා සැලකිල්ලට ගනිමින් පාසල පිළිබඳ ව අවසාන ස්වයං තක්සේරු වාර්තාව සකස් කරනු ඇත.

ඉන්පසු නැවත වෙන වෙන ම කණ්ඩායම් වශයෙන් එකතු වී පාසල සංවර්ධනය විය යුතු මට්ටම් සාකච්ඡා කරනු ඇත. ඒ අනුව ප්‍රමුඛතා ලේඛන සකස් කරනු ඇත. සිසුන්, ගුරුවරුන්, දෙමාපියන් ඇතුළු පාසල් ප්‍රජාවේ අනෙකුත් අය තම කණ්ඩායම් සකස් කරන ලද ප්‍රමුඛතා ලේඛන ඉදිරිපත් කරනු ඇත. මෙහි දී එක් එක් කණ්ඩායම්වල ප්‍රමුඛතා වෙනස් විය හැකි ය. මෙම ප්‍රමුඛතාවලින් යම් කොටසක් හෝ ආවරණය වන ආකාරයට පාසල ක්‍රියාත්මක වීම සිදු කළ හැකි වන්නේ කෙසේ දැයි තීරණය කිරීම මේ වැඩ පිළිවෙළේ ඊළඟ අවස්ථාව වේ. මේ සඳහා මේ ප්‍රමුඛතා ආවරණය වන පරිදි පාසල් සංවර්ධන සැලැස්ම සකස් කළ යුතු ය. එහි දී,

- ★ දැනටමත් හොඳින් ක්‍රියාත්මක වන එනිසා ප්‍රවර්ධන සහ තිරසර බවක් කරා යා යුතු ක්‍රියාකාරකම්.
- ★ දැනට ක්‍රියාත්මක නොවන, එහෙත් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් හඳුනා ගනු ඇත.

එහි දී සියලු ම කණ්ඩායම් ඉදිරිපත් කරන ලද ප්‍රමුඛතාවලින් අවම වශයෙන් එකක් හෝ ඇතුළත් වීම යෝග්‍ය වේ.

පාසල් සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ දී ද පාසල් ස්වයං තක්සේරුව සඳහා සහභාගී වූ සියලු කණ්ඩායම්වල සහභාගිත්වය තිබිය යුතු ය.

මෙම සාකච්ඡාවල දී අපේක්ෂිත සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී පැන නැගිය හැකි විවිධ බාධක හා ගැටලු හඳුනා ගැනීම අවශ්‍ය වේ. අනතුරු ව ඒවා විසඳා ගැනීමට උපාය මාර්ග ද සාකච්ඡා කිරීම අවශ්‍ය වේ. පාසල් ප්‍රජාවේ සියලු පාර්ශව නියෝජනය වන කණ්ඩායමක් මේ ක්‍රියාකාරකමෙහි නියුක්ත වීම නිසා බොහෝ අදහස් ලබා ගැනීමට හැකි වනු ඇත. විශේෂයෙන් පාසල් සිසුන්, දෙමාපියන්, ගුරුවරුන් විවිධ කෝණ ඔස්සේ තම අදහස් ඉදිරිපත් කිරීම මෙහි විශේෂත්වයක් වේ.

**හැම දෙනාගේ ම සහභාගිත්වය තුළින් විවිධ නිර්ණායක ඔස්සේ පාසල සංවර්ධනය සඳහා හඳුනා ගත් ඉලක්ක කරා පාසල ගෙන යාමේ වගකීම දරන්නේ පාසල් ප්‍රජාව යි.**

පාසල් ප්‍රජාව පාසලේ ස්වයං තක්සේරුකරණයට හා ඒ අනුව සකස් කෙරෙන පාසල් සංවර්ධන සැලැස්මට එක් වීම වැදගත් වන්නේ සහභාගිත්වය, ප්‍රවේශය මෙන් ම පාසල වෙනුවෙන් තීරණ ගැනීමට ඔවුනට ඇති අයිතිය ද තහවුරු වන බැවිනි. ගුරුවරුන්, සිසුන්, දෙමාපියන් සහ ප්‍රජාවේ අනෙකුත් කොටස් මෙසේ පාසල වෙනුවෙන් තීරණ ගැනීම තුළින් පාසල් කළමනාකරණය හරහා තිරසර වෙනසක් සඳහා දායක වීමට ද ඔවුනට අවස්ථාව උදා වේ.

තමන් අපේක්ෂා කරන අනාගත පාසල කරා යන ගමන සඳහා පාසල් ප්‍රජා නියෝජිත කණ්ඩායම හඳුනා ගත් ප්‍රමුඛතා අනුව පාසල් සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ දී අවශ්‍ය විවිධ දත්ත හඳුනා ගෙන එම දත්ත විශ්ලේෂණය කිරීම තුළින් වඩාත් ඵලදායී සැලැස්මක් සකස් කිරීම පහසු වනු ඇත.

## නිදසුන්

★ පළමු ශ්‍රේණියට ඇතුළත් වන ළමුන් සංඛ්‍යාව වැඩි කර ගැනීම තම අනාගත පාසලේ එක් අපේක්ෂාවක් ලෙස සිතමු.

වසර කිහිපයක් තුළ පාසලේ පළමු ශ්‍රේණියට ඇතුළත් වී ඇති සංඛ්‍යා නාමලේඛන දත්ත ඇසුරෙන් සොයා ගත යුතු ය.

එම වසරවල පාසලේ පෝෂිත ප්‍රදේශය තුළ සිටි පළමු ශ්‍රේණියට ඇතුළත් විය යුතු දරුවන් වෙනත් පාසල්වලට ඇතුළත් වී ඇත් ද යන්න හෝ පාසලකට ඇතුළත් වී නැත් ද වැනි තොරතුරු සපයා ගත යුතු ය. මේ සඳහා පාසල් කමිටුවට ප්‍රදේශයේ අනිවාර්ය පාසල් පැමිණීමේ කමිටුවේ දත්ත ලබා ගත හැකි ය. මේ දත්ත විශ්ලේෂණය මගින් අනාගතයේ දී තම පාසලේ පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් වීම වැඩි කර ගැනීම සඳහා යන ගමනේ දී මතුවන අභියෝග හා ගැටලු හඳුනා ගත හැකි ය. එමෙන් ම එම ගැටලු හා අභියෝග ජය ගැනීම සඳහා අවශ්‍ය උපාය මාර්ග සාකච්ඡා කර හඳුනා ගත යුතු ය. ඊළඟ පියවර වන්නේ මේ උපාය මාර්ග පදනම් කර ගනිමින් පාසල සඳහා පාසල් සංවර්ධන සැලැස්ම සකස් කර ගැනීමයි. මෙය සාමාන්‍යයෙන් පස් අවුරුදු සැලැස්මක් වන අතර එහි කොටසක් ලෙස වාර්ෂික පාසල් සංවර්ධන සැලැස්ම වඩා සවිස්තරාත්මක ව සකස් කර ගනු ලැබේ. පාසල් වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කර ගැනීමෙන් පසු එය ක්‍රියාත්මක කළ යුතු වේ.

ක්‍රියාකාරකම් සඳහා වගකීම් තීරණය කිරීමේ දී එම වගකීම යම් ප්‍රජා කණ්ඩායමකට පැවරේ. තමන්ගේ භූමිකා හඳුනාගෙන තම කාර්යභාර්යය නියමිත කාල රාමුවට අනුව ඉටු කිරීම එම කණ්ඩායමේ වගකීම යි.

එම නිසා තමන් පිහිටුවා ගත් ඉලක්ක හා කාල සීමාවන් අනුව තම ක්‍රියාකාරකම ඉටුවේ දැයි නිරන්තරයෙන් නියාමනය කිරීම ද එම කණ්ඩායමේ වගකීමයි. එහි දී සැලැස්මේ එම ක්‍රියාකාරකම සඳහා හඳුනාගෙන ඇති කාර්ය සාධන දර්ශක පදනම් කර ගත යුතු වේ.

මෙසේ එම කණ්ඩායම විසින් ම අඛණ්ඩ ව නියාමනය සිදු කරන අතර මාස තුනකට වරක් පාසල් නියෝජිත කණ්ඩායම වෙත ප්‍රගති වාර්තාවක් සැපයිය යුතු වේ. පාසල් නියෝජිත කණ්ඩායම අදාළ සියලු ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ලබාගෙන ප්‍රගති සමාලෝචනය හා විමර්ශනය කිරීම අවශ්‍ය වේ. එම ප්‍රගති සමාලෝචන හා විමර්ශන මගින් අදාළ කණ්ඩායමට අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා ගත හැකි ය.

මාස හයකට වරක් සමස්ත පාසල් ප්‍රජාව සමග රැස්වීමක්/වැඩමුළුවක්/වැඩ සටහනක් පැවැත්වෙන අතර එහි දී පාසල් සංවර්ධන සැලැස්මේ ඉලක්කගත ක්‍රියාකාරකම් නියමිත කාලයට හා නියමිත නිර්ණායකවලට අනුව ඉටු වෙමින් පවතී ද, මතු වී ඇති ගැටලු හා අභියෝග මොනවා ද ආදිය සමාලෝචනය කිරීම අවශ්‍ය වේ.

වර්ෂය අවසානයේ දී නැවතත් මෙලෙස සමස්ත පාසල් ප්‍රජාව හමු වන අතර වාර්ෂික සංවර්ධන සැලැස්ම ඇගැයීමක් සිදු වේ. එසේ ම නැවත පාසල් ස්වයං තක්සේරුකරණ වැඩසටහන ක්‍රියාත්මක කරයි. වාර්ෂික සංවර්ධන සැලැස්ම ඇගයීම තුළින් මතුවන කරුණු හා පාසල් ස්වයං තක්සේරුකරණ වැඩසටහන පදනම් කර ගනිමින් පස් අවුරුදු සැලැස්ම සංශෝධනය කිරීමත් ඒ අනුව නව වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීමත් සිදු වේ. මෙසේ දිගින් දිගට ම චක්‍රීය ක්‍රියාවලියක් ලෙස මෙය ක්‍රියාත්මක වීම තුළ අපේක්ෂිත පාසල කරා ළඟා විය හැකි බව පැහැදිලි ය.

## ළමා මිතුරු පාසල් උපදෙස් සංග්‍රහය සංස්කාරක මණ්ඩලය

### මග පෙන්වීම

එච්.යූ. ප්‍රේමතිලක මහතා - අතිරේක ලේකම්
(අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන) අධ්‍යාපන අමාත්‍යාංශය

එස්.යූ. වීජේරත්න මහතා - අතිරේක ලේකම්
(සැලසුම් හා කාර්ය සාධන සමාලෝචන) අධ්‍යාපන අමාත්‍යාංශය

### මෙහෙයුම් කමිටුව

| | |
|---|---|
| පී.එම්.ඒ.එස්. පණ්ඩිතසේකර මිය | - අධ්‍යාපන අධ්‍යක්ෂ ප්‍රාථමික අධ්‍යාපන-අධ්‍යාපන අමාත්‍යාංශය |
| එච්.පී.එන්. ලක්ෂ්මන් මයා | - අධ්‍යාපන අධ්‍යක්ෂ නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන-අධ්‍යාපන අමාත්‍යාංශය |
| රේණුකා පීරිස් මිය | - අධ්‍යාපන අධ්‍යක්ෂ-සෞඛ්‍යය හා පෝෂණ-අධ්‍යාපන අමාත්‍යාංශය |
| ප්‍රියතා නානායක්කාර මිය | - අධ්‍යාපන අධ්‍යක්ෂ ද්විභාෂා අධ්‍යාපන-අධ්‍යාපන අමාත්‍යාංශය |
| එම්. සභාරංජන් මිය | - අධ්‍යාපන අධ්‍යක්ෂ වතු පාසල්-අධ්‍යාපන අමාත්‍යාංශය |
| චන්ද්‍රා සමරසිංහ මිය | - උපදේශක (විශ්‍රාමික)-අධ්‍යාපන අමාත්‍යාංශය |
| පද්මිණී රණවීර මිය | - අධ්‍යාපන විශේෂඥ-යුනිසෙෆ් ආයතනය |
| රංජනී ජයවර්ධන මිය | - උපදේශක (විශ්‍රාමික)-යුනිසෙෆ් ආයතනය |

### සම්බන්ධීකරණය

පී.එම්.ඒ.එස්. පණ්ඩිතසේකර මිය අධ්‍යාපන අධ්‍යක්ෂ ප්‍රාථමික අධ්‍යාපන - අධ්‍යාපන අමාත්‍යාංශය
Dr. Brenda Haiplik – Chief, Education - Unicef
පද්මිණී රණවීර මිය - අධ්‍යාපන විශේෂඥ -යුනිසෙෆ් ආයතනය

### ලේඛක මණ්ඩලය

| නම | තනතුර | රාජකාරී ලිපිනය |
|---|---|---|
| පී.එම්.ඒ.එස්. පණ්ඩිතසේකර මිය | අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික අධ්‍යාපන) | අධ්‍යාපන අමාත්‍යාංශය |
| ප්‍රියතා නානායක්කාර මිය | අධ්‍යාපන අධ්‍යක්ෂ (ද්විභාෂා අධ්‍යාපන) | අධ්‍යාපන අමාත්‍යාංශය |
| රේණුකා පීරිස් මිය | අධ්‍යාපන අධ්‍යක්ෂ (පාසල් සෞඛ්‍යය හා පෝෂණ) | අධ්‍යාපන අමාත්‍යාංශය |
| එම්. සභාරංජන් මිය | අධ්‍යාපන අධ්‍යක්ෂ (වතු පාසල්) | අධ්‍යාපන අමාත්‍යාංශය |
| එච්.පී.එන්. ලක්ෂ්මන් මයා | අධ්‍යාපන අධ්‍යක්ෂ (නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන) | අධ්‍යාපන අමාත්‍යාංශය |
| පී. විජේසූරිය මිය | අධ්‍යාපන අධ්‍යක්ෂ (මානව සම්පත් හා සංවර්ධන) | අධ්‍යාපන අමාත්‍යාංශය |
| බී.පී. විතානගේ මිය | අධ්‍යාපන අධ්‍යක්ෂ (සැමට අධ්‍යාපන) | අධ්‍යාපන අමාත්‍යාංශය |
| එල්.එන්. විජේසේකර මිය | අධ්‍යාපන අධ්‍යක්ෂ (නියාමන හා කාර්ය සාධන) | අධ්‍යාපන අමාත්‍යාංශය |
| කේ.ඩී.වී. කුමාරි විජේසේකර මිය | අධ්‍යාපන අධ්‍යක්ෂ (ගණිතය) | කලාප අධ්‍යාපන කාර්යාලය ගම්පහ |
| අචාර්ය ඊ.ඒ. සුරනිමල මයා | අධ්‍යක්ෂ (විශ්‍රාමික) | මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය |
| කේ.ඒ.ඩී.පී. සරත්චන්ද්‍ර මයා | අධ්‍යක්ෂ | මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය |
| එස්.ඒ. සුනිල් මයා | අධ්‍යක්ෂ (උපදේශන) | ජාතික අධ්‍යාපන ආයතනය |
| චන්ද්‍රා සෙනවිරත්න මිය | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික) | උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| පද්මිණී රණවීර මිය | අධ්‍යාපන විශේෂඥ | යුනිසෙෆ් |
| රංජනී ජයවර්ධන මිය | උපදේශක (විශ්‍රාමික) | යුනිසෙෆ් |
| Mrs. Elluminata Tukai - | Education Specialist | Unicef |
| Mr. Marc Wetz | Consultant | Unicef |
| චන්ද්‍රා සමරසිංහ මිය | උපදේශක (ප්‍රාථමික අධ්‍යාපන) (විශ්‍රාමික) | අධ්‍යාපන අමාත්‍යාංශය |
| වෛද්‍ය අයේෂා ලොකුබාලසූරිය මිය | ප්‍රජා වෛද්‍ය විශේෂඥ | පවුල් සෞඛ්‍ය කාර්යාංශය-කොළඹ |
| වෛද්‍ය නෙලී රාජරත්න මිය | උපදේශක (පාසල් සෞඛ්‍ය හා පෝෂණ) | අධ්‍යාපන අමාත්‍යාංශය |
| එස්. රත්නායක මිය | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන කාර්යාලය-මහව |
| කේ.ඒ. අමරසිංහ මහතා | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන කාර්යාලය-දෙහිඕවිට |

| **නම** | **තනතුර** | **රාජකාරී ලිපිනය** |
|---|---|---|
| කේ. රංජිත් පද්මසිරි මයා | ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී | මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව-ජාතික අධ්‍යාපන ආයතනය |
| මාලතී මුණසිංහ මිය | ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී | මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමෙන්තුව-ජාතික අධ්‍යාපන ආයතනය |
| එස්.එම්.ආර්. සුදීන් මයා | ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී | මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව-ජාතික අධ්‍යාපන ආයතනය |
| එම්.ආර්.ඩබ්. මද්දුම මයා | ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී | මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව-ජාතික අධ්‍යාපන ආයතනය |
| යු.රත්නායක මයා | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික) | උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| පී.රාමනාදන් මිය | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික) | මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| එම්.පී.එච්. සිල්වා මයා | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික)(විශ්‍රාමික) | බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| ඩබ්.ජේ.පී. කරුණාවතී මිය | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික)(විශ්‍රාමික) | දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| බී.ඒ. කුලවර්ධන මයා | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික)(විශ්‍රාමික) | සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේනතුව |
| ආර්.එම්.ටී. නිශාන්ත මයා | කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ | කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය-පස්සර |
| වයි.එම්. ගුණසිංහ මිය | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික අධ්‍යාපන) | අධ්‍යාපන අමාත්‍යාංශය |
| එච්.අයි.ඩී.ඩී. හෙට්ටිආරච්චි මිය | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (කෘෂිකර්ම) | අධ්‍යාපන අමාත්‍යාංශය |
| ඩබ්.එච්. ජයසේන මයා | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික)(විශ්‍රාමික) | නැගෙනහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| කේ.එම්.පී. තෙන්නකෝන් මිය | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික)(විශ්‍රාමික) | මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| ආර්.පී. බස්නායක මිය | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික)(විශ්‍රාමික) | ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| එම්. ජයතිලක මයා | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික) | කලාප අධ්‍යාපන කාර්යාලය කැකිරාව |
| ඩී.එම්. විමලරත්න මයා | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික) | කලාප අධ්‍යාපන කාර්යාලය-කුරුණෑගල |
| ජේ. වයි විජේසූරිය මිය | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ-නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන | අධ්‍යාපන අමාත්‍යාංශය |
| ඩී.කේ.ඩී රත්නාවතී මිය | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික) -නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන | |
| එච්.ඩබ්.ඩබ්.එම්.එස්.ආර්. රඹුක්වැල්ල මිය | ව්‍යාපෘති නිලධාරී | මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව-ජාතික අධ්‍යාපන ආයතනය |
| ඩබ්.පී.එස්. කුමාර මයා | ව්‍යාපෘති නිලධාරී | මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව-ජාතික අධ්‍යාපන ආයතනය |
| එම්.පී. රණ්බන්ඩා මයා | විදුහල්පති | සුනේත්‍රාදේවි විදුහල ගම්පහ-බස්නාහිර පළාත |
| රංජන් ද සිල්වා මයා | විදුහල්පති | ගල්මුරුව හේරත් ගුණරත්න විද්‍යාලය-වයඹ පළාත |
| සුමිත්‍රා කදුරුගමුව මිය | ගුරු උපදේශක | කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය-දියතලාව |
| එස්.එස්. වීරසිංහ මයා | ගුරු උපදේශක | කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය-පොල්ගහවෙල |
| රෝහිණී චිත්‍රලතා මිය | ගුරු උපදේශක | කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය නාරම්මල |
| එච්.එම්. සුනිල් ප්‍රේමරත්න මයා | ගුරු උපදේශක | කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය මහව |
| පී.එම්.අයි. අංජනී මිය | ගුරු උපදේශක | කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය බිංගිරිය |
| එන්.එම්. මොනිකා මිය | ගුරු උපදේශක | කලාප අධ්‍යාපන කාර්යාලය-පිළියන්දල |
| එස්. හේවාපතිරණ මයා | ගුරු උපදේශක | කලාප අධ්‍යාපන කාර්යාලය-කඹුරුපිටිය |

**පරිගණක ගත කිරීම**

| | | |
|---|---|---|
| එච්.එන්.පී. ජයසිංහ මිය | සංවර්ධන සහකාර | අධ්‍යාපන අමාත්‍යාංශය |
| උපේක්ෂා සරසි අල්මේදා මිය | පරිගණක ක්‍රියාකරු | අධ්‍යාපන අමාත්‍යාංශය |

**විවිධ සහාය**

| | | |
|---|---|---|
| ඒ.ඩී. බාලපටබැඳිගේ මිය | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික අධ්‍යාපන) | අධ්‍යාපන අමාත්‍යාංශය |
| එම්.ඒ.එම්. හේමලතා මිය | කළමනාකරණ සහකාර | අධ්‍යාපන අමාත්‍යාංශය |
| කේ.ඩබ්. අයිරාංගනී මිය | සංවර්ධන සහකාර | අධ්‍යාපන අමාත්‍යාංශය |

# ඇමුණුම 01

**දුරකථන**/தொலைபேசி இல./ **Telephone Nos.**

**අමාත්‍යතුමා**
**Ministerc**
அமைச்சர்
} **2784832**
**Fax: 2784825**

**ලේකම්**
**Secretary**
செயலாளர்
} **2784812**

**කාර්යාලය**
**Office**
அலுவலகம்
} **2785141-50**
**Fax: 2784846**

**ඊමේල්/E-mail** / ஈ-மெயில்: **isurupaya@moe.gov.lk**

**ඔබේ අංකය**
**Your No**
உமது இல
} ........................................

**අධ්‍යාපන අමාත්‍යාංශය**
கல்வி அமைச்சு
**Ministry of Educaton**

**"ඉසුරුපාය"**
**බත්තරමුල්ල.**
**" Isurupaya"**
**Battaramulla**
"இசுருபாயா"
பத்தரமுல்ல.

**මගේ අංකය**
**My No**
எமது.
} **ඊඩී /1/18/2/1**

**දිනය**
**Date**
திகதி.
} **2009 .08. 27**

**සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන් හා,**
**සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත.**

## අවුරුදු 5-14 වයසේ පාසල් නොයන ළමයින් හඳුනා ගැනීම හා පාසල් ගත කිරීම සඳහා පාසල් මට්ටමේ කමිටු පිහිටුවීම

අවු. 5-14 වයසේ සියලුම ළමයින් අධ්‍යාපනයට යොමුවිය යුතු බව ශ්‍රී ලංකාවේ පිළිගත් අධ්‍යාපන ප්‍රතිපත්තියකි. දැනට ප්‍රාථමික අවධියේ අධ්‍යාපනයට යොමුවීමේ අනුපාතය 98% කි. මේ අනුව 2% ක ප්‍රතිශතයක් අධ්‍යාපනයට යොමු නොවීම නිසා සැමට අධ්‍යාපනය 100% දක්වා ඉහළ නැංවීමේ ඉලක්කයට ළඟාවීමට අපහසුවී තිබේ. මෙම තත්ත්වය වළක්වා ගනු පිණිස අවු. 5-14 වයසේ පාසලට ඇතුළත් නොවුන හා පාසලින් ගිලිහුණු ළමයින් හඳුනා ගැනීම, ඔවුන් අධ්‍යාපනයට යොමු කිරීම, අවශ්‍ය පහසුකම් සැලසීම සහ ගිලිහීමට ආසන්න ළමයින් ගිලිහීම වැළැක්වීම සඳහා පාසල් මට්ටමින් ක්‍රියාත්මකවීමේ අවශ්‍යතාවය හඳුනා ගෙන තිබේ.

මේ අනුව එක් එක් පාසල පදනම් කර ගනිමින් පාසල් මට්ටමේ ළමයින්ට අධ්‍යාපන පහසුකම් සැලසීමේ කමිටු පිහිටුවීමට තීරණය කර තිබේ. මෙම කමිටුවල සංයුතිය හා කාර්යභාර්යය පහත දැක්වේ.

## *01. කමිටුවේ නම*

අධ්‍යාපන පහසුකම් සැලසීමේ කමිටුව
සාමාජිකත්ව සංයුතිය :-

1. විදුහල්පති (සභාපති)
2. ප්‍රාථමික හා ද්විතියික අංශ ප්‍රධානීන් - 02
3. ගුරුභවතුන් - 02
4. ශිෂ්‍ය නායකයින් - 02
5. දෙමව්පියන් - 02

- විදුහල්පතිවරයාගේ අධීක්ෂණය යටතේ කමිටුව තෝරා පත් කර ගත යුතු ය. කමිටුව සඳහා දෙමව්පියන් නියෝජනය කරන පුද්ගලයින්, දෙමව්පිය හමුවකදී පත් කර ගැනීම කළ යුතු ය.

***02. කමිටුවේ නිල කාලය*** :- වසර 01 කි.

***03. කමිටු රැස්වීම*** :- පාසල් වාරයකට අවම වශයෙන් දෙවරක් රැස්විය යුතුය.

***04. කමිටු කාර්ය භාරය :***

(අ) පාසල් පෝෂක ප්‍රදේශය හඳුනා ගැනීම, සිතියම් ගත කිරීම හා සමාජ ආර්ථික දත්ත එක්රැස් කිරීම.

(ආ) පාසල් පෝෂක ප්‍රදේශයේ ජීවත්වන පාසල් නොයන ළමයින් හඳුනා ගැනීම හා පාසලට ඇතුළත් කර ගැනීම සඳහා පියවර ගැනීම.

(ඇ) පාසලට ඇතුළත්වී ඇති නමුත් අඛණ්ඩව පාසල් නොපැමිණෙන හා පිළිගත හැකි හේතුවක් නොමැතිව සති 03 කට වඩා වැඩි කාලයක් පාසල් නොපැමිණෙන, ගිලිහීමේ අවදානමට ලක්වී ඇති ළමයින් හඳුනා ගැනීම හා පැමිණීම අඛණ්ඩව පවත්වා ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම.

(ඈ) පාසල් අධ්‍යාපනයෙන් ගිලිහී ගිය සිසුන් නැවත පාසල් ගත කිරීමට කටයුතු කිරීම හා ගිලිහීමට හේතුවන අහිතකර සාධක ඉවත් කිරීම සඳහා කටයුතු කිරීම.

(ඉ) ශිෂ්‍යයන් පිළිබඳ ලබා ගන්නා ලද දත්ත වාර්තාකරණය, විශ්ලේෂණය, තොරතුරු භාවිතය හා පසුවිපරම් කටයුතු ක්‍රමවත්ව පවත්වා ගැනීම. අවශ්‍ය විට එම තොරතුරු ළමයින් පැමිණවීමේ හා පරීක්ෂා කිරීමේ කමිටුව වෙත ලබාදීම.

(ඊ) පාසල තුළ සිසුන්ට මිත්‍රශීලි ප්‍රිය මනාප යහපත් ඉගෙනුම් පරිසරයක් ඇති කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හා අදාළ පාර්ශවයන් දැනුවත් කිරීම.

(උ) අධ්‍යාපනයට බලපාන කරුණු සම්බන්ධව දෙමව්පියන් දැනුවත් කිරීම.

(ඌ) අවශ්‍ය අවස්ථාවල නොවිධිමත් අධ්‍යාපන ව්‍යාපෘති සහායක නිලධාරීන්, ප්‍රාථමික හා විශේෂ අධ්‍යාපන ගුරු උපදේශකවරුන් හා සමෘද්ධි නියාමකවරුන්ගේ සහාය ලබා ගැනීම.

(ඔ) ඉහත සඳහන් කරුණු සපුරාලීම තුළින් සිසුන්ගේ පාසල් අධ්‍යාපනය සාර්ථක කිරීම සඳහා සාමූහිකව කටයුතු කිරීම.

## ***කමිටුව පවත්වා ගතයුතු ලේඛන :-***

1. කමිටු රැස්වීම් - පැමිණීමේ ලේඛන
2. කමිටු රැස්වීම් වාර්තා පොත
3. පාසල් නොයන ළමයින්, පාසලින් ගිලිහුණු ළමයින් හා ගිලිහීමේ අවදානමට ලක්වූ ළමයින් පිළිබඳ තොරතුරු ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම් හා ප්‍රගති සටහන්
4. නීතිමය පසුබිමක් යටතේ හෝ වෙනත් ආයතන මඟින් පාසල්ගත කළ ළමයින් පිළිබඳ වාර්තා
5. ඉහත ශිෂ්‍යයන් පිළිබඳ පසුවිපරම් වාර්තා

- පාසල් කමිටුවේ සාරාංශ වාර්තා තැබීම සඳහා යොදාගත හැකි ආදර්ශ පත්‍රිකා 03 ක් ඇමුණුමේ දක්වා ඇත.

## 05. නියාමනය හා අධීක්ෂණය

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් නොවිධිමත් අධ්‍යාපන සම්බන්ධීකරණ නි.අ.අ/ස.අ.අ, පළාත් ප්‍රාථමික අධ්‍යාපන සම්බන්ධීකරණ නිලධාරි නි.අ.අ/ස.අ.අ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප නොවිධිමත් අධ්‍යාපන සම්බන්ධීකරණ නි.අ.අ/ස.අ.අ, කලාප ප්‍රාථමික අධ්‍යාපන සම්බන්ධීකරණ නි.අ.අ/ස.අ.අ, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නියාමනය හා අධීක්ෂණය කළ යුතුය.

අනිවාර්ය අධ්‍යාපන නියෝග යටතේ පිහිටුවා ඇති කමිටුවල කාර්යභාර්යය සහ වගකීම් වලට මෙම පාසල් මට්ටමේ කමිටු කිසිදු ආකාරයක බාධාවක් නොවිය යුතුය. එම කමිටුවල සේවාව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා පාසල් මට්ටමේ කමිටු අවශ්‍ය සෑම අවස්ථාවකම ක්‍රියා කළ යුතුය.

යථෝක්ත පාසල් මට්ටමේ කමිටු සෑමට අධ්‍යාපන සංකල්පය යථාර්ථයක් බවට පත් කිරීම සඳහා ගනු ලබන විශේෂ වැඩ පිළිවෙලකි. 2009.09.08 දින වන විට මෙම කමිටු පිහිටුවීමට අවශ්‍ය කටයුතු කර එම වාර්තා ඔබ වෙත ලබා දෙන ලෙස උපදෙස් දීම සුදුසුය.

මෙම කාර්යය සාර්ථකව ඉටුකිරීම සඳහා ඔබෙන් ලැබෙන සහාය අතිශයින්ම අගය කරමි.

එම්.එම්.එන්.බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

**පිටපත් :**

01. නොවිධිමත් අධ්‍යාපන පළාත් සම්බන්ධීකරණ නි.අ.අ/ස.අ.අ, - ක්‍රියාකිරීම සඳහා
02. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,කලාප අධ්‍යාපන කාර්යාලය, ............................................... - ක්‍රියාකිරීම සඳහා
03. නොවිධිමත් අධ්‍යාපන කලාප සම්බන්ධීකරණ නි.අ.අ/ස.අ.අ, - අ.ක.ස
04. ප්‍රාථමික අධ්‍යාපන කලාප සම්බන්ධීකරණ නි.අ.අ/ස.අ.අ, - අ.ක.ස
05. කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ - පාසල් කමිටු ක්‍රියාත්මක වීම පිළිබඳ වාර්තා ලබා ගැනීම හා ඉදිරිපත් කිරීම සඳහා.
06. නොවිධිමත් අධ්‍යාපන ව්‍යාපෘති සහායක නිලධාරීන් (පළාත්/ කලාප/ කොට්ඨාස)- ක්‍රියා කිරීම හා වාර්තා කිරීම සඳහා
07. නොවිධිමත් අධ්‍යාපන ගුරු උපදේශක - කරු. ක්‍රියාකිරීම හා වාර්තා කිරීම සඳහා

අනිවාර්ය අධ්‍යාපන නියෝග
(පාසල් කමිටු) ආකෘති පත්‍ර 01

# අනිවාර්ය අධ්‍යාපන නියෝග ක්‍රියාත්මක කිරීම
# අවු 5 - 14 වයසේ පාසල් නොයන ළමයින් හඳුනා ගැනීම සාරාංශ වාර්තාව

පළාත ........................................ අධ්‍යාපන කලාපය ................................................ අධ්‍යාපන කොට්ඨාසය ............................................... ග්‍රාමසේවා වසම .............................................................

සමීක්ෂණය කරන ගුරුභවතා/ නිලධාරියා ගේ නම .......................................................................................................... මයා/මිය/මෙය

| අනු අංකය 01 | අවු. 5-14 වයසේ පාසල් නොයන ළමයාගේ නම 02 | මව/පියා භාරකරුගේ නම හා ලිපිනය 03 | ස්ත්‍රී/පුරුෂ භාවය M/F 04 | ජන වර්ගය 05 | උපන් දිනය 06 | පාසල් නොයාමට ප්‍රධානතම හේතුව 07 | ඉගෙනීමට කැමති ආකාරය 08 | දැනට සාක්ෂරතා පන්තියක ඉගෙනුම ලබන්නේද යන්න 09 | සටහන් 10 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

(5)
1. සිංහල
2. ලංකා දෙමළ
3. මුස්ලිම්
4. ඉන්දියා දෙමළ
5. වෙනත්- සටහන් කරන්න

(7)
1. ආර්ථික අපහසුතා
2. පාසලට දුර වැඩිකම
3. පාසලක් නොමැතිවීම
4. පාසලට ඇතුලත් නොකිරීම
5. පාසල නීරසවීම
6. පාසල් යාමට ඇති අකමැත්ත
7. පාසලේ යම් හේතුවක් නිසා
8. මව/පියා දෙමව්පියන් විදේශගතවීම
9. පාසලට යාමට ප්‍රවාහන ගාස්තු නොගෙවීම
10. මව/පියා අහිමිවීම
11. රැකියාවක නිරතවීම
12. දුබලතා සහිතවීම
13. ලෙඩ රෝග
14. අතවර වලට ලක්වීම
15. ගෙදර රඳවා ගැනීම
16. මාවතේ ජීවත්වීම
17. ස්වභාවික ව්‍යවසනයන්ට ලක්වීම
18. වෙනත් - සටහන් කරන්න

(8)
1. රජයේ පාසලක
2. උපකෘත විශේෂ පාසලක
3. සාක්ෂර මධ්‍යස්ථානයක

- අංක 5 තීරුව - ජන වර්ගයට අදාළ අංකය සඳහන් කරන්න
- අංක 7 තීරුව - පාසල් නොයාමට බලපා ඇති ප්‍රධානතම හේතුවට අදාළ අංකය සඳහන් කරන්න.
- අංක 8 තීරුව - ඉගෙනීමට කැමති ආකාරය අදාළ අංකය සඳහන් කරන්න

ගුරුභවතා/නිලධාරියා :- .................................................................................................................. මයා/මිය/මෙය

අත්සන:- .......................................................

අනිවාර්ය අධ්‍යාපන නියෝග (පාසල් කමිටු) ආකෘති පත්‍ර 02

# අනිවාර්ය අධ්‍යාපන නියෝග ක්‍රියාත්මක කිරීම

## පාසලින් ගිලිහුණු ළමයින් නැවත පාසල් ගත කිරීම සාරාංශ වාර්තාව

පාසලේ නම :- ....................................................................................................... අධ්‍යාපන කලාපය :- ........................................................................................

පාසලේ වර්ගය :- ..............................................................................................

වර්ෂය ........................................... ........................................................... වාරය/මාසය අධ්‍යාපන කොට්ඨාසය :- ..........................................................................................

| අනු අංකය | ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ නම | උපන් දිනය | ස්ත්‍රී/පුරුෂ භාවය | අවසන් වරට ඉගෙනගත් ශ්‍රේණිය | පාසලින් ගිලිහීමට හේතුව | නැවත පාසල් ගත කිරීම සඳහා ගත් පියවර | නැවත පාසලට අතුලත් කළ දිනය හා ශ්‍රේණිය | | පසුවිපරම් සටහන් හා වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | දිනය | ශ්‍රේණිය | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

ඉහත නම් සඳහන් සිසුන් පිළිබඳ කරුණු සත්‍ය හා නිවැරදි බවත්, ඔවුන් පාසල් ගත කිරීම හා පසු විපරම් කටයුතු සිදුකරන බවත් දන්වමි.

විදුහල්පති ගේ නම :- ..........................................................................................................

අත්සන :- ..........................................................................................................

නිළ මුද්‍රාව :- ..........................................................................................................

දිනය :- .......................................................

අනිවාර්ය අධ්‍යාපන නියෝග (පාසල් කමිටු) ආකෘති පත්‍ර 03

# අනිවාර්ය අධ්‍යාපන නියෝග ක්‍රියාත්මක කිරීම

## *අවදානම් තත්ත්වයේ සිටින ළමයින් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සාරාංශ වාර්තාව*

පාසලේ නම :- ........................................ අධ්‍යාපන කලාපය :- ........................................

පාසලේ වර්ගය :- ........................................

වර්ෂය ........................ ........................ වාරය/මාසය අධ්‍යාපන කොට්ඨාසය :- ........................................

| අනු අංකය | ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ නම | ශ්‍රේණිය | උපන් දිනය | ස්ත්‍රී/පුරුෂ භාවය | කාල සීමාව තුළ පාසල පැවැත්වූ දින ගණන | නොපැමිණි දින ගණන | ප්‍රතිශතය | නොපැමිණීමට හේතු | පැමිණීම දිරිමත් කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග/යෝජනා | ලබන ලද සාර්ථක භාවය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

ඉහත නම් සඳහන් සිසුන් පිළිබඳ කරුණු සත්‍ය හා නිවැරදි බවත්, ඔවුන්ගේ පැමිණීම දිරිමත් කිරීම සඳහා දැනට කටයුතු කරන බවත් දන්වමි.

ප්‍රාථමික/ ද්විතියික අංශ ප්‍රධාන නම හා අත්සන :- ........................................ දිනය :- ........................................

# ඇමුණුම 02

**දුරකථන**/தொலைபேசி இல./**Telephone Nos.**

**අමාත්‍යතුමා** / **Ministerc** / அமைச்சர் — **2784832** / **Fax: 2784825**

**ලේකම්** / **Secretary** / செயலாளர் — **2784812**

**කාර්යාලය** / **Office** / அலுவலகம் — **2785141-50** / **Fax: 2784846**

**ඊමේල්/E-mail/**ஈ-மெயில்**: isurupaya@moe.gov.lk**

**ඔබේ අංකය** / **Your No** / உமது இல — **.....................................**

**අධ්‍යාපන අමාත්‍යාංශය**
கல்வி அமைச்சு
**Ministry of Educaton**

**"ඉසුරුපාය"**
**බත්තරමුල්ල.**
**'' Isurupaya''**
**Battaramulla**
"இசுருபாயா"
பத்தரமுல்ல.

**මගේ අංකය** / **My No.** / எமது.

**දිනය** / **Date** / திகதி. — **ඊඩී /1/21/2/2** / **2007 .10. 08**

චක්‍රලේඛ අංක:- 2007/21

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා
විදුහල්පතිවරුන් වෙත

## පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන

ශ්‍රී ලාංකිකයන්ගේ විශේෂයෙන් පාසල් සිසුන්ගේ සෞඛ්‍ය හා පෝෂණ ගැටලු පවතින බව විවිධ පර්යේෂණ හා මාධ්‍ය මගින් දැන ගන්නට ලැබී ඇත. මේ තත්වය මඟහරවාලීමේ කාර්යය පාසල් මට්ටමින් කළ හැකි බැවින් පාසල් සිසුන්, ගුරුවරුන් ඇතුළු පාසල් ප්‍රජාවගේ සෞඛ්‍ය තත්වය ප්‍රවර්ධනය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහාය ඇති ව තිරසාර වැඩසටහනක් දියත් කිරීම පිණිස මේ චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

පාසල තම පූර්ණ සංවිධානාත්මක ශක්තිය යොදවා පාසල් සිසුන් හා ගුරුවරුන් ඇතුළු පාසල් ප්‍රජාවගේ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ක්‍රියා කිරීමට යොමු කිරීම මේ වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. විදුහල්පති විසින් පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන සඳහා පාසල් සිසුන්, ගුරුවරුන් ඇතුළු පාසල් ප්‍රජාවගේ පූර්ණ දායකත්වය ලබා ගැනීමට කටයුතු කළ යුතු ය.

2.0 අරමුණු

ඉහත සඳහන් ප්‍රධාන අරමුණ සාක්ෂාත් කර ගැනීම පිණිස පහත සඳහන් අරමුණු අනිවාර්යයෙන් ම පාසල මගින් ඉටු කළ යුතු ය.

2.1 සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් ප්‍රතිපත්ති සැකසීම.

2.2 පාසල් සිසුන් තුළ සෞඛ්‍ය ප්‍රවර්ධන දැනුම හා නිපුණතා ඇති කිරීම.

2.3 පාසල් තුළ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා හිතකර පරිසයක් ඇති කිරීම.

2.4 පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා පාසල් සිසුන්, ගුරුවරුන් ඇතුළු පාසල් ප්‍රජාවගේ සහභාගීත්වය ලබා ගැනීම.

2.5 සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහාය ඇති ව පවත්වන පාසල් සෞඛ්‍ය සේවා. සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ඵලදායී ලෙස යොදා ගැනීම.

3.0 පාසල තුළ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා අවධානය යොමු කළ යුතු මූලිකාංග:
ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීමේ දී පහත සඳහන් මූලිකාංග කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

3.1 පාසල් පරිශ්‍රය අලංකාර ව, ආරක්ෂිත ව සහ ප්‍රියමනාප ව පවත්වා ගැනීම
3.2 වැසිකිලි කැසිකිලි ප්‍රමාණවත් ව හා පවිත්‍රව පවත්වා ගැනීම. (ඇමුණුම 1)
3.3 පානීය ජලය පහසුකම් පැවතීම
3.4 ශිෂ්‍ය සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය පිළිබඳ සැළකිලිමත් වීම.
3.5 පාසල් ආපන ශාලාව සෞඛ්‍ය ආරක්ෂිත ව හා සිසු පෝෂණයට හිතකාමී ලෙස පවත්වා ගැනීම
3.6 පාසල් සිසුන්ට හිතකාමී පාසල් වාතාවරණයක් ඇති කිරීම

4.0 වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා නියාමනය:
මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පාසල හා පාසලට අදාළ අධ්‍යාපන ආයතනයක් තුළ වඩා සාර්ථකව මෙහෙයවීම සඳහා ශිෂ්‍ය සමාජ සහ සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටු පත් කර ගැනීම අත්‍යාවශ්‍ය වේ.

4.1 පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ශිෂ්‍ය සමාජ
පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ශිෂ්‍ය සමාජ පිහිටුවිය යුතු ය.
මෙහි දී ප්‍රාථමික හා ද්විතියක අංශ සඳහා වෙන් වෙන් වශයෙන් සෞඛ්‍ය ප්‍රවර්ධන ශිෂ්‍ය සමාජ පිහිටුවීම යෝග්‍ය වේ. පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ශිෂ්‍ය සමාජවල සියලු නිලතල හා වගකීම් සිසුන්ට ලබා දිය යුතු ය.

4.1.1 සංයුතිය:-
සභාපති, උප සභාපති, සම ලේකම්වරුන්, භාණ්ඩාගාරික සහ කාරක සභිකයින්ගෙන් නිලධාරී මඩුල්ල සමන්විත වන අතර ඕනෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකට සාමාජිකත්වය ලබා ගත හැකි ය.

4.1.2 වගකීම
- පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය සම්බන්ධයෙන් වාර්ෂික සැලැස්ම සකස් කර පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන උපදේශන කමිටුවේ අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම.
- මාසිකව රැස්වීම පවත්වා අදාළ ක්‍රියාකාරකම් ප්‍රගති සමාලෝචනය හා සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධනය ඇගයීම නිර්ණායකවලට අනුකූල වන පරිදි අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.
- පාසල් සෞඛ්‍ය දිනයක් පැවැත්වීම

4. 2 පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන උපදේශන කමිටුව:

4.1.2 විදුහල්පති (සභාපති)
සෞඛ්‍ය වැඩසටහන් භාර නියෝජ්‍ය විදුහල්පති/අංශ ප්‍රධාන/අදාළ ගුරු භවතුන්
ප්‍රාථමික අංශ භාර නියෝජ්‍ය විදුහල්පති/අංශ ප්‍රධාන
ගුරුවරු උපරිම 03 දෙනකු (ශිෂ්‍ය සංඛ්‍යාව මත පත් කිරීමට විදුහල්පතිට අවකාශ ඇත.)
(සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන/ජීවන නිපුණතා/විද්‍යාව හෝ වෙනත් ගුරු භවතුන් විය හැකි ය.)
ශිෂ්‍ය නියෝජිතයන් - පාසල් සෞඛ්‍ය සමාජවල සභාපති, සම ලේකම්වරු හා භාණ්ඩාගාරික දෙමාපිය නියෝජිතවරු (උපරිමය පස් දෙනෙකි.)
මහජන සෞඛ්‍ය පරීක්ෂක
සමෘද්ධි සංවර්ධන නිලධාරී
බාහිර සුභ පතන්නන් (උපරිමය දෙදෙනෙකි.)

4.2.2 වගකීම:

- පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ශිෂ්‍ය සමාජවල ක්‍රියාකාරකම් සඳහා මග පෙන්වීම හා වැඩසටහන් නියාමනය කිරීම හා ප්‍රතිපෝෂණය කිරීම.
- ත්‍රෛමාසික රැස්වීම් පවත්වා පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා යොමු කිරීම.
- ක්‍රියාකාරී ප්‍රජා සහභාගිත්වය සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්වලට ලබා ගැනීම.

4.3 කලාප අධ්‍යාපන සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව:

4.3.1 සංයුතිය:
කලාපයේ අධ්‍යාපන අධ්‍යක්ෂ (සභාපති)
කලාපයේ සෞඛ්‍ය වැඩසටහන් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාපයේ පෝෂණ වැඩසටහන් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාප ප්‍රාථමික නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාපයේ විශේෂ අධ්‍යාපනය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 01
ප්‍රාදේශීය පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක
පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක
සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් (කලාපයට අයත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල)
කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් (කලාපයට අයත් අධ්‍යාපන කොට්ඨාසවල)
ගණකාධිකාරී (කලාප අධ්‍යාපන කාර්යාලය)
දිස්ත්‍රික් සමෘද්ධි කළමනාකරු
විදුහල්පතිවරුන් 04 දෙනකු
(1 AB පාසල් 01, IC පාසල් 01, 2 වර්ගයේ පාසල් 01, 3 වර්ගයේ පාසල් 01)

4.3.2 වගකීම :

- ත්‍රෛමාසික ව කලාප මට්ටමේ රැස්වීම් පවත්වා පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් ඇගයීම සහ නියාමනය.
- පාසල් වැඩසටහන් සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණය ලබා දීම.
- අවශ්‍ය සහාය සේවා ලබා දීමට පියවර ගැනීම.
- ඇගයීමේ දී රන් සම්මාන සහතික ලබා ගන්නා පාසල් ලේඛන පළාත් කමිටුවට හා අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා දීම.

4.4 පළාත් අධ්‍යාපන සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව :

4.4.1 සංයුතිය :
පළාත් අධ්‍යාපන ලේකම් (සභාපති)
පළාත් සෞඛ්‍ය ලේකම්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 01
පළාත් සෞඛ්‍ය වැඩසටහන් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් සැලසුම් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් පෝෂණ වැඩසටහන් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් විශේෂ අධ්‍යාපන අධ්‍යක්ෂ
ගණකාධිකාරී (පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව)
දිස්ත්‍රික් සමෘද්ධි සහකාර කොමසාරිස්

4.4.2 වගකීම්

- ජාතික ප්‍රතිපත්තිය අනුව පළාත් මට්ටමේ සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති තීරණය කිරීම.
- වර්ෂයකට දෙවරක් රැස්වීම් පවත්වා පළාත් මට්ටමේ පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් ඇගයීම සහ නියාමනය.
- පාසල් වැඩසටහන් සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණය ලබා දීම.

4.5 ජාතික මට්ටමේ අධ්‍යාපන සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව :

4.5.1 සංයුතිය :

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්
ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (සෞඛ්‍ය සේවා)
සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා)
ජාතිය ගොඩ නැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියකු.
ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියකු
අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන)
අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සැලසුම් සහ කාර්ය සාධන සමාලෝචන)
අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී
පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂ
සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශයේ අධ්‍යක්ෂ
අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞඛ්‍ය හා පෝෂණ වැඩ සටහන් භාර අධ්‍යාපන අධ්‍යක්ෂ
අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යක්ෂ
අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන අධ්‍යක්ෂ
අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ

4.5.2 වගකීම :

- ජාතික මට්ටමේ පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති තීරණය කිරීම.
- වර්ෂයකට දෙවරක් රැස්වීම් පවත්වා පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් ඇගයීම සහ නියාමනය
- පාසල් වැඩසටහන් සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණය ලබා දීම.

කමිටු ස්ථාපිත කිරීම, නිසි වකවානුවල කමිටු රැස්වීම් පැවැත්වීම සෑම කමිටුවකම සභාපතිවරුන් සතු වගකීම වේ.

5.0 ඇගයීම:

පාසල තුළ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා අවධානය යොමු කළ යුතු අරමුණු හා මූලිකාංග ආශ්‍රයෙන් ඒ ඒ පාසල්වල ක්‍රියාත්මක වන සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ඇගයීමකට (ඇමුණුම - 2 ඇගයීම් පත්‍රිකාව) ලක් කොට අපේක්ෂිත මට්ටමට ළඟා වී තිබෙන පාසල් හඳුනා ගෙන ඒවා අගය කිරීම සඳහා ඇගයීම් සහතිකයක් වාර්ෂික ව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් නිකුත් කළ යුතු ය.

5.1. කලාප ඇගයීම් මණ්ඩලය :

කලාප මට්ටමේ ඇගයීම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයකු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ ඔහුගේ නියෝජිතයකු ඇතුළත් වන පරිදි කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන නිලධාරීන් 4 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් සිදු කළ යුතු ය. ඇගයීම් පත්‍රිකාවට අනුව වැඩි ලකුණු ලබා ගන්නා පාසල් සඳහා කලාප මට්ටමින් පහත සඳහන් පරිදි සහතික ප්‍රදානය කළ යුතු ය.

ලකුණු 100-80 අතර රන් සම්මාන සහතිකය.
ලකුණු 79-70 අතර රිදී සම්මාන සහතිකය.
ලකුණු 69-60 අතර ලෝකඩ සම්මාන සහතිකය.
ලකුණු 80 න් ඉහළ ගන්නා පාසල් පිළිබඳ තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා දිය යුතු අතර එම පාසල් ජාතික මට්ටමින් ඇගයීමක් සඳහා ඇතුළත් කර ගනු ලැබේ.

5.2 ජාතික ඇගයීම් මණ්ඩලය :

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියකු, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියකු, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන නිලධාරියකු, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන නිලධාරියකුගෙන් සමන්විත වේ. ලකුණු 80ට වැඩියෙන් ගන්නා පාසල් සඳහා ජාතික මට්ටමේ පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ඇගයීම් සහතිකයක් නිකුත් කෙරේ.

මේ වැඩසටහන සාර්ථක ව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම සියලු ම විදුහල්පතිවරුන්, ගුරුවරුන්, කාර්ය මණ්ඩලය සහ නිලධාරීන්ගේ වගකීම වේ.

ආරියරත්න හේවගේ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත - ලේකම් - සෞඛ්‍ය අමාත්‍යාංශය
ලේකම් - ජාතික ගොඩ නැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය

## 4 Sanitary Facility

### 4.1 Toilets and urinal For pupils

| No of Students Students | Required no of toilets for Girls Schools | Required no. of Toilets and Urinals For boys Schools | |
|---|---|---|---|
| | | Toilets | Urinals |
| 100 | 2 | 1 | 2 |
| 200 | 3 | 1 | 2 |
| 300 | 5 | 2 | 3 |
| 400 | 6 | 2 | 4 |
| 500 | 8 | 3 | 5 |
| 600 | 9 | 3 | 6 |
| 700 | 11 | 4 | 7 |
| 800 | 12 | 4 | 8 |
| 900 | 14 | 5 | 9 |
| 1000 | 15 | 5 | 10 |
| 1200 | 16 | 5 | 11 |
| 1400 | 17 | 6 | 11 |
| 1600 | 18 | 6 | 12 |
| 1800 | 19 | 6 | 13 |

For mixed schools identify no, toilets and urinals separately for boys and girls using above table
Example: 300 boys and 400 girls
For boys, two toilets and three urinals
For girls six toilets

4.2 Teachers Toilets:
For Teacher less than 10 – Two toilets
10 to 40 teacher- four toilets
Above 40-five toilets

4.3 Water
Water can be supplied from water supply schemes under urban councils if schools are situated in urban areas. Please check as to availability of water for the school concerned. Even if water is supplied, overhead tank has to be constructed.

If not, well water must be made available for students
A well has to be dug in the premises of school, overhead water tank has to be constructed and pump house with electrical water pump has to be provided to pump water from the well to the tank From there water must be distributed to toilets, Laboratories, Home Science, Canteen, Administrative Block etc.

If the school is situated in close proximity to the sea, well water is not drinkable due to over contamination of salt.

# පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩ සටහන ඇගයීම් පත්‍රිකාව.

| නිර්ණායකය | දර්ශකය | ඇගයීම් මට්ටම් | ලබාගත් ලකුණු | ප්‍රභවය |
| --- | --- | --- | --- | --- |
| 1. පාසල් සෞඛ්‍ය කමිටුව | 1. කමිටුවක් ඇත. ක්‍රියාත්මක ය.<br>2. කමිටුවක් ඇත. ක්‍රියාත්මක නැත.<br>3. කමිටුවක් නැත. | 2<br>1 | | කමිටු නාමාවලිය හා රැස්වීම් වාර්තා අත්සන් පත්‍ර |
| 2. ශිෂ්‍ය සෞඛ්‍ය සංගමය | 1. සංගමයක් ඇත. ශිෂ්‍ය සහභාගිත්වය 100% පවතී. ක්‍රියාකාරකම්වල යෙදේ. වාර්ෂික සැලැස්මක් ඇත.<br>2. සංගමයක් ඇත. ශිෂ්‍ය සහභාගීත්වය 50% පමණි. ක්‍රියාකාරම් වල යෙදේ, වාර්ෂික සැලැස්මක් ඇත.<br>3. සංගමයක් ඇත. ශිෂ්‍ය සහභාගිත්වය ප්‍රමාණවත් ව නැත. ක්‍රියාකාරකම්වල යෙදීම ප්‍රමාණවත් නැත. වාර්ෂික සැලැස්මක් ඇත | 3<br>2<br>1 | | ශිෂ්‍ය සංගම් වාර්තා |
| 3. ප්‍රථමාධාර ලබා දීම | 1. ශිෂ්‍යයන් සඳහා ප්‍රථමාධාර ලබා දීමේ ක්‍රියාමාර්ග පවතී. ප්‍රථමාධාර ඒකකයන් ඇත. හදිසි අනතුරු සඳහා ප්‍රථමාධාර උපකරණ පවතී. පුහුණුව ලත් ගුරුවරු හා සිසුහු සිටිති.<br>2. පහසුකම් සහිත ප්‍රථමාධාර පෙට්ටියක් පවතී. ක්‍රියාමාර්ග පවතී<br>3. එවැනි පහසුකම් නොමැත, | 3<br>2<br>0 | | ප්‍රථමාධාර උපකරණ ප්‍රතිකාර ලබාදීම පිළිබඳ වාර්තා/ලේඛනය |
| 4. සෞඛ්‍ය වෛද්‍ය පරීක්ෂණය | 1. පසුගිය වර්ෂයේ පවත්වා ඇත. අදාළ සියලුම සිසුන් සෞඛ්‍ය වෛද්‍ය පරීක්ෂණයට භාජනය කර ඇත.<br>2. SMI සිදු කර ඇත්තේ සිසුන් 100%-80% පමණි.<br>3. SMI සිදු කර ඇත්තේ සිසුන් 80%-50%-පමණි.<br>4. වාර්ෂික ව SMI සිදු කර නැත. | 3<br>2<br>1<br>0 | | SMI කාඩ්පත්<br>MOH ගේ ලොග් සටහන |

| නිර්ණායකය | දර්ශකය | ඇගයීම් මට්ටම් | ලබාගත් ලකුණු | ප්‍රභවය |
|---|---|---|---|---|
| 5. සෞඛ්‍ය වෛද්‍ය පරීක්ෂණයෙන් හඳුනා ගත් ගැටලු සඳහා ක්‍රියාමාර්ග ගැනීම | 1. හඳුනා ගත් සිසු ගැටලු සඳහා ප්‍රතිකර්ම වැඩ සටහන් සිදු කර ඇත. ඒ පිළිබඳ ව සොයා බලා ක්‍රියා කරයි.<br>2. හඳුනා ගත් සිසු ගැටලු සඳහා ප්‍රතිකර්ම වැඩ සටහන් ඇත. එහෙත් ඒ පිළිබඳ සොයා නොබලයි.<br>3. හඳුනා ගත් සිසු ගැටලු සඳහා ප්‍රතිකර්ම වැඩ සටහන් නැත. එහෙත් ආනාවරණ පිළිබඳ තොරතුරු පවතී.<br>4. අනාවරණ ගැටලු පිළිබඳ නොදනී. | 3<br>2<br>1<br>0 | | සෞඛ්‍ය ගැටලු සටහන් පත්‍ර<br>**H** 456 සටහන් පත්‍ර |
| 6. පාසල් සෞඛ්‍ය වැඩ සටහන් පිළිබඳ ප්‍රජා දායකත්වය | 1. ඉතා ඉහළ මට්ටමක පවති. (60%) පාසල් වාරයකට එක් ක්‍රියාකාරකමක්වත් සිදු කර ඇත.<br>2. සහභාගිත්වය අඩු ය (30%)<br>3. සහභාගිත්වයක් නැත. | 3<br>1<br>0 | | වැඩ සටහන් සඳහා පැමිණි ප්‍රතිශතය |
| 7. පාසල විසින් සිදු කරන ප්‍රජා සෞඛ්‍ය වැඩ සටහන් | 1. වාර්ෂික ව ක්‍රියාකාරකම් 3කට වඩා සිදු කර ඇත.<br>2. වාර්ෂික ව ක්‍රියාකාරකම් 2 කට වඩා සිදු කර ඇත.<br>3. වාර්ෂික ව ක්‍රියාකරකම් 1 කට වඩා සිදු කර ඇත.<br>4. වාර්ෂික ව ක්‍රියාකාරකම් සිදු කර නැත. | 5<br>3<br>2<br>0 | | වාර්තා සටහන් |
| 8. සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 1. ශිෂ්‍ය සංඛ්‍යාවට හා ගුරු සංඛ්‍යාවට ප්‍රමාණවත් පරිදි භාවිත කළ හැකි පහසුකම් පවතී.<br>2. සනීපාරක්ෂක පහසුකම් පවතින නමුත් ප්‍රමාණවත් නොවේ. (80%)<br>3. සනීපාරක්ෂක පහසුකම් පවතින නමුත් ප්‍රමාණවත් නොවේ (50%)<br>4. සනීපාරක්ෂක පහසුකම් නොමැත. | 6<br>3<br>2<br>0 | | ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂ ව පවතින සනීපාරක්ෂක පහසුකම් |

| නිර්ණායකය | දර්ශකය | ඇගයීම් මට්ටම් | ලබාගත් ලකුණු | ප්‍රභවය |
|---|---|---|---|---|
| 9. සනීපාරක්ෂක පහසුකම් හා ඒවායේ පවිත්‍රතාව | 1. ක්‍රමවත් ව සැලසුම් කර ඇත. (ඉදිකර ඇත.) පිරිසිදු ව පවත්වා ගෙන යයි. අඛණ්ඩව ජල පහසුකම් සැපයේ. | 6 | | සනීපාරක්ෂක පහසුකම් පවත්වා ගෙන යාමේ මට්ටම |
| | 2. පිරිසිදුව පවතී. එහෙත් අඛණ්ඩ වැඩ පිළිවෙළක් නැත. ජල සැපයුම ඇත. | 4 | | |
| | 3. පිරිසිදු ව ඇත. ජල සැපයුම නැත. | 2 | | |
| | 4. පිරිසිදු කිරීමේ වැඩ පිළිවෙළක් නැත. | 0 | | |
| 10. ජල පහසුකම් සැපයීම | 1. ජල පහසුකම් ඇත. අඛණ්ඩ ව නඩත්තු කරයි. පිරමැසුම් ක්‍රම භාවිත කරයි. බීමට සුදුසු ජලය ඇත. | 6 | | පවතින ජල පහසුකම් හා පවත්වා ගෙන යාම |
| | 2. ජල පහසුකම් ඇත. නඩත්තු පරිසරයක් පවතී. පිරිමැසුම් ක්‍රම භාවිත නොකරයි බීමට සුදුසු ජලය ඇත. | 4 | | |
| | 3. ජල පහසුකම් ඇත. නඩත්තු පරිසරයක් නොමැත. පිරිමැසුම් ක්‍රම භාවිත නො කරයි. බීමට සුදුසු ජලය ඇත. | 2 | | |
| | 4. ජල පහසුකම් ඇත. නඩත්තු පරිසරයක් නොමැත. පිරිමැසුම් ක්‍රම භාවිත නො කරයි. බීමට සුදුසු ජලය නැත. | 1 | | |
| | 5. ජල පහසුකම් නැත. | 0 | | |
| 11. ශිෂ්‍ය පැමිණීම | 1. පසුගිය වර්ෂයේ සාමාන්‍ය පැමිණීම 90% වැඩි ය. | 5 | | පැමිණීමේ ලේඛනය |
| | 2. සාමාන්‍ය පැමිණීම 90%-80 % අතර ය. | 3 | | |
| | 3. සාමාන්‍ය පැමිණීම 80%-70 % අතර ය. | 1 | | |
| 12. ගුරු පැමිණීම | 1. සාමාන්‍ය පැමිණීම 90% වැඩිය. | 5 | | පැමිණීමේ ලේඛනය / නිවාඩු වාර්තා |
| | 2. සාමාන්‍ය පැමිණීම 90%-80% අතර ය. | 3 | | |
| | 3. සාමාන්‍ය පැමිණීම 80%-70 අතර ය. | 1 | | |

| නිර්ණායකය | දර්ශකය | ඇගයීම් මට්ටම් | ලබාගත් ලකුණු | ප්‍රභවය |
|---|---|---|---|---|
| 13. පන්ති කාමර පරිසරය | 1. සෑම පන්ති කාමරයක් ම ක්‍රමවත්ව පිරිසිදු ව මනා ආලෝකය හා වාතාශ්‍රය සහිත ව පවතී. ඒ සඳහා ක්‍රමවේද ඇත.<br>2. පන්ති කාමර වලින් 80% ක්‍රමවත් ව පිරිසිදු ව මනා ආලෝකය හා වාතාශ්‍රය සහිත ව පවතී.<br>3. පන්ති කාමර වලින් 50% ක්‍රමවත් ව පිරිසිදු ව මනා ආලෝකය හා වාතාශ්‍රය සහිත ව පවතී.<br>4. පන්ති කාමර ක්‍රමවත් ව පිරිසිදු ව මනා ආලෝකය හා වාතාශ්‍රය සහිත ව පැවතීම ප්‍රමාණවත් නොවේ | 5<br>3<br>2<br>0 | | භෞතික පරිසරය |
| 14. පාසල් පරිසරය | 1. ක්‍රමවත් ව පිරිසිදු ව අනතුරු සහිත ස්ථාන නොමැතිව අලංකාර ව පවත්වා ගෙන යයි. ක්‍රීඩා කිරීමේ ඉඩකඩ පවතී (පවතින තත්ත්වය අනුව ලකුණු 1-5 අතර ලබා දිය යුතුය.) | 5 | | භෞතික පරිසරය |
| 15. පෝෂණ ගැටලු අවම කිරීම | 1. හඳුනා ගැනීම සිදු කරයි. වැඩ සටහන් ක්‍රියාත්මක වේ.<br>2. හඳුනා ගැනීම සිදු කරයි. දැනුවත් කිරීම සිදු කරයි<br>3. හඳුනා ගැනීම සිදු කරන නමුත් ක්‍රියාකාරකම් නොමැත. | 4<br>2<br>1 | | වැඩ සටහන් පිළිබඳ වාර්තා |
| 16. සෞඛ්‍ය හා පෝෂණ දැනුම හා නිපුණතා ලබා දීම | 1. වාර්ෂික ව වැඩ සටහන් 3 කට වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක කර ඇත.<br>2. වාර්ෂික ව වැඩ සටහන් 2 කට වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක කර ඇත.<br>3. වාර්ෂික ව වැඩ සටහන් 1 කට වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක කර ඇත. | 6<br>4<br>2 | | වාර්තා සටහන් |

| නිර්ණායකය | දර්ශකය | ඇගයීම් මට්ටම් | ලබාගත් ලකුණු | ප්‍රභවය |
|---|---|---|---|---|
| 17. ශිෂ්‍ය ශාරීරික යෝග්‍යතාව | 1. සිසුන්ගෙන් 90% ශාරීරික යෝග්‍යතාව නිසි පරිදි පවතී | 10 | | ශිෂ්‍ය යෝග්‍යතා සටහන්. |
| | 2. සිසුන්ගෙන් 90%-75% යෝග්‍යතාව නිසි පරිදි පවතී | 6 | | |
| | 3. සිසුන්ගෙන් 75%-65% යෝග්‍යතාව නිසි පරිදි පවතී | 4 | | |
| 18. ශරීර සුවතා වැඩ සටහන් | 1. අඛණ්ඩ වැඩ පිළිවෙලක් ඇත. සෑම ශිෂ්‍යයෙකුගේම සහභාගිත්වය පවතී. | 6 | | වැඩ සටහන තුළින් සිසුන්ගේ තොරතුරු ලබා ගැනීම. |
| | 2. අඛණ්ඩ වැඩ පිළිවෙලක් ඇත. සෑම ශිෂ්‍යයකුගේ ම සහභාගිත්වය නොපවතී. | 4 | | |
| | 3. අහඹු ලෙස සිදු කරයි. | 0 | | |
| 19. පෞද්ගලික ස්වස්ථතාව | 1. අඛණ්ඩ සොයා බලයි. යොමු කිරීමක් ඇත. | 4 | | ශිෂ්‍ය වාර්තා සටහන්. |
| | 2. සොයා බලයි. යොමු කිරීමක් නැත. | 2 | | |
| | 3. සොයා බැලීමක් නැත. | 0 | | |
| 20. ආපන ශාලාව පවත්වා ගෙන යාම | 1. පිරිසිදු ව පවතී. පෝෂ්‍යදායී ආහාර ලබා ගත හැකිය. අහිතකර ආහාර වර්ග නැත. | 4 | | ආපන ශාලාව නිරීක්ෂණය කිරීම |
| | 2. පිරිසිදුව පවතී. පෝෂ්‍යදායී ආහාර ලබා ගත හැකිය. අහිතකර ආහාර වර්ග ඇත. | 2 | | |
| | 3. පිරිසිදුකම පිළිබඳ සෑහීමකට පත් විය නොහැකිය. පෝෂ්‍යදායී ආහාර ලබා ගත හැකි ය. අහිත කර ආහාර වර්ග නැත. | 1 | | |
| 21. මනෝ සමාජයීය පරිසරයක් | 1. නුසුදුසු දඬුවම් නොමැති මිතුරු පරිසරයක් ඇත. ළමයින්ට උදව් කරන ක්‍රියා මාර්ග ඇත. | 3 | | නිරීක්ෂණ මගින් |
| | 2. දඬුවම් සමහරක් පවතී මිතුරු පරිසරයක් ඇත. | 2 | | |
| 22. උපදේශනය හා මාර්ගෝපදේශනය | 1. ගුරුවරයෙක් ඇත. යොමු වීම සඳහා අවස්ථාව ඇත. ස්ථානයක් ඇත. ක්‍රියා මාර්ග ගෙන තිබේ 1-3 විහිදේ. | 3 | | වාර්තා සටහන්, නිරීක්ෂණ |

## ඇමුණුම 03

# ශ්‍රී ලංකාවේ ළමා මිතුරු පාසල් සඳහා මාන හා නිර්ණායක

### 1 පළමුවන මානය: අයිතිවාසිකම් පාදක හා සක්‍රීය ව අන්තර්කරණය වීම.

1.1. නිර්ණායකය: පාසලෙන් ගිලිහීම වැළැක්වීම සඳහාත් පාසල් නොඑන ළමයින් පිළිබඳ ව සොයා බැලීම හා ප්‍රතිචාර දැක්වීම සඳහාත් ඵලදායී යාන්ත්‍රණ ඇත. ඒවා භාවිත කෙරේ.

1.2. නිර්ණායකය: පාසලේ ඇති ක්‍රියාකාරකම්වලට සහභාගී වීමට හා සම්පත් භාවිතයට සියලු ම ළමයින්ට සමාන ප්‍රවේශයක් ඇත.

1.3. නිර්ණායකය: කායික හා මානසික දඬුවම් ක්‍රියාත්මක නොකෙරේ. බිය වැද්දීම් හා හිරිහැර කිරීම් වැළැක්වීමේ ක්‍රියා මාර්ග හා ඒවාට ප්‍රතිචාර දැක්වීමක් ඇත.

1.4. නිර්ණායකය: ළමා අයිතිවාසිකම් පිළිබඳ ව සමස්ත පාසල් ප්‍රජාවම දැනුවත්ය. ඒ අවබෝධය මත පාසලේ ක්‍රියාකාරකම් සිදුකෙරේ.

### 2 දෙවන මානය: ස්ත්‍රී පුරුෂ සමාජානුභාවයට ප්‍රතිචාරී වීම.

සටහන: මීට පෙර යම්කිසි ක්ෂේත්‍රයකදී මෙම නිර්ණායක මැනීම සිදුවී ඇති නිසා, නැවතත් එම ක්ෂේත්‍ර හා නිර්ණායකයන් වෙන් වෙන් වශයෙන් මැනීම අවශ්‍ය නොවේ.

2.1. නිර්ණායකය: ප්‍රාථමික අධ්‍යාපනය සපුරාලීමට හා ද්විතියික අධ්‍යාපනය කරා එළඹීමට උපකාර කිරීම සඳහා, ගැහැණු ළමයින්ට හා පිරිමි ළමයින්ට සමාන අවස්ථා පවතී.
(පාසලේ මූලික දත්තවලින් ආවරණය වේ)

2.2. නිර්ණායකය: පාසලේ සියලුම ක්‍රියාකාරකම්වලදී (විෂයමාලාව හා සමගාමී විෂයමාලාව, කළමනාකරණය) ගැහැණු ළමයි හා පිරිමි ළමයි සමාන පදනමකින් සහභාගී වෙති.

2.3. නිර්ණායකය: පාසලේ භෞතික පහසුකම්. ගැහැණු ළමයින්ට හා පිරිමි ළමයින්ට උචිත පරිදි පවතී.

### 3 තුන්වන මානය: ඉගෙනුම් ඵල ප්‍රවර්ධනය වීම

3.1 නිර්ණායකය: ඉගෙනුමට සහාය වීම සඳහා මානව සම්පත් හා පන්ති කාමර පහසුකම් ප්‍රමාණවත් ව තිබේ.

3.2. නිර්ණායකය: පන්ති කාමර වාතාවරණය අන්තර්කරණය වේ. ආතතියෙන් තොර වේ.ප්‍රජාතන්ත්‍රවාදී වේ. ඉගෙනුමට යෝග්‍ය වේ.

3.3. නිර්ණායකය: දේශීය පරිසරය, සංස්කෘතිය පිළිබඳ දැනුම ලබා දීම සඳහා පාසල් විෂයමාලාව සුදුසු සේ අනුවර්තනය කර තිබේ.

3.4. නිර්ණායකය: සපයන ලද අවස්ථා තුළින් හා ස්වයං පෙළඹවීමෙන් ගුරුවරු තම හැකියාව අඛණ්ඩව වර්ධනය කර ගනිති.

3.5. නිර්ණායකය: ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රමවේද ඉගැන්වීමේ දී භාවිත කෙරේ.

3.6. නිර්ණායකය: අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ක්‍රමානුකූල ව තක්සේරු කෙර්. සියලු ම ළමයින් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවල ප්‍රවීණතාවට පත් කිරීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගනු ලැබේ.

## 4 හතරවන මානය: සෞඛ්‍ය සම්පන්න හා සුරක්ෂිතව ආරක්ෂාකාරී වීම.

4.1. නිර්ණායකය: සෞඛ්‍ය, සුරක්ෂිත භාවය හා ආරක්ෂාව පිළිබඳ පාසල් මට්ටමේ ප්‍රතිපත්ති තිබේ.

4.2. නිර්ණායකය: ආහාර, ජලය හා සනීපාරක්ෂාව සම්බන්ධ පහසුකම් පාසලෙහි ප්‍රමාණවත් ව තිබේ.

4.3. නිර්ණායකය :ආහාර, ජලය, සනීපාරක්ෂක පහසුකම් හා පාසල් පරිසරය ආරක්ෂාකාරී ලෙස පවත්වා ගෙන යනු ලැබේ.

4.4. නිර්ණායකය: ශිෂ්‍යයින් සඳහා නිපුණතා පාදක සෞඛ්‍ය අධ්‍යාපනය ඵලදායී ව මෙහෙයවනු ලැබේ.

4.5. නිර්ණායකය: ඵලදායී මනෝ සමාජීය සහාය හා යොමු කිරීමේ සේවාවන් තිබේ. භාවිත කෙර්.

4.6. නිර්ණායකය: හිංසනයෙන්, අපයෝජනයෙන් හා පීඩාවෙන් ළමයින් ආරක්ෂිතය.

4.7. නිර්ණායකය: ආපදා කළමනාකරණය සඳහා සැලසුම් සහගත සූදානමක් ඇත. එය ක්‍රියාත්මක වේ.

## 5 පස්වන මානය: ශිෂ්‍යයින්, පවුල් හා ප්‍රජාවන් සමඟ ක්‍රියාකාරී ව සම්බන්ධ වීම.

5.1. නිර්ණායකය: ශිෂ්‍යයින්ගේ ද පවුල්වල ද ප්‍රජාවන්හී ද ඵලදායී සහභාගීත්වයෙන් ස්වයං තක්සේරුකරණය සිදු කෙරේ. පාසල් සංවර්ධන සැලසුම් සකස් කෙරේ.

5.2. නිර්ණායකය:පාසල් සංවර්ධන සැලැස්ම (SDP) ක්‍රියාත්මක කිරීමේදී විදුහල්පති, ගුරුවරු, ශිෂ්‍යයෝ පවුල් හා ප්‍රජාව ක්‍රියාකාරී ව සහභාගී වෙති.

5.3. නිර්ණායකය:පාසල් සංවර්ධන සැලැස්ම (SDP) නියාමනයේදී හා ඇගයීමේදී විදුහල්පති, ගුරුවරු, ශිෂ්‍යයෝ පවුල් හා ප්‍රජාව ක්‍රියාකාරී ව සහභාගී වෙති.

5.4. නිර්ණායකය: ළමා මිතුරු නිවාස/ප්‍රජා පරිසරය ප්‍රවර්ධනයෙහි දී පාසල සක්‍රීය ව සහභාගි වේ.

## 6 හයවන මානය: ළමා මිතුරු පද්ධති, ප්‍රතිපත්ති, පරිචය හා රෙගුලාසි මගින් සහාය ලැබීම.

6.1. නිර්ණායකය: රාජ්‍ය ප්‍රතිපත්ති, රෙගුලාසි හා ඒවා ක්‍රියාත්මක කිරීම ළමා මිතුරු පාසල (CFS) සංවර්ධනය සඳහා උපකාරී වේ.

6.2. නිර්ණායකය: අදාළ සියලු රාජ්‍ය ආයතන අතර හැම මට්ටම්වලදී ම ඵලදායී සම්බන්ධීකරණය පවතී.

6.3. නිර්ණායකය: විවිධ මට්ටම්වලදී මූල්‍ය සම්පත් උචිත ලෙස ප්‍රදානය කෙරේ.

6.4. නිර්ණායකය: ගුණාත්මක තාක්ෂණික ආධාර පද්ධති සියලු ම මට්ටම්වල දී පවතී.

6.5. නිර්ණායකය: විෂයමාලාවෙහි, පෙළ පොත්වල හා ගුරු අත්පොත්වල ළමා මිතුරු මූලධර්ම අන්තර්ගත වේ.